# Girasandesa

WITH A PARAPHRASE BY

HENDRICK JAYETILAKE.


විද්‍යෝදය පරිවෙණාධිපති ශ්‍රීසුමඞ්ගලාභිධාන

නායක ස්ථවිරයානන්වහන්සේගේ ශිෂ්‍යවූ

හෙන්ද්‍රික් ජයතිලක අප්පුහාමි විසින්

ලියනලද සන්න සහිත

# ගිරාසන්දේශය



COLOMBO:

Printed at the Lankabhinawawisruta Press.

1883.

# ගිරාසන්දේශය

ශම්‍යුත් නානාවිධ මධුරකාව්‍යාලඞ්කාරයෙන්විචිත්‍රවූ මෙම ග්‍රන්ථය දැනට වර්ෂ 400 කින් පූර්වයෙහි ජයවර්ධන නුවර නොහොත් කෝට්ටේ විසූ පද්‍යපණ්ඩිතවරයෙක් විසින් කරණලද ශිෂ්ටප්‍රයෝගයෙකි-මෙය, යපෝකතාපුරය අගනුවරකොට ලඞ්කාරාජ්‍යයකළාවූ පරාක්‍රමබාහුමහීපාලයන් ඇතුළුව සියලුලඞ්කාවද බුද්ධශාසනයද රක්‍ෂාකරණු පිණිස නාථදෙවේන්ද්‍රයාටයාළඥකිරීමසඳහා ගිරවෙක්ලවා තොටගමුවේශ්‍රීරාහුලමහාස්ථවිරයානන්ට සංදේශයක්යවන්නාක්මෙන්කරණලද්දේය-මෙහි ප්‍රතිපදොච්චාරණභාගයෙහි, 12වැනිකවියෙන්හැඟෙනඅන්දමට මෙමකාව්‍යකර්තෘවරයා ජයවර්ධනනුවර විසූකෙනෙකැයිකීනුමුත් මෙතුමා ශ්‍රමණනාමයෙක්ද නිහියෙක්ද යනු මෙමග්‍රන්ථපර්‍ය්‍යන්තයෙහිහෝ වෙනයම්තැනකහෝ නොපැණෙනහෙයින් ඒ ගැණ විනිශ්චයක්කිරීමදුෂ්කරයි-පද්‍යබන්ධනසම්ප්‍රදාය වශයෙන් කල්පනාකරණකල ගුත්තිලකාව්‍යකර්තෘවූ වෑත්තෑවේස්ථවිරයන්ට කිට්ටුකෙනෙක්මෙන් හැඟෙන්නා-හෙද ජනශ්‍රැතිරහිතහෙයින් ස්ථිරලෙසනොකියමු-මෙහි කර්තෘවරයා කවුරුවූවත් විවිධ සමයාන්තරයෙහිහා නානාශබ්දශාස්ත්‍රයන්හිද නිපුණවූ පණ්ඩිතයෙකුබව සන්දෙහරහිතවකියමු-පද්‍යදෙසියහිස්ගණනකින්යුත් මෙමග්‍රන්ථයෙහි ගුණදොස් මෙනෙහිකලවිට කියයුත්තක්ව පෙණුනේ 16 වැනිකවියේ ව්‍යුත්ක්‍රමදොෂයපමණකි-පදවිපර්‍ය්‍යාසාදියෙන් වෘත්තයනොපිරිහෙලා පද්‍යබන්ධනයකිරීමවිනා මෙම දොෂය ගැණ මහාකවිවරයෝ නොසැලකූවෝදෝ හඟිමු-ඉතාමධුරවූ කාව්‍යරසයදෙනපද්‍යයක මෙබඳුතැනක් විපරීතවූවත් එයින් කවරදොසක්ද ?

කාලිදාසමහාකවීනු විසින් කුමාරසම්භවයෙහි මෙම කීෂ

"එකොහිදොෂො ගුණසන්නිපාතෙ
නිමජ්ජතීන්දොඃ කිරණෙෂ්විවාඞ්කඃ"

ඒක ලිපිදොෂයකැයි සිතුනමුත් ලත්පමණ පිටපත්වල එසේම තිබෙනහෙයින් වෙනස්නොකළෙමු-එසේත් කලකදීවූ ලිපිදොෂයක්දෝහෝයි ශඞ්කාකරමු.

මෙම පොතට පුරාණ සන්නයක් නොතිබුන බැවින් උඩරටින් පොත්දෙකක්ද-මාතරින් දෙකක්ද-කොළඹ විද්‍යොදය පුස්තකාලයෙන් එකක්ද ගාල්ලෙන් දෙකක් දැයි පොත් 7 ක් සපයාගෙණ අව්‍යුත්පන්න ලෙඛකයන් ගේ ප්‍රමාදයෙන් ව්‍යාකූලවූතැන් හැකිපමණින් ශුද්ධකොට සන්නලියා මුද්‍රිතකරවීමු.

මෙහි අපවිසින් සන්නලිවීම දුෂ්කරවූ කවි කීපයකටම අපගේ ආචාර්‍ය්‍යයන්වහන්සේ විසින් සන්නලියාදුන්බවත් මෙය මුද්‍රාඞ්කණකිරීමේදී ගරුකටයුතු දොන් අන්ද්‍රිස්දසිල්වා බටුවන්තුඩාවේ පණ්ඩිතුමානන් විසින් සමහරතැන් බලා ශුද්ධකරදුන්බවත් ස්තුතිපෙරතුකොට කියමු.

තවද අපේ අර්ථව්‍යාඛ්‍යානය ගැණ පණ්ඩිතයෝතුමූ අපගේ උත්සාහයෙහි සතුටුවෙත්වයි ප්‍රාර්ථනාකිරීම පමණක්ද නොව ප්‍රමාද භ්‍රමාදියෙන් සජාතදොෂයන් ශුද්ධකරත්නම් සතුටුසිත් ඇත්තෙමු.

H. JAYATILAKA.

# ශුද්ධ පත්‍රය.

---**---

| පිට. | පෙළ. | අශුද්ධ. | ශුද්ධ |
|---|---|---|---|
| 12 | 23 | කිණපට | කිරණපට |
| 52 | 28 | අන | අණ |
| 57 | 15 | අනා | ඇණ |
| ,, | 16 | අනා | ඇණ |
| ,, | 29 | අන | අණ |
| 60 | 7 | රපදහම | රජදහම |
| ,, | 22 | ගන | ගණ |
| 72 | 35 | පගසතක | පසෙක |
| ,, | 36 | පසතක | පසක |
| 78 | 4 | ගනග | ගණක |
| 2 | 30 | ගෞරශවට | ගෞරවයට |
| 3 | 13 | පුරැ | පුරැව |
| 16 | 25 | පුරගණෝ | පුරඟණෝ |
| 22 | 23 | පැමිසාවූ | පැමිනිසාවූ |
| ,, | 29 | ඇමල් | ඇම්කල් |
| 34 | 24 | සකුකාර්වාඃක්ෂයන්හි | අමුවාඃක්ෂයන්හි |
| 36 | 6 | මහත | මහරැ |
| 44 | 24 | ජිර්ඝබ්‍ර | නිජඝබ්‍ර |
| 46 | 3 | රතඹරෙකලෙස | රතඹරෙකලෙහි |
| 49 | 1 | සවඥ | සම්ඥ |
| ,, | 3 | සුරශොඩුන්ගේ | බධිරයන්ගේ |
| ,, | 10 | කුසුමපට්ටයෙන් | කුසුමපට්ටඵකෙකින් |
| ,, | 12 | සාටකපට්ටයෙන් | සාටකපට්ටයන්ගෙන් උපලක්ෂිතවූ |
| ,, | 24 | දීපඩ්කර | දීපඞ්කර |
| 50 | 5 | නිශශඞ්කම | නිඃශඞ්කාම |

| පිට. | පෙළ. | අශුද්ධ | ශුද්ධ |
|---|---|---|---|
| 50 | 17 | ඝනාන්ධකාරයට | ඝනාන්ධකාරස්කන්ධයට |
| ,, | 25 | ශ්‍යාමවර්ණී | නීලවර්ණී |
| ,, | 32 | සමීපවූ | සමීපයෙහි |
| 52 | 10 | චතුෂ්පදසම්පදය | චතුෂ්පාදද්විපාද |
| ,, | 24 | කඨිනය කෙරෙමින්—කඨිනයකොට | |
| ,, | 28 | විරිඳු | විරිදු |
| 53 | 4 | චතුෂ්පදයන් | චතුෂ්පාදයන් |
| ,, | 5 | නිසදයකොට | නිෂ්පනනව |
| ,, | 16 | ලාබ | ලාභ |
| ,, | 30 | අසමත්සාමි | අසමත්ස්වාමි |
| ,, | 31 | ඔවුනු | ඒ ජනයෝ |
| ,, | 15 | සතෘ | ශත්‍රු |
| ,, | 19 | ශ්‍රීදේවියට | (අනාථරාජයන්ගේ) ශ්‍රීදේවියට |
| ,, | 28 | එරැෂ | එරැස |
| ,, | 31 | බගන | භගන |
| 55 | 12 | ශෝෂා | ඝෝෂා |
| ,, | 13 | හෙමකූටමත්තෙහි | මේරුමස්ථයෙහි |
| ,, | 23 | අබ්‍යාස | අභ්‍යාසය |
| ,, | 26 | නාවුකා | නෞකා |
| 56 | 1 | නාවුකා | නෞකා |
| ,, | 2 | මසෙනග | මහසෙනග |
| ,, | 2 | එක්ඇසිල්ලෙහි | එක්වාරයෙහි |
| ,, | 4 | ද්‍රවිඩ | ද්‍රවිඩ |
| ,, | 5 | මර්ධනය | මර්දනය |
| ,, | 28 | ශතෘ | ශත්‍රැ |
| ,, | 29 | මර්ධනය | මර්දනය |
| 57 | 5 | තෙජෝඥා | තේජසාඥා |
| ,, | 7 | කණනාඩි | කණ්ඨාට |
| ,, | 10 | බැලූවෙහිද | බැලූවේද |
| ,, | 11 | සදෘශම | සදෘශවන |


| පිට | පේළි | අශුද්ධ | ශුද්ධ |
|---|---|---|---|
| 57 | 23 | මලාන | ම්ලාන |
| ,, | 24 | අන | අණ |
| ,, | 25 | අන | අණ |
| ,, | 33 | සතෘ | ශත්‍රැ |
| 58 | 5 | අන | අණ |
| ,, | 8 | (සෙවත) ජනු | (සෙවත) මජනු |
| ,, | 13 | සඹිඝාත | සඹවාත |
| ,, | 19 | එකසම්මුති | එකමජනු |
| ,, | 28 | ඔඝයෙන් | ජලයෙන් |
| ,, | 32 | සරණ | මරණ |
| 59 | 5 | ඤූන | ශූන |
| ,, | 8 | සඹිධ | සවකිය |
| ,, | 9 | ප්‍රඥවනත | ප්‍රඥවත් |
| ,, | 15 | නාවුනි | නාවු |
| 60 | 10 | රැදේ | රැස්දෙ |
| ,, | 24 | සාමී | ස්වාමි |
| ,, | 26 | ගන | ගණ |
| ,, | 30 | පරිෂ්කාර | පරිසකාර |
| ,, | ,, | දීපඞකර | ජීවමාන |
| ,, | 32 | පබුරුරෙන් | පබුරෙන් |
| ,, | 33 | බුහුමත් | බුහුමන් |
| 61 | 5 | සතෘ | ශත්‍රැ |
| ,, | 9 | ප්‍රාතිහාර්‍ය | පරිහාර |
| ,, | 11 | ඤූන | ඥූන |
| ,, | 13 | ශක්තිවනතායන් | ශක්තිමතුන් |
| ,, | 21 | ජෙෂ්ඨ. | ජ්‍යෙෂ්ඨ |
| ,, | 23 | මනිත්‍රී | මනාත්‍රී |
| 62 | 5 | නිශ්චලවූ | අකලිඹටවූ |
| ,, | 11 | යුෂ්මත්තෙමේ | යුෂ්මත්නු |
| ,, | 28 | ඔඝයතෙමේ | ඔඝය |
| 63 | 6 | උල්ලෝකාවලී | ශ්‍රේණාවලී |

| පිට | පෙළ | අශුද්ධ | ශුද්ධ |
|---|---|---|---|
| 63 | 8 | ඔඳුන | අවඳුන |
| ,, | 10 | පුෂප | පුෂ්ප |
| ,, | 12 | වනඝටාය | වනඝටාව |
| ,, | 24 | වනඝටය | වනඝටාව |
| ,, | ,, | රාජරුචිරය | රාජශ්‍රිය |
| ,, | 35 | තටාක | තඩාග |
| 64 | 8 | පඳුක | කඳුක |
| 65 | 33 | පිළිමල් | පිළිමල්වන |
| 67 | 1 | බාහ්‍යයට | බාහ්‍යභානයට |
| ,, | 3 | ආරණ්‍ය | අරණ්‍ය |
| ,, | 9 | නිශ්චල | නිර්මල |
| ,, | 32 | හයවී | භීතවී |
| ,, | 35 | එලබෙනනවූ | එල්බෙනනාවූ |
| 6 | 7 | භ්‍රමන | භ්‍රමණ |
| ,, | 9 | වලිකුක්කුට | වනකුක්කුට |
| ,, | 16 | අධඃභග | අධොභාග |
| 69 | 12 | වෘතින් | වෘනතින් |
| ,, | ,, | පක්ෂසංහතිය | ගුගම්පක්ෂසංහතිය |
| ,, | 20 | මණ්ඩ | මණ්ඩප |
| ,, | 27 | සොතප්ලල | සුතප්ලල |
| ,, | 32 | ආරණ්‍ය | අරණ්‍ය |
| 70 | 5 | මෙඝනමේ | මෙඝය |
| ,, | 7 | නාගභාකුක්ෂියට | ආකාශකුක්ෂියට |
| 11 | 12 | වාසුදෙවතෙමේ | වාසුදෙවයා |
| ,, | 28 | ගරුඩරාජතෙමේ | ගරුඩරාජයා |
| ,, | 32 | පවි | පඞ්කති |
| 72 | 31 | මනිපර්ස්ථාවූ | විකසිතවූ |
| 73 | 27 | සොතප්ලල | සුතප්ලල |
| 74 | 7 | ඉන්දීවර | චතුරංගුල |
| ,, | 16 | මඩින | මඩුන |
| ,, | 20 | සාමනෙර | සාමණෙර |

| පිට | පෙළ | අශුද්ධ | ශුද්ධ |
|---|---|---|---|
| ,, | 25 | අධඃභාග | අධොභාග |
| 75 | 16 | හිතති | හිතනි |
| ,, | 26 | පරම්පරා | පරම්පර |
| ,, | ,, | සවණීදි | සවර්නදි |
| 76 | 10 | මෘති | මූර්ති |
| ,, | 17 | නභොකුක්ෂියෙහි | ආකාශකුක්ෂියෙහි |
| ,, | 19 | සපෂී | සපශී |
| 77 | 2 | අමාත්තාජ | අමාතොජස් |
| ,, | 10 | රාජි | කානනීන් |
| ,, | 25 | හිතති | හිනති |
| ,, | 31 | සමුඩී | සමාධි |
| 79 | 12 | නිසද්ධකොට | නිෂ්පානාව |
| ,, | 18 | සාමනෙර | සාමණේර |
| 80 | 21 | ඹූරි | දූරි |
| 82 | 2 | කොළා | කොලා |
| 83 | 22 | බොධිදුම | බොධිද්‍රැම |
| 84 | 10 | සෞන්දර්යවූ | සුන්දරවූ |
| ,, | 14 | ව්‍යසනාඃන්ගේ | කවිසමූහයාගේ |
| ,, | 15 | මකුට | සෙබර |
| ,, | 17 | නිශ්චල | නිර්මල |
| ,, | 23 | නරධම්ම | නරදම්‍ය |
| ,, | 24 | දුම | ද්‍රැම |
| 86 | 7 | ගන | ගණ |
| ,, | 16 | සවි | ඡවි |
| ,, | 17 | ව්‍යාකරණයන් | ව්‍යාකරණය |
| ,, | 32 | ස සමයාවායසී | සව සමයාවාසී |
| 87 | 9 | පයසීපනව | පයසීනනාව |
| ,, | 10 | මඬු | වඬු |
| ,, | 15 | විජෘඹගමාන | විජෘම්භමාණ |
| ,, | 21 | කානනාගොසම් | කානනාව |

| පිට | පේළි | අශුද්ධ | ශුද්ධ |
|---|---|---|---|
| 88 | 7 | පෞරාණ | පුරාණ |
| 89 | 4 | සවි | ඡවි |
| , | 8 | සවි | ඡවි |
| ,, | 14 | නාරිකාතොමෝ | නාරිකාවවිසින් |
| ,, | 25 | සතතෘ | ශත්‍රෑ |
| ,, | 26 | මඩීන | වඬීන |
| ,, | 28 | විජෘම්භමාන | විජෘම්භමාණ |
| 90 | 24 | විජෘම්භමාන | විජෘම්භමාණ |
| ,, | 26 | ප්‍රමොදිෂට | දෘමොදදිෂට |
| ,, | 27 | කණ්ණාවතඞ්ශ | කණ්ණාවතංශ |
| 91 | 16 | ගන | ගණ |
| 92 | 16 | සතතෘන් | ශත්‍රෑන් |
| 93 | 8 | ශත | දශ |
| ,, | ,, | තලසෙනිවූ | තලාසනාසෙනිවූ |
| 89 | 26 | සතතෘන්ගේ | ශත්‍රෑන්ගේ |
| ,, | 27 | මඩීන | මඬීන |

G. Johanis Peiris



# ගිරා සන්දේශය.

**1 සැරද කිරරද සඳ· නන්වන් රුවන් රුවන්.**
**සහකුරු මියුරු තෙපලින්· සව්ලෙව් සතන් හදනා.**

1 "කිරරදසඳසැරද" යනු මෙහි වාක්‍ය යොජනායි–කෙබඳු කිර පක්‍ෂිරාජයෙක්ද යත්–නන්වන්, නානාවර්ණවූ; රුවන්රුවන්, රත්නමය රූපයක්බඳුවූ; සහකුරු, (ශොභාශ්‍රීභාෂාදී) අක්‍ෂරයන්ගෙන් සමන්විතවූ; මියුරු තෙපලින්, මධුරාලාපයෙන්; සව්ලෙව්, සකල ලොකවාසීන්ගේ; සතන්, සන්තාන (චිත්ත) යන්; හදනා, ආකර්ෂණයකරන්නාවූ හෙවත් සතුටුකරන්නාවූ; කිරරදසඳ; කිරපක්‍ෂිරාජය; සැරද, චිරකාලයක් ජීවත්වෙව.

(මෙසේ මේ * යහගිරාණන් ආශීර්වාදකොට, තදනතරව කිරපක්‍ෂීහු සම්බන්ධවූ ශරීරලාවණ්‍ය රූපවිලාසය වර්ණ

---

* "නවකොලොස් වසමු–එකොලොස් බැගින් යෙ
මෙනී
ලුනුබහලින් වඩුයෙ–යාගිය (මේ නිදසුන්)"

විෂමවූ එක්වෙනි තුන්වෙනි පාදයන්හි නවමාත්‍රාවහා එකොළොස්මාත්‍රාද-සමවූ දෙවෙනි සතරවෙනි පාදයන්හි එකොලොස් එකොලොස් මාත්‍රාබැගින් යොදා ලඝු ගුරුහ් කොටලා මාත්‍රා සතලිස්දෙකකින් බඳිනා යොළෙ සහගීයයි–"කුසාසිරිනෙදවස්" යනාදිය ර් ෟ නිදර්ශනයි–මෙහි "සැරදකිරරදසඳ"යනාදිනී යයිද මේලක්‍ෂණයි.

ණාකරන්නෝ "ඉඳුදුනු පැහැදිනූ" යනාදි † දසපදඋප ජාත සැහැල්ල කීනු.

2 ඉඳුදුනු පැහැ දිනූ- තුනුසිරිනුදුල මමිතුර.
ළඳ සොඳ අඳර වැනි තමගෙ තෙල තුඩ   දු ටු ව
ලොබබැඳ අදර නොකරති කවුරු සතු   ටු ව
වන වනපතිතුමරහි- පුර පුරපතින් මැදුමරැසි.
නාදව නිතොර ලැබ පිය පිය තර පහ   ස
ර දව පවර කෙලි කෙළ කෙළ හැම දව   ස
දි සි දිය කුස හැම සිතො තුත්ගෙන් ගු   රු ව
ණි සි යසරුස කියවන නුවනින් සු   රු ව
ඉ සි වර ලෙස නිති පණිවායෙන් දු   රු ව
ර් සි පලරස විඳ සතොසින් දවස   රු ව

2 ඉඳුදුනු, ඉන්ද්‍රචාපයාගේ; පැහැ, ප්‍රභාව; දිනූ, ජය ගත්තාවූ; තුනුසිරින්, ශරීරලාවණ්‍යයෙන්; උදුල, උජ්ජ්වලිතවූ; මමිතුර, මාගේ මිත්‍රය-ළඳ, කාන්තාවන්ගේ; සොඳ, සුන්දරවූ; අඳරවැනි, අධරාකාරවූ; තමගෙ, යුෂ්මත්ශබ්දවාච්‍යයාගේ; තෙලතුඩ, මේ තුණ්ඩය; දුටුව, දර්ශනයකළහොත්; කවුරු, කිනම් කෙනෙක්; සතුටුව, සන්තුෂ්ටව; ලොබබැඳ, ලෝභබන්ධනයකොට; අදරනොකරති, ආදරනොකරත්ද-වන, අරණ්‍යයෙහි; වනප

---

† දසපද සැහැල්ල.

" කඩවක්හි පිරියනැ-සිව්පෙදෙහි යම් විරිතක්
බහා බඳහොත් දන්නේ-උවදැනම් සැහැලිනම්"

කඩවක්නම් වෘත්තයේ අවසානයෙහි සිව්පදයෙහි යම් වෘත්තයක් බන්ධනයකළහොත් (ඒ වෘත්තය) උපජාතනම් සැහැල්ලයි-ඒද දශපද ද්වාදශපදාදීන් උපලක්ෂිතයි-මෙහි දශපද උපජාතනම් සැහැල්ල "ඉඳුදුනු පැහැදිනූ" යනාදීන් බන්ධනය කරනලදී- මින් මත්තෙහි අවස්ථානය දක්වා බන්ධනය කරණලද පද්‍යයන්ගේ ලක්ෂණ කීම ග්‍රන්ථගෞරවයට කාරණ නමුත් මහොපයොග නොවන හෙයින් උපෙක්ෂිතයි.

තිඹුරෙහි, වනසපති වෘක්ෂයෙහිද; පුර, නගරයෙහි; පුරපතින් මැළුරෙහි, නගරාධිපතියන්ගේ මන්දිරයෙහිද; පියකර, ආනන්දකරවූ; පිය, ප්‍රියාවන්ගේ; පහස, ස්පර්ශය; ලැබ, විඳිමින්; නිතොර, අනවරතයෙන්; නදව, සතුටුව; පවරකෙළි, ප්‍රවරක්‍රීඩාවෙන්; කෙළකෙළ, ක්‍රීඩාකොරමින්; හැමදවස, සියලු දවස්හි; රඳව, වසව හෙවත් සැපසේ වාසයකර-දියකුස, ජගත්කුක්ෂියෙහි; දිසි, දෘශ්‍යමානවූ; හැමසියොතුන්හෙන්, සකල පක්ෂීන් අතුරෙන්; ගුරුව, ආචාර්යව හෝ ප්‍රධානව; යොසි, යොග්‍යවූ; නුවණින්, ඥානයෙන්; සුරුව, ශූරව; යසරැස, කීර්තිරශ්මිය; කියමන, (ලෝවැස්සා ලවා) කථනයකරවන්නාවූ; ඉසිවරලෙස, ඍෂිවරයෙක්සේ; පණිවායෙන්, ප්‍රාණඝාතයෙන්; දුරු, දූරීභූතව හෝ වෙන්ව; රිසි, රුචිවූ; පලරස, ඵලරසයෙන්; විඳ, විඳිනයකොට; සතොසින්, සන්තෝෂයෙන්; දවසරුව, කල් ගතකර-(මෙතැන් පටන් ඈතැම්තැන පළමු කී ගී සැහැලිවලින් හා සමුද්‍රඝොෂා චක්‍රවාක මකරධ්වජාදී නානා වෘත්තයන්ගෙන් විචිත්‍රයි.

3 ල ද ය ම් කෙනෙක් සරසවිබැලුමසක් නි සි
කෙතර ම් වූවත් මුලුලොව කෙරෙහි අතවැ සි
එ ත ර ම් පසිඳු සරසවි දෙවිය අතවැ සි
ම න ර ම් කෙනෙක් තොපිමය පරසිදු සුබැ සි

3 සරසවි බැලුමසක්, සරස්වතී දර්ශනාංශුවක්; ලද, ලද්දාවූ; යම්කෙනෙක්, කිසියම් (සත්ව) කෙනෙක්; මුලු ලොව, සකල ලෝකය; කෙතරම්වුවත්, කොයි ප්‍රමාණ වූයේද; නිසි, නිත්‍යයෙන්; අතවැසිකෙරෙති; අන්තෙවාසික කරති; එතරම්, තත්ප්‍රමාණවූ; පසිඳු, ප්‍රසිද්ධවූ; සරසවිදෙවිය, සරස්වතී දෙවියට; අතවැසි, ශිෂ්‍යවූ; මනරම්, චිත්තකලුවූ; කෙනෙක්, කිසියම්කෙනෙක්; (විද්‍යමානනම්) සුබැසි, යහපත් භාෂිතයෙන් යුක්තවූ; තොපිමය, යුෂ්මත්ශබ්දවාච්‍යයාමය.

4 මෙවන් ගුණෙනැන් යුතු තොපගේ පියතෙප ල
සව න් පුර පැමිනෙත මිතුර මනාක ල
ලෙවන් නොයෙකලෙස කිවත් සැපවිපු ල
නිව න් දකින තෙක් සැපනම් එමයි බ ල

4 මෙවන්, උක්තප්‍රකාරවූ; ගුණෙනැන්යුතු, (යහපත්) ගුණෞඝයෙන් යුක්තවූ; මනකල, මනොනන්දනවූ; මිතුර, යහලුව; තොපගේ, යුෂ්මත්හුගේ; පියතෙපල, ප්‍රියවචනය; සවන්පුර, කන්පුරා; පැමිනෙත, ප්‍රාප්තවත්හොත්, විපුලසැප, මහත්වූ සම්පත්තිය; ලෙවන්, ලෝවැස්සන් විසින්; නොයෙකලෙස, නොයෙක් පරිද්දෙන්; කිවත්, කථනයකලේනමුත්; නිවන්දකිනතෙක්, නිර්වාණයදක්නාතුරු; බලසැපනම්, දැඩිවූ සැපනම්; එමයි, ඒ (තොපගේ වචන රසය) මයි.

5 දිර වැටෙනතුරු තුර නොහැර ඉදතො සේ
පුර තනෙහි පරසිදු මුලු තෙදිය කු සේ
හිර කුල උපන් සකි තොපගෙ සිත්ලෙ සේ
පු ර මිතුරුදම් අමුතුව කියනු කෙ සේ

5 තුරු, වෘක්ෂය; දිරවැටෙනතුරු, ජීර්ණවපතිතවන තෙක්ම; නොහැර, හැරනොයා; තොසේ, තොෂයෙන්; ඉඳ, වාසයකොට; පුරතනෙහි, පුරාණකාලයෙහි; මුලුතෙදියකුසේ, සකල ත්‍රෛලොක්‍ය කුක්ෂියෙහි; පරසිදු, ප්‍රසිද්ධවූ; හිරකුල, කිරකුලයෙහි; * උපන්, ජාතවූ; සකි, යහලුව; තොපගෙ, යුෂ්මත්හුගේ; සිත්ලෙසේ, සිත්වූ පරිද්දෙන්; මිතුරුදම්, මිත්‍රධර්මය; පුර, පුරව; කෙසේඅමුතුවකියනු, කොයිආකාරයෙන් අමුතුව කියනුලබන්නේද.

---

* මේ කුමක්සඳහා කියනලද්දේද යත්, 'වීසතිනිපාත' යැයි ආවාවූ චුල්ලසුක ජාතකයසඳහා කියනලද්දේය.

දුමො යදා හොති ඵලූපපන්නො
භුඤ්ජන්ති තං විහගා සම්පතන්තා
ඛීණන්ති ඤත්වා නදුමං ඵලච්චයෙ
දිසොදිසං යන්ති තතො විහඞ්ගමා

6 පෙ මා වඩන ඉවු සුකිසඳිනි දසදෙ ස
යොමා නුවන් බැලුවත් මුලුමෙලෝකු ස
මෙ මා සිතන කටයුතු සිදුකරණලෙ ස
ප මා නොවන මිතුරෙක් නැත මෙතොපමිස

6 පෙමාවඩන, ප්‍රෙමවර්ධනයකරන්නාවූ; ඉවුසකිසඳිනි, ඉෂ්ටමිත්‍රොත්තමයාණෙනි; දසදෙස, දශදිශාවෙහි; නුවන්යොමා, නෙත් යොමුකොට; බැලුවත්, නිරීක්ෂණ සකළත්; මෙමා, මේ අසමත්නු විසින්; සිතන, චින්තනය කරන්නාවූ; කටයුතු, කර්තව්‍යය; සිදුකරණලෙස, සිඩකරණු පිණිස; පමානොවන, ප්‍රමාදනොවන්නාවූ; මිතුරෙක්, මිත්‍රයෙක්; මෙතොපමිස, මේ ගුණමත්නු මුත්; මුලුමෙලෝකුස, මේ සකලලොක කුක්ෂියෙහිම; නැත, අවිද්‍යමානයි.

---

වරං වාරිකං ලොඤ්ත තුණ්ඩමාචරි
කිං එවං සුව සුක්ඛ දුමම්හි ඣායසි.
තදිඞ්ගමං බ්‍රෑහි වසන්ත සන්නිභ
කස්මා සුව සුක්ඛ දුමං නරිවසි.

ඝනාදී ගාථා නවයකින්යුක්තවූ චුල්ලසුක ජාතකයෙහි බොධිසත්වවූ ගිරාරජතෙම හිමවත්හි නොයෙක් දහස් ගණන් ගිරවුන් සමග එක් දිඹුල්වෙනෙක්හි විසුයේය–ඒ දිඹුල්වෙනෙහි තමන්විසූ දිඹුල්රුක ඵල ක්ෂයවූකල්හි දළුවක් හෝ පතක් හෝ සිවියක් හෝ පතුරක් හෝ යමක් යමක් ඉතිරිවූයේද එය භක්ෂණයකොට ගඟින් පැන් බී අතිශයින් අල්පෙච්ඡසන්තුෂ්ටව අන්තැනෙක නොගොස් හුන්නේය–ඒ වෘක්ෂය වියලිකල්හි එහි සුණු අනුභවකොරෙමින් ජීර්ණවයනතෙක් එහිම වාසයකෙළේය–ඔහුගේ අල්පෙච්ඡතාදි ගුණයෙහි පැහැදී සක්දෙව්රජ අවුත් ඔහුහා කථාකොට වරදෙමින් උදුම්බරවෘක්ෂය අමෘතඵල කළමැව් කියනලද්දේය.

(මෙය ගෙණහැරදක්වා ගිරවංශයෙහි චූවන්ගේ අල්පෙච්ඡතාවහා නොපසුබස්නාවූ වීර්‍ය්‍යී කියා ගිරවා වර්ණනාකලේ)

විශිෂ්ට පක්ෂපත්‍ර විචිත්‍රගාත්‍ර පවිත්‍රචාරිත්‍ර ඈති මිත්‍රෝත්තමය–පක්ෂීන් අතුරෙන් තොපම දූතක්‍රියාවෙහි යොදන්නා පූර්වචාරිත්‍රයෙක්මැනෙවි.

අලබ්ධඝාතවූ පියාපතින්හා විසිතුරු ශරීරශෝභා ඈති පිරිසිදු සිරිතින්යුත් සගය පක්ෂීන් අතුරෙන් යුෂ්මතුන්ම දූතක්‍රියාවෙහි යෙදීම පෙරසිරිතෙක්වද.

7 හි ම සෙ ල් අතුර කෙළලක් රකුසන් විසි නි
රැ ක ව ල් කළ කුවෙර අබතුර අඹතුරි නි
ලොහොඳු ල් තුළට වැද මීඅඹ ගෙණ දෙමි නි
පෙ ර ක ල් රජෙකු තුටුවූ කෙළෙ ගිරවෙක තවැ

7 හිම්සෙල්අතුර, හිම ශෛලාභ්‍යන්තරයෙහි; කෙළලක් රකුසන්විසිනි, කොටි ලක්‍ෂ සඞ්ඛ්‍යාත රාක්‍ෂසයන් විසින්; රැකවල්කළ, රක්‍ෂාවරණකළාවූ හෙවත් මුරකළාවූ; ලොහොඳුල්තුළටවැද, ලෝහජ්වාලාභ්‍යන්තරයටවැදී; කුවෙර, කුවේරයාගේ; අබතුර අඹතුරිනි, අභ්‍යන්තරනම් ආම්‍රවෘක්‍ෂයෙන්; මීඅඹ, මධුරාම්‍ර හෙවත් සහකාරඵලයන්; ගෙණදෙමිනි, ගෙණැවිත් දෙමින්; පෙරකල්, පූර්වකාලයෙහි; රජෙකු, නරේන්ද්‍රයෙකු, තුටුකෙළෙ, සන්තුෂ්ටකෙළේ; තවැනි, තා හා නිර්විශේෂවූ; ගිරවෙක, ශුකපක්‍ෂියෙක. *

---

* මේ කුමක්සඳහා කියනලද්දේදයත් 'ත්‍රිකනිපාත' යෙහි පෙණෙන 'අබ්භන්තරජාතක' යෙහි කියනලද ගිරවා සඳහායි–

අබ්භන්තරං නාම දුමො යස්සදිබ්බමිදංඵලං
භුත්වා දොහළිනී නාරී චක්කවත්තිං විජායති
ත්වම්පි භද්දෙ මහෙසීසි සාචාපි පතිනො පියා
ආහරිස්සති තෙ රාජා ඉදං අබ්භන්තරංඵලං
භත්තුරත්ථෙ පරක්කන්තො යං ඨානමධිගච්ඡති
සූරො අත්තපරිච්චාගී ලභමානො භවාමහං–යි අබ්භන්තර
ජාතකය මේ ගාථාන්ගෙන් දෙසිනයි–අතීතයෙහි බරණැ

8 බඹදත් රජු රදුන්හට විස යොදු ස ද
එපවත් අසා සෙද සෙබළින් යවා ත ද
මහසත් ගුණෙන් පිරි මහඹසු පඬිස ද
දිසසෙත් කොවල් එක් කිරිදෙසු සඳවි ද

8 බඹදත්රජු, බ්‍රහ්මදත්තනරේන්ද්‍රයා විසින්; රදුන්හට, (එසියයක්) රාජයන්හට; විසයෙදූසඳ, (ජයපානයයි) විෂ යොජනයකළකල්හි; මහසත්ගුණෙන්පිරි, (අනාශංසාසංවිභාගරුචිතා තිතික්ෂාආදි) මහාසත්වගුණයෙන් පුණි වූ; මහඹසුපඬිසඳ, මහෞෂධපණ්ඩිතවරයාවිසින්; එපවත්,

---

ස බඹදත් නම් රජෙකු රාජ්‍යයකරණකල්හි හිමවත්පෙ
දෙසෙහි විසූ සමාපත්තීන්හා අභිඥාලත් තාපසයෙක් බර
ණැසටපැමිණ උයනෙහි වසන කල්හි ඒ තවුසන්ගේ සීල
තෙජසින් කම්පිතවූ ශක්‍රභවනඇති සක්දෙව්රජහුවිසින්
ඒතවුසන්ගේ ආවාසයන් නෂ්ටකරණපිණිස රජහුගේ
මෙහෙසියට 'අබභ්‍යන්තර, නම් අඹ අනුභවකළකල්හි ච
ක්‍රවර්තිගර්භයක් ලැබෙයි රාත්‍රිකාලයෙහි අහසසිට කියා
උයන අමුවෘක්ෂයන්හි අඹකැබූයේ අන්තර්ධාන කළකල්හි
ඒ දෙවියගේ අඹදොළදුක් දත් රජහු උයන අඹතුරුවල
අඹ නැත්තෙන් තවුසන් පලවා ත් අබභ්‍යන්තරනම් අඹසට
ත් බමුණන්පිළිවිස ඒනම්අඹ දෙවියන්ට පරිභොගවෙයි,
හිමවත රන්ගුහායෙහි ඇත, මිනිසුන්විසින් ගෙණෙනා
හැකිය එක් ගිරාපොතකයෙක් යැවියයුතුයයි–බමුණන්ගී
බස්අසා රජකුලයෙහි හුන් ගිරාපොතකයකු යවා අභ්‍ය
න්තරනම් අඹඵලයක් ගෙන්වා දෙවියට දුන්බැව් කියනල
දී–ඒ අභ්‍යන්තරනම් ආමුවෘක්ෂය ලොහොදලින්වසා ර
කුසන් වටකොට මුරකරවා කුවෙරයා විසින් රක්නාලද්
දේය–එහි ගියාවූ සුවපොතකයා රකුසන්ට අවවාදකොට
උන්ගතින්මිදී කූරවරයාගෙන් අඹලත් තාපසයන්ගෙන් අ
ඹගෙණබැව් කියනලදී–මේද ගිරවෙකුවිසින් කරණලද්
වික්‍රමයක්බැව් ශ්‍රැතකයන්දත් ධූතකාව්‍යකර්තෘන් විසින්
ධූතකමින් යොදනුලබන ගිරවා මෙසඳ කියා වර්ණනාක
රණලද්දේය.

ජ් (විෂයෝජන) ප්‍රවෘත්තිය; අසා, ශ්‍රවණය කොට; සෙද, වහා; තද සෙබළුන්, දුෂ්ටභටයන්; යවා, ප්‍රයාණයකරවා; දියසෙත් කෙළේ. ජගත්සාන්ති කරණලද්දේ; එක් කිරිදෙකුපඳවද, එක් කිරපක්ෂියෙකු නිසාවදි. *

9 එබව සි තා දුන් වන ලෝවැඩපිණි ස
තරව ප තා නොවමින් මදකුත් අල ස
ගිරව මෙ තා සිත වඩමින් පියදඟ ස
අසව ඉ තා සතොසින් මකියන මෙබ ස

9 දුන්, මේ වර්තමානයෙහි; එබව, උක්තාප්‍රකාරය; සි

---

* මේ කුමක් සඳහා කියනලද්දේදයත්—උම්මග්ගජාතකයෙහි පෙණෙන මහෞෂධපණ්ඩිතයන් විසින් වැඩූ මාඨරගොත්‍රයෙහි උපන් ගිරවා සඳහායි—එනම්, එකබිලරට සංඛපාලනම් රජ්ජුරුවන් ඇතුළුව සියලු දඹදිව එක්සියයක් රජදහන් මුලුල්ල වමසනු පිණිස යැවූ ඒ ගිරවා සියලු රාජධානියෙහි සැරිසරා විත් කම්පිල්ල දේශයෙහි උත්තරපංචාල නුවරට පැමිණ එහි රජකම්කළ චූලනී බ්‍රහ්මදත්ත රජුහා කෙවට්ටනම් පෙරෙවි බමුණා විසින් ඒ සියක් රජදරුවන්ට ජයපානයයි විසයෙදීමට කළ මායාකාරී කුමන්ත්‍රණය උන් සමීපයෙහි සැඟවී හිඳ අසා ගෙණ අවුදින් මහබොසතානන්ට කීයෙන්—විෂයොජන සමය දැන තමන්වහන්සේ හා සමකාලීකවූ සෙබළුන් යවා විසපිරූ බඳුන්හා ඒ සඳහා සරසනලද අඹුන් ආදී සකල ද්‍රව්‍යයන් සුණුවිසුණුකරවා සියලු රජදරුවන්ට ජීවිත දානය කෙළේය—මේද ගිරවෙක් නිසා කරණලද්දක් බැවිනියා ගිරවා වර්ණනා කළහ—(මේ මහ උම්මග්ග ජාතකය ආදියෙහි පෙණෙ කථාවේ සංක්ෂෙප අදහසයි)

(මෙසේ දූතයා වර්ණනාකිරීම පුරාණ මහාකවීන්ගේ චාරිත්‍රයෙකි—මෙඝදූත කාව්‍යකර්තෘන් විසින්ද "ජාතංවංශෙ භුවනවිදිතෙ පුෂ්කරාවර්තකානාං" යනාදීන් මේඝයාගේ උත්තම වංශාදිය වර්ණනාකොට මෙඝයා දූතකම්යෙහි යෙදූසේ රචනාකරණලදී—එහෙයින් මේ කීරුසන්දෙශ කර්තෘන් විසින්ද ගිරවා වර්ණනාකොට දූතකම්යෙහි යෙදූසේ රචනාකරණලදී.)

තා, සමරණීයකොට; මන, මන්නාවූ; ලෝවැඩපිණිස, ජගත් ඇසිවෘඩියපිණිස; මදකුත් අලයනොව, ස්වල්පය කුත් ආලයඇති නොව; නරමයතා, ස්ථිරව ප්‍රාර්ථනා කොට; ගිරව, කීරපක්‍ෂීය; මෙතාසිතා, මේඝුෂමත්හුගේ චිත්තයෙහි; පියදගසවඩමින්, ප්‍රියඅධ්‍යාශය වඩිනාසේ කෙරෙමින්; මකියන, මාවිසින්කියනලද; මෙබස, මේවාක්‍යය; ඉතාසතොසින්, අතිසන්තුෂ්ටියෙන්යුක්තව; අසව, ශ්‍රවණයකරව.

10 හරගිරි රසිනුදුල- දිනිසුරු අලකාපුර යුරු.

පසි ඳු තරි ඳු මෙන් මුලුලොව නිති බැබ ලි
නාති ඳු සිහි දු තුනුකැල්මෙන් එනොකඟො ලි
පෙරසිට ඉවූ නොපවු- තොටගමුවෙහෙරවිසිතුරු
පැහැසර ගැඹුරු ගුණ පිරිසිඳු පිළිවෙති නා
මනහ ර මහරු සඟගණසමඟ වැජඹෙ නා
තෙ ව ලා රුවනාකර උඳු යතිකර රුව ට
හ ල ලා ගැඹුරුපදරුත් මිණි දෙනා ලොව ට
තෙ ව ලා වදනිසුරු විජයබ තෙරිඳුහ ට
නො ව ලා ගොසින් මෙඅසුන් සැලකරව සි ට

10 හරගිරිරසින්, කෛලාසපර්වතප්‍රභාවෙන්; උදුල, උජ්ජ්වලිතවූ; දිනිසුරු, වෛශ්‍රවණයාගේ; අලකාපුරයුරු, ආලකමන්දාවඩිනුවූ; බැබළ, භ්‍රාජිතවූ; තරිඳුමෙන්, නිශාකරයාසේ; මුලුලොව, සකලලොකයෙහි; නිති, නිරන්තරයෙන්; පසිඳු, ප්‍රසිඩවූ; නතිඳු, නාගේන්ද්‍රයාගේ; සිහිදුතුනුකැල්මෙන්, සනිග්ධවූ ශරීරකාන්තියෙන්; එකහෙළිවන, ඒකාලොකවූ; පෙරසිට, පුරාතනයෙහිසිට; ඉවූ, ඉඳුවූ; හෙවත් සහිත්වූ; විසිතුරු, විචිත්‍රවූ; නොපවු, විශාලවූ; තොටගමුවෙහෙර, තීර්ථග්‍රාමවිහාරයෙහි; පැහැසර, ප්‍රභාසාරවූ හෙවත් නිර්මලවූ; ගැඹුරුගුණ, ගම්භීර ගුණයෙන් හා; පිරිසිඳු පිළිවෙතින, පරිශුද්ධ ප්‍රතිපත්තියෙන් යුක්තවූ; මනහර, සිත්කලුවූ; මහරුසඟගණ සමඟ, මහාශ්‍රීසඞ්ඝසමූහයා හා සමඟ; වැජඹෙන, ව

ජාමහමාන වන්නාවූ; -තෙවළා, ත්‍රිපිටක (ධර්ම) නැමි
ති; රුවනකර, සාගරයාගේ; උඩුයටිකර, ඌර්ධ්ව අධො
භාගය; රුවට, මනාව; හළලා, ආලෝලනයකොට; ගැ
ඹුරුපදරුත්, ගම්භීරපදයෙනිනැමති; මිණි, මාණික්‍යය
න්; ලොවට, ලොකයට; දෙන, ප්‍රදානයකරන්නාවූ;
තෙවළාවදනිසුරු, ත්‍රිපිටක වාගීශ්වරවූ; විජයබතෙරිඳු
හට, විජයබාහු (පරිවෙණාධිපති) ස්ථවිරෙන්ද්‍රයානන්
ට; නොවලා, නොවැලකා; ගොසින්, ගමනයකොට; සි
ට, (අභිමුඛයට පැමින) සිටිනව; මෙඅසුන්, මෙහස්න;
සැලකරව, දන්වව.

11 එ හ සු න් මතු කියමි ඔබ ගියසඳ සබ ඳ
තොපගෙ න් පිළිවිසින දනා විස්මවනලෙ ඳ
වෙසෙසි න් මෙපුරසිරි වණනා මෙබස්සො ඳ
සතොසි න් මිණිකොඩොල්ලෙස තාසවන් ස *

11 සබඳ, යහළුව; ඒහසුන්, ඒ හස්න; මතු කියමි; නැවත කියන්නෙමි; ඔබගියසඳ, එහිගියකල්හි; තොපගෙන්, යුෂ්මත්හුගෙන්; පිළිවිසින, පරිපෘච්ඡාකරන්නාවූ; දනා, ජනයා; විස්මවනලෙද, විස්මවනසේ; මෙපුරසිරි, මේ නගරශ්‍රීන්; වෙසෙසින්, විශෙෂයෙන්; වණනා, වර්ණනාකර කළඳ; සොඳ, සිත්කළුවූ; මෙබස්, මේ වචනයන්; මිණිකොඩොල්ලෙස, මාණික්‍ය කුණ්ඩලාභරණ සේ තාසවන්, තාගේකර්ණයෙනි; සඳ, සරසව.

---

* අපටලැබුන පොත්වලින් කීපයක මේ කවියවෙනුවට තුබුයේ ව්‍යාකූලවූ මෙයයි.

‘‘සබඳ ඒ ඇස්න මතු කියමි ගිය තැන්හි
පිළිවිස්න දන විස්මවනලෙසට දන්
මෙපුරසිරි වෙසෙස්කර වණනමෙ
වදන්මිණිකොඩොල් සන්තොසින්තාසමන්සඳ’’

12 ජ ය ව ද්ද න දනුමැති මැතියුත් පව ර
රුපු ම ද්ද න ගජ බලසෙන් රැදි නිතො ර
නොවිර ද්ද න සග මොක් මුනිදහම්ය ක ර
ජයව ද්ද න පුරවර මෙය දනු මිතු ර

12 ජයවද්දන, ජයවර්ධනයකිරීමෙහි; දනුමැති, දැනුම් ඇත්තාවූ හෙවත් සමර්ථවූ; පවර, ප්‍රවරවූ; මැතියුත්, මන්ත්‍රීන්ගෙන් යුක්තවූ; රුපුමද්දන, සතුරන්මර්ධනය; ගජ, හස්ති (සේනාව) හා; බලසෙන්, භටසේනාව විසින්; නිතොර, අනවරතයෙන්; පිරි, පිරුණාවූ; සගමොක් ස්වර්ග මොක්ෂය; නොවිරද්දන, නොවිරදවන්නාවූ; මුනිදහම, සර්වඥධර්මයට; අකර, ආකරයක්බඳුවූ; ජයවද්දනපුරවර, ජයවර්ධනනම් නගරවරය; මෙය, මේය යි; මිතුර, මිත්‍රය; දනු, ජානනයකර;

13 බ ඹා පළමුවෙන් ලොවපමණ නොදන මා
අ ඹා තුබූ සක්වලගිරිසෙ මෙතැන මා
ප බා විසිදි පවුරට නන දරණ යො මා
නො බා කියම් නොසරිද යන්තමක් න මා

(13) බඹා, බ්‍රහ්මයාවිසින්; පළමුවෙන්, ප්‍රථමයෙන්; ලොවපමණ, ලොකප්‍රමාණය; නොදනමා, ජානනයනොකොටම; මෙතැනමා, මේ ස්ථානයෙහිම; අඹාතුබූ, නිර්මිතකොටතුබූවාවූ, සක්වලගිරිසෙ, චක්‍රවාටපර්වතයමෙන්; විසිදි, විස්තීර්ණවූ; පබා, ප්‍රභාවඇති; පවුරට, ප්‍රාකාරයට; නන, අනන්තයාගේ; දරණ, භොගාවලිය; යොමා, යොමුකොට; නමා, ඒඅනන්තයා; නොසරිද, සමානනොවන්නේදැයි, යන්තමක්, ස්වල්පයකුත්; නොබා, කිසිසේත වහෙවත් පසුනොබැස; කියම්, කථනයකරමි.

14 ඒනාස ද පෙර මෙපුර කිරිසිඳු දුව තු මු ව
සිදුර ද විසින් ඇස රැකවරණට තැ මු ව
පිරිසි ද ඒවූ සිඳුකාඩෙකොව් නොව ප මු ව
ඇමස ද පිරුණු දියගල ලොබ්වෙයි දු මු ව

14 පෙර, පුරාතනයෙහි; කිරිසිඳුදුව, ක්ෂීරසාගරයාගේ දුහිතෘ (ශ්‍රීකාන්තා)ව; මෙපුර, මේනගරයට; තුවුවඒනාස

ද, සනතුෂ්ටවඑනකල්හි; ඇය, ඒදුහිතෘව; රූකාභරණව, රක්‍ෂාවරණය ප්‍රණිස; සිඳුරදවිසින්, සින්දූලක්‍ෂණ රාජයාවිසින්; පිරිසිඳ, පරිච්ඡේදකොට; කැටුවවඑවූ, සමගඑවූවාවූ; සිඳුකාණ්ඩකෙවූ, සින්ධුඛණ්ඩයක්සේ; නොවපවුව, උනනොවී; ඇමසඳ, සැමකල්හි; පිරුණු, පූර්ණවූ; දියගල, පරිඛාව; සුවුව, දර්ශනයතලකල්හි; ලොබවෙය, ලුබ්ධවේ.

15 සුවිස ල් අගලදියතුල පෙණෙනා පැගැස ර
රලවූ ල් සසල රිවි සඳමඩල හැමව ර
නුඹුතු ල් පවුරසිස පැනායනුබැරිව හැ ර
රහස ල් පිවිස හැමවර යනුවැනි මිතු ර

15 සුවිසල්, ඉතාවිශාලවූ; අගලදියතුල, පරිඛාජලාභ්‍යන්තරයෙහි; රලවුල්, ආකූලතරඞ්ගයන් කාරණකොට ගෙණ; ඇමවර, සැමකල්හි; සසල, චඤ්චලවූ; මනහර, මනොහරවූ; පැහැසරරිවිසඳමඩල, ප්‍රභාසාර සූර්‍ය්‍යචන්ද්‍රමණ්ඩල පුන්මය; (කෙසේද) නුඹු, උන්නතවූ; තුල්පවුරසිස, මහත්වූ ප්‍රකාරශීර්ෂය; පැන, ලඞ්ඝනයකොට; යනුබැරිව, යානොහී; හැර, හැරදමා; මිතුර, මිත්‍රය; රහසල්පිවිස, රසාතලයට පැමින; ඇමවර, සැමකල්හි; යනුවැනි, ගමනයකරන්නාක්වැන්න.

16 ස ඳ රිවි නමුණ් රහුමුව පත්වූ සඳෙ හි
බි ඳ ගනඅඳුර එළිකාරනුව රෑ දෙවෙ හි
බැ ඳ සිනකිණපට ගියමෙන් පහඅගෙ හි
සො ඳ රන්රිදී දද බබලයි පුරවරෙ හි

16 සඳ රිවි, චන්ද්‍රයා හා සූර්‍ය්‍යා; රහුමුවපත්වූසඳෙහි, රාහුමුඛප්‍රවෙශවූකල; ගනඅඳුර, ඝනාන්ධකාරය; බිඳ, භග්නකොට හෝ පහකොට; රෑ දෙවෙහි, රාත්‍රියෙහිහා දිවාභාගයෙහි; එළිකරනුව, හෙළිකරනුසඳහා; සියකිරණපට; ස්වකීයරශ්මිපටලය; පහඅගෙහි, ප්‍රාසාදාග්‍රයෙහි; බැඳගියමෙන්, බන්ධනයකොට ගියාසේ; සොඳ, සිත්කලුවූ; රන්රිදී දද, ස්වර්ණ රජත ධ්වජයන්; පුරවරෙහි, නගරවරයහි; බබලයි, භ්‍රාජමානවේ.

17 හයකුරගසින් නැගි රෙදෙසින් හිවි අඹර
ගජකන්තලින් එන පවනින් යුත් මෙපුර
කෙළිසන්තොසින් රැඳි සලෙලුන්හට නිතොර
සැඩකරරසින් සැඩයිමනින් දුක් කවර.

17 හය, අශ්වයන්ගේ; කුරගසින්, ඛුරඝට්ටනයෙන්; හිවි, උස්ව; අඹර, ආකාශයට; නැගි, උද්ගතවූ; රෙදෙසින්, රජසින් යුක්තවූ; ගජ, හස්තීන්ගේ; කන්තලින්, කර්ණතාලයෙන්; එන, හමනාවූ; පවනින්යුත්, මාරුතයෙන් යුක්තවූ; මෙපුර, මේ නගරයෙහි; කෙළිසන්තොසින් රැඳි, ක්‍රීඩාසන්තොෂයෙන් රඤ්ජිතවූ; සලෙලුන්හට, සල්ලාල ජනයාහට; සැඩකරරසින්, චණ්ඩකිරණයාගේ රශ්මීයෙන් හා; සැඩයිමනින්, චණ්ඩ ග්‍රීෂ්මයෙන්; කවරදුක්, කිනම් දුකෙක්ද ? නැත්තේමැයි සේයි,

18 අගිල් කපුරු දුම්කඳ පැතිර පිහිකුළු
විපුල් මෙපුර රන්දෙදෙනුදුල පහකුළු
ලකල් සුරඹ සිදුලිය කෙළි සිරසකුළු
සියල් හිමවිගිරිකුළු සිරි පැයි ලකුළු

18 අගිල්කපුරුදුම්කඳ, අගරු කර්පූර ධූමරාශීයගේ; පැතිර, විස්තීර්ණයෙන්; පිහිකුළු, ප්‍රතිච්ඡන්නවූ; විපුල්, මහත්වූ; මෙපුර, මේනගරයෙහි; රන්දෙදෙන්, ස්වර්ණධ්වජයන්ගෙන්; උදුල, උජ්ජ්වලිතවූ; පහකුළු, ප්‍රාසාදකූටයෝ; ලකල්, අලඞ්කෘතවූ; සුරඹසිදුලිය, දිව්‍යාප්සරාවන් හා සිද්ධාඞ්ගනාවන්ගේ; කෙළි, ක්‍රීඩායෙන් යුක්තවූ; කුළුසිරස, කූටමස්තකඇති; ලකුළු, අලඞ්කෘතවූ; සියල්හිමවිගිරිකුළු, සකල හිමාලපර්වතකූටයන්ගේ; සිරිපැයි, ශ්‍රීභාව දැක්වූහු.

19 මෙපුර පහය දිලි රන්කැරලි විසවි ති
පැතිර ලෙළැඟි රෙන්පළු හයකුරගයි ති
අඹර ඇඹි දදන් පිස යනු කෙවැ ති
නිතර කොඳුරැ ගුරැපිරියම් කරණෑවැ ති

19 මෙපුර, මේ නගරයෙහි; පහග, ප්‍රාසාදශෘඞ්ගයෙහි; දිලි, ජ්වලිතවූ; රන්කැරලි, ස්වර්ණශෘඞ්ගයන්; වසමිනි, ප්‍රතිව්‍යඤ්ජනාකරෙමින්; හයකුරගසිනි, අශ්වයන්ගේ ඛුරඝර්ෂණයෙන්; පැතිර, විස්තීර්ණවූ; උලැගි, උල්ලඞ්ඝිතවූ; රෙණ්පට, ධූලිපටලය; අඹර, ආකාශයෙහි; ඇඹිරි, ආවෘතතව; දදනින්, ධ්වජනාමැති හස්තයෙන්; පිස, ප්‍රොඤ්ඡනකොට; සනු, සනෙන්; කෙවැනි, කෙසේද? (යත හොත්) නිතොර, නිරන්තරයෙන්; සොඳුරු, සුන්දරවූ; ගුරුපිරියම්කරණවැනි; ගෛරිකපරිකර්මකරනාක් මෙනි.

20 සොබ   න නොයෙකපැහැ මිණිබිතිනි මනහ
පෙණෙන උදයදිවයුරුමඬල පැහැස   ර
රඳ   න මෙපුරවර කුලඟන මුවතඹ   ර
බල   න වැනිය වැදවැද සිට මැදුරු තු   ර

20 සොබන, ශොභනවූ; නොයෙකපැහැ, අනෙකප්‍රභාවෙන්; මනහර, සිත්ගන්නා; මිණිබිතිනි, මාණික්‍යභිත්තියෙන්; පෙණෙන, දෘශ්‍යමානවූ; පැහැසර, ප්‍රභාස්වරවූ; උදයදිවයුරුමඬල, උදයස්ථ සූර්‍ය්‍යමණ්ඩලය; (කෙසේද) මැඳුරුතුර, මන්දිරාභ්‍යන්තරයෙහි; වැදවැද සිට, වැදෙමින්සිට; මෙපුරවර, මේ නගරවරයෙහි; රඳන, රඳන්නාවූ; කුලඟන, කුලාඞ්ගනාවන්ගේ; මුවතඹර, මුඛතාමරසයන්; බලනවැනිය, අවලොකනයකරනාක්වැනාන.

21 සිය   ල් සිරින් පිරි මෙපු පහකැරලි අ   ග
තුමු   ල් සුනිල් මිණිපැහැ පැතිර සුරම   ග
අස   ල් වෙමින් රිවි සඳුහට ළලඟ ර   ග
සෙවෙල්   ලෙසින් දිසිවිය ගොස් අහස්ග   ග

21 සියල්සිරින්, සකලශ්‍රීන්; පිරි, පූර්ණවූ; තුමුල්, විශාලවූ; මෙපු, මේ පුරයෙහි; පහකැරලිඅග, ප්‍රාසාදශෘඞ්ගාග්‍රයන්ගේ; සුනිල්, අතිනීලවූ; මිණිපැහැ, මාණික්‍ය

ප්‍රභාව, සුරමග, අහස්හි; පැතිර; ගලාගොස්; රිවිසඳුහ
ට, සූය්‍ර්‍යචන්ද්‍ර දෙදෙනාට; පළගරග, අසුරෙන්ද්‍රයාගෙසි
න්; අසල්වෙමින්, සමීපවෙමින්; ගොස්, ගමනයකොට;
අහස්ගඟ, සවර්ණ්ණදියෙහි; සෙවෙල්ලෙසින්, ශෛවාල
යන්මෙන්; දිසිවිය, දෘශ්‍යමානවී.

22 තනා පබලුමුතු මිණි අබරණ පැල ඳ
පිනා සඳලුවල සිටි පුරගණෝ ල ද
මනා ලපලු පත් මල් පල ගෙණ නොම ද
කානා ලියන් වැනි රැඳි රන්ගිරි බෙය ද

22 පබලුමුතුමිණි, ප්‍රවාල මුක්තා මාණික්‍යයන් සම්බ
න්ධවූ, අබරණ, ආභරණයන්; තනාපැලඳ, බහා පැලඳ
ගෙණ, පිනා, පීනනයවැ; සඳලුවල, චන්ද්‍රිකාතලයන්හි;
සිටි, සිටියාවූ; ලදපුරඟණෝ, තරුණ පුරඞ්ගනාවෝ;
(කෙසේද) මනා, සිත්කළුවූ; ලපලු, බාලපල්ලවයන්හා;
පත්, පත්‍රයන්ද; මල්, පුෂ්පයන්ද; නොමද, බොහෝවූ; ප
ල, ඵලයන්ද; ගෙණ, හටගන්නාලදින්; රන්ගිරි, සව
ර්ණ්ණ පර්වතයන්ගේ; බෙයද, නිම්නස්ථානයෙහි; රැඳි, ර
ජමානවූ; කනාලියන්වැනි, කනකලතාවන් මැන්නාහ.

23 පියකරු තෙනෙන් පැරදි පිවිසි වනවි ල
පිවිතුරු හසුන් එනලෙස යළි ගෙදිගුවි ල
විසිතුරු මෙපුරවර අඟනෝ වෙමින් ලො ල
පියසුරු පටින් බැඳ වසතැයි සිතේ බ ල

23 පියකරු, ප්‍රියඞ්කරවූ; තෙනෙන්, පයොධරයෙන්;
පැරදි, පරාජිතව; වනවිල, වනතටාකයට; පිවිසි, ප්‍රවිෂ්ට
වූ; පිවිතුරු හසුන්, සෙවන හංසයන් හෝ රාජහංසයන්;
යළි, නැවත; ගෙදිගුවිල, ගෘහදීර්ඝිකාතටාකයට; එන
ලෙස, ආගමනය පිණිස; විසිතුරු, විචිත්‍රවූ; මෙපුරවර,
මේ පුරප්‍රවරයෙහි; අඟනෝ, අඞ්ගනාවෝ; ලොලවෙමි
න්, ලුබ්ධවෙමින්; පියසුරු, පයොධරයන්; පටින්, පටපිලි
යෙන් හෙවත් පයොධරපටවයෙන්; බැඳ, බන්ධනයකො

ට; වසනැයිසිතේ, වසත්යයි හැගේ; බල, (මේ ආශ්චර්ය ය) අවලෝකනයකර,

24 ක ලා සපිරි සිසි වත මනක ලා ව න්
නි ලා තිබෙන බැම ඉඳුදුනුපි ලා ව න්
දු ලා තනන තන රණහසපි ලා ව න්
බ ලා පියැද යනුබැරි පුරක ලා ව න්

24 කලාසපිරි, (ෂොඩශ) කලාසම්පූර්ණවූ; සිසි, චන්ද්‍රයාබඳුවූ; මනකලාවන්, මනොඥවූ; වත, වක්ත්‍රඇති; ඉඳුදුනුපිලාවන්, ඉන්ද්‍රචාප පාලින්සේ; නිලාතිබෙන, නීලාසමානවූ; බැම, භ්‍රෑයුගමඇති; රණහසපිලාවන්, සුවර්ණ හංසපොතකයන් බඳු; දුලා, දෙබලව; තනන, වැඩෙන්නාවූ; (හෝ කම්පාවනනාවූ) තන, පයොධරඇති; පුර කලාවන්, පුරස්ත්‍රීන්; බලා, නිරීක්ෂණයකොට; පියැද, පාදය ආකර්ෂණයකොට; යනුබැරි, ගමන දුෂ්කරයෙකි.

25 රෙ ද ක් ක ණ අලක මුතුපට ගොතා බැ ඳ
ස ඳෙ ක් * බඳු උවන මදහස යොදා නා ද
ම ද ක් මතුමහල සිටි එලි පෙණී සො ඳ
උ ද ක් සුරගනන්වැනි පුරගනෝ ල ද

25 කණඅක්, කර්ණාන්තයෙහි; අලකරෙද, කියඹුරු ජිය; මුතුපට, මුක්තාපට්ටයෙන්; ගොතා, ග්‍රන්ථනයකොට; බැඳ, බැඳලා; සඳෙක්බඳු, චන්ද්‍රයාහාඑකබන්ධුවූ; උවන, වක්ත්‍රය; නද, ආනන්දකරවූ; මදහස, මන්දස්මිතය; යොදා, යුක්තකොට; මදක්, අඩියක්; එලිපෙණී, බැහැරවපෙණී; මතුමහල, උඩුමහල්හි; සිටි; ස්ථිතවූ; සොඳ, සුන්දරවූ; ලදපුරගනෝ, තරුණ පුරාඞ්ගනාවෝ; උදක්, ඒකාන්තයෙන්; සුරගණන්වැනි, දිව්‍යපසරාවන්වැන්නාහ.

26 වෙ ර ල ඉගිල තුල රලවැල ලෙස උලෙ ල
නෑ බ ල පටලපෙළ ලෙලවමිනි කෙළකෙ ළ
ක ර ල කෙරල මොලබල දළදප පහ ළ
පු ව ළ සිහලබළමුලු බල නිති ඔස ළ

* සඳක්-පොත්.

26 වෙරල, වෙලාතටය; ඉහිල, උල්ලඞ්ඝනයකොට; උතුරු, උත්තරිතවූ; උලෙල, චචලවූ; රලවැලලෙස, තරඞ්ගපඞ්ක්තිසේ; නැබල, මහත්වූ; පටලපෙළ, පලග පඞ්ක්තිය; ලෙලවමිනි, ලීලොපෙතකරමින්; කෙළෙකෙළ, ක්‍රීඩාකොට කොට; කරලකොරල, කාරලකොරලයන්ගේ; මොල, චණ්ඩවූ; බරු, ශක්තියහා; දළදප, දෘඪවූ එඩිය; පහල, ශෞර්‍ය්‍ය; පුවල, ප්‍රෞඪවූ; නිති, නිරන්තරයෙන්; ඔසල, කැපීවූ හෝ උසස්වූ; සිහලබළමුලු, සිංහල භටසමූහයා; බල, අවලොකනයකර.

27 මහසෙන් විකුම්සර- මහසෙන් නිතොර රදනා
වෙසෙසින්සියල්ඉසුරෙන්-පිරිසක්පුරවිමෙපුරේ

27 මහසෙන්, මහාසෙනයාසේ; විකුම්සර, වික්‍රමසාරවූ; මහසෙන්, මහාසෙනාවෙන්; නිතොර, අනවරතයෙන්; රඳනා, හෙබියාවූ; වෙසෙසින්, විශෙෂයෙන්; සියල් ඉසුරෙන් පිරි, සකලෛශ්වර්‍ය්‍යයෙන් පූර්ණවූ; සක්පුරඑව්, ශක්‍රපුරය බඳුවූ; මෙපුරේ, මේ නගරයෙහි,

28 පවර ඉසුරු පරසිදු ද ම්බා විරි ඳු
වීරිඳු නිරිඳු මතඟජ කු ම්බා මිගි ඳු
සතත සුසිරි නය නොකල ම්බා පුරු ඳු
වැජඹි සොඳුරු සිරිපැරකු ම්බා නිරි ඳු

28 පවර, උතුම්වූ; දඹබාවිරිඳු, ශත්‍රුයාසේ; ඉසුරැ, ඓශ්වර්‍ය්‍යයෙන්; පරසිදු, ප්‍රසිද්ධවූ; විරිඳුනිරිඳු, වෛරීනරේන්ද්‍රනමැති; මතනජකුඹබා, මත්තහස්තීන්ගේ කුම්භයට; මිනිඳු, කෙසරයෙක් බඳුවූ; සතත, නිරන්තරයෙන්; සුසිරිනය, සුචරිතයහා නීතිය; නොකලඹබා, හෙදනොකොට; පුරුදු, භාවිතාකරන්නාවූ; සොඳුරු, සුන්දරවූ; සිරිපැරකුඹබා නිරිඳු, ශ්‍රීපරාක්‍රමබාහු නරශ්‍රෙෂ්ඨතෙමේ; වැජඹි, විජෘම්භමානවී.

තවද මේ නිජ භුජ බලපරාක්‍රාන්ත පරරාජචක්‍ර වික්‍රම ප්‍රසස්ත භුවක්‍ර චක්‍රවර්ති ශ්‍රී පරාක්‍රමබාහු මහා

රාජෝත්තමයාගේ සඞ්ක්‍රම වික්‍රමාභික්‍රම ප්‍රදාන කී ර්ත්‍යාදි ගුණෞඝෛකදේශයන් ශ්‍රවණයකර.

යලිත් ශෞර්‍ය්‍ය බාහුබලයෙන් අනුන් මඩනා ශත්‍රුරාජ සමූහයෙහිදී වික්‍රමයෙන් පසස්නාලද, භුවනවලයෙහි ප්‍ර ඛ්‍යාතවූ මේ ශ්‍රීපරාක්‍රමබාහු ධරණීශ්වරයා සම්බන්ධවූ දාන කීර්ති ආදි ගුණයන් අසව.

29 මෙර ද ගුණෙනන් සවිසත සිත් සැනැහැ වී ය
නිබ ද දෙනෙනන් සිතුමිණකැයි ඇහැහැ වී ය
නොමද බෙලෙන් පෑ ලොව බලදෙව් හ වී ය
දුහ ද ර දු න් කගදලදරිනි නැහැ වි ය

29 මෙරද, මේ නරේන්ද්‍රතෙමේ; ගුණෙන්, (මනා) ගුණයෙන්; සවිසත, සකල සත්ත්වයන්ගේ; සිත්, චිත්තය; සැනැහැවිය, නැලවීය; නිබද, නොරතුවූ; දෙනෙන්, ප රිත්‍යාගයෙන්; සිතුමිණකැයී, චින්තාමාණික්‍යයකැයි; ඇහැහැවිය, සංඥකරවීය; නොමදබෙලෙන්, අමන්ද ශක්තියෙන්; බලදෙව්හවිය, බලභද්‍රයාගේ ස්වභාව; ලො ව, ලොකයෙහි; පෑ, ප්‍රකාශකොට; දුහදරදුන්, සතු රා ජයන්; කගදලදරිනි, ඛඩ්ගලක්ෂණ මේඝයෙන්; නැහැ විය, නාශකරවිය.

30 සත සි ත රැදි නිමල්ගුණ පසිඳු විකුමැ ති
සිරිකා න සිරිකමල්වැනි මෙනිරිඳුගෙ නි ති
තෙදිය ත දිව සියල් පාද තෙදග නොනැව ති
රුපූක ත තෙනසිලිල් සිඳුතෙර වැද නැව ති

30 සතසිත, සත්ත්වයන්ගේ සිත්හි; රැඳි, රජිතවූ; නිම ල්ගුණ, නිර්මල ගුණයෙන්හා; පසිඳු, ප්‍රසිද්ධවූ; විකුමැති, වික්‍රමයෙන් යුක්තවූ; සිරිකත, ශ්‍රීකාන්තාවගේ; නිති, නි රන්තරවූ හෙවත් වෙන්නොවන්නාවූ; සිරිකමල්වැනි, උතුම් පද්මයක්බඳුවූ; මෙනිරිඳුගෙ, මේ නරෙන්ද්‍රයාගේ; තද, දෘඪවූ; තෙදග, තේජෝලක්ෂණ ගින්නතෙමේ; සිය ල්තෙදියත, මුළුතුන්ලොව; දිව, ධාවනයකොට; නො

නැවති, විශ්‍රාමයගෙනකොට; රුපුකත, සතෲවිශීතාවන්ගේ; ගෙනසිලිල්, ගෙනසලිල නම්වූ; සිදුහොර, සමුද්‍රතීරයෙහි; වැද, ගැසී; නැවති, නිවෘතවිය.

31 මෙරද රුපුන් කරපා වැජඹි තෙදිය තා
සගුණ මගල් සිවුපා සිවු බිතින් යු තා
දසරදදම් මිණිපා ගෙදන මැදුර තා
සතත සතන් සතපා කෙරෙය සුබසෙ තා

31 තෙදියත, ජගත්‍රයෙහි; වැජඹි, විජෘම්භිතවූ; මෙරරද, මේ නරේශ්වරයා; රුපුන්, සතෲන්; පාකර, පාගකොට; සගුණ, (සන්ධිවිග්‍රහාදි) ෂඩ්ගුණනම්වූ; මගල්, මාංගල්‍යඇති; සිවුපා; (සාම දාන භේද දණ්ඩසඞ්ඛ්‍යාත) චතුරෝපාය නැමති; සිවුබිතින්යුත, චතුර්භිත්තීන්ගෙන් යුක්තවූ; දසරදදම්, දසවැදෑරුම්වූ රාජධර්ම නැමති; මිණිපා, මාණික්‍ය ප්‍රාකාරඇති; තද, සම්බන්ධවූ; අන, ආඥා නැමති; මැදුරත, මන්දිරාභ්‍යන්තරයෙහි; සතත, නිරන්තරයෙන්, සතන්, සත්ත්වයන්; සතපා, සන්තර්පනයකොට; සුබසෙතකෙරෙය; සුඛපත් සාන්තිකරයි.

32 පසි ඳු මොහුගෙ දුල දන් දලදර පබ ද
දිළි ඳු සිතෙහි කලිමල් දෙව්යේ මතු ද
කිවිඳු වදන්බිම බැබලුම්කර නිබ ද
සිනිඳු යසස්ලිය සුනුබුල් කෙළෙ නොම ද

32 පසිඳු, ප්‍රසිද්ධවූ; මොහුගෙ, මේ නරේන්ද්‍රයාගේ; දුල, ජ්වලිතවූ; පබද, අවිච්ඡින්නවූ; දන්දලදර, දානලක්ෂණමේඝයා විසින්; දිළිඳුසිතෙහි, දරිද්‍රයන්ගේ චිත්තයෙහි; කලිමල්, දුඃඛ නැමති මලය; දෙව්යේ, දෙවනාලද්දේය; එමතුද, එපමණක්ද නොවෙයි; කිවිඳු, කවීන්ද්‍රයන්ගේ; වදන්බිම, වාග්භූමිය; නිබද, නිතොර; බැබලුම්කර, භ්‍රාජමානකොට; සිනිඳු, සනිග්ධවූ; යසස්ලිය, කීර්ති නැමති ලතාව; නොමද සුනුබුල්කෙළෙ, ඉතා පුෂ්පිතකෙළේය.

33 සක ත අසුරැ පැරකුම්නිරිඳුගෙ පව ර
සම ත විපුල්බල සිවුරඟසෙන් ලත ර
දිග ත පැමිණ කොද නොපහළ රුපු නුව ර
යුග ත සයුර රළ නොපතළ තැන් කව ර

33 සකතඅසුරැ, ච සුදෙවයා බඳුවූ; පවර, උතුම්වූ; පැරකුම්නිරිඳුගෙ, පරාක්‍රමබාහු නරෙන්ද්‍රයාගේ; සමත, දක්‍ෂවූ; විපුල්, මහත්වූ; ලතරසිව්රඟසෙන්, තරුණතර චතුරඞ්ගිනී සේනාතොමෝ; දිගත, දිගාන්තයෙහි; පැමිණ, ප්‍රාප්තව; රුපු, සතුරන්; නොපහළ, පහරණු නොලද්දාවූ; නුවර, නගරයෙක්; කොද; කොහිද; (ඒ කෙසේදයත්) යුගතසයුර, කල්පාන්ත සාගරයාගේ; රළ, තරඞ්ගයන්; නොපතළතැන්, පැතිර නොගියාවූ ස්ථානය; කවර, කොතැනද.

34 සොරක ම් කර රැගෙණ වෙනවෙන වෙස්රැදු
සුරැක ම් කළ පොරණ දියබඳහු නරතු රැ
පැරකු ම් පෑ නොයෙක්එකවෙසසිට සොඳුරැ
පැරකු ම් රජුට සරියයි පවසති කවු රැ

34 රුදුරු, රෞද්‍රවූ; වෙනවෙනවෙස්, (එකිනෙකට විශෙෂවූ) නොයෙක් වෙශයන්; සොරකම්කර, චෞර කර්මකොට; රැගෙණ, ඇරගෙණ; පොරණ, පුරාතන මැති; නරතුරු, නිරන්තරයෙන්; සුරැකම්කළ, ශූරකර්ම කළාවූ; දියබඳහු, උපේන්ද්‍රයා; එකවෙසසිට, එක් ස්වභාවෙන් හිඳ; නොයෙක් පැරකුම්පෑ, අනෙක පරාක්‍රමයන් දැක්වූ; සොඳුරු, යහපත්වූ; පැරකුම්රජුට, පරාක්‍රමබාහු නරෙන්ද්‍රයාට; සරියයි, සමානයයි; කවුරු, කිනම් කෙනෙක්; පවසති, ප්‍රකාශකරත්ද; නොකරත්මැයි සේයි.

35 දෙසි න් දෑසම දිසි යසසට මෙනරනි ඳු
අ සි න් අසක්වත් සරිමෙව්නම් තරි ඳු
ඇ සි න් ඇස පෙණෙන ලොව හැමට එකබඳු
ම සි න් මසට කුමකට අඩුවේද ඉ ඳු

35 මෙනරනිඳු, මේ නරශ්‍රේෂ්ඨයාගේ; දෙසින්දෙසම්, දේශයෙන් දේශයම; දිසි, දෘශ්‍යවූ; යසසට, කීර්තියගේ; අසින්අසක්වත්, අංශුයෙන් අංශුවකටවත්, තරිඳු, චන්ද්‍රයා; සරිවේනම්, සමානවේනම්; ලොවහැමට, සියලු ලෝකයාටම; එකබිඳු, එකාකාරම; ඇසින්ඇස, අක්ෂියෙන් අක්ෂිය; පෙණෙන, දෘශ්‍යමානවනනාවූ; ඉඳු, (ඒ) නිශාකරයා; මසින්මසට, මාසයෙන්මාසයට; කුම්කට; කුමක් පිණිස; අඩුවේද, ඌනවේද.

36 ලඳුන් සිනිඳු කොමලත වැලඳි සිසිල සේ
නඳුන් මෙහිමි සොඳබඳ රඳන ගුණරු සේ
තුඳුන් අතුර උරගුන් දරණකල තොසේ
සඳුන් තුරෙක සරියයි කියමෝද කෙසේ

36 ලඳුන්, කාන්තාවන්ගේ; සිනිඳුකොමලත, ස්නිග්ධ කෝමල හස්තයෙනි; වැලඳි, වැලඳියාවූ; සිසිලසේ, සීතලයක්බඳුවූ; සොඳ, සුන්දරවූ; ගුණරුසේ, ගුණසමූහයෙන්; රඳන, රඳනාලද; නඳුන්, නන්දනීයවූ; මෙහිමි, මේරාජයාගේ; බඳ, ශරීරය; අතුරතුඳුන්, අතුරැරනිතව හෙවත් අතුරක්නැතිව; උරගුන්, ආශිර්විෂයන් විසින්; තොසේ, තෝෂයෙන්; දරණකල, භෝගාවලිකලාවූ; සඳුන්තුර, චන්දනවෘක්ෂයා; එකසරියයි, එකාකාරයයි, කෙසේ, කවර පරිද්දෙකින්; කියමෝද, කථනයකරමුද.

37 සුරතුරු අසුරු අතු අත රැඳි කනාලිය
නරතුරු සිටිනා රූසිරිසර මනාලිය
පියකරු මෙරද රුසිරෙන් මඳ දිනාලිය
සුරගුරු අවද ඉඳුන් නොම හැකිවණාලිය

37 නරතුරු, නිරන්තරයෙන්; අත, සමීපයෙහි; සිටිනා, සිටිනානාවූ; රූසිරිසර, රූපශ්‍රීන්සාරවූ; මනාලිය, සුන්දරාඞ්ගනාවන්කරණකොට; අතු, ශාඛාවන්හි; රැඳි, රජිතවූ; කනාලිය, හෙමලතාවන්ඇති; සුරතුරුඅසුරු, කල්පද්‍රුමයක්බඳුවූ; පියකරු, ප්‍රියඞ්කරවූ; මෙරද, මේධාරණී

සවරතෙමේ; රුසිරෙන්, රුචිරයෙන්; මද, කඳුළීසා; දිනාලිය, ජයගණෙන්ය-ඉන්, එහෙයින්; සුරගුරු, වෘහස්පතියා, අවද, ආයේද, වණ්ප්‍රියනොමහැකි, වණ්ණනාකොටලිය නොහැකෙක්ස.

38 මෙනිරිඳු මෙවන් ගුණ-මිණිරැස් අද නදන්හි
කොරෙමින්නදන්සි-අස්නොවිහිඳ අදරඅසින්

38 මෙනිරිඳු, මිනරෙන්ද්‍රයාගේ; මෙවන්ගුණමිණිරැස්, මෙබඳු ගුණනැමති මාණික්‍යරාශීන්; අදනදන්හි, ශුද්ධලක්ෂණ නිධානයෙහි; අස්, අභ්‍යන්තර; නොවිහිඳ, නොහැරම; සි, සක්තියෙන්; අදරඅදසින්; ආදරාධ්‍යාසයෙන්; නදන්කෙරෙමින්, නිධානකෙරෙමින්.

39 සුරගඟ තරඟවැල-මැද වන් සුපුන්සඳ රඟ
බඳසෙල් වියන්සට වට මුතුලැලින් යෙ දු
මනකල් නිමල් දළපුඩුසෙස්සතින් රැ දු
ඈමකල් දිලි විමල්-හරසෙල් සදිසි සිහසන
ස රා උදයඳිවිසුරු විලස නුබගැ බේ
ස රා ගිරණකිරණින් එකාලෝකාර ස බේ
ර න් මිණිවලලු නාදදෙන කොමලතින් ල ඳ
දු න් සුදු සිනිඳු චිල් දුනාසවන් වි ඳ
නා න් සුරසෙනඟමැද වන් සුරනිඳුසෙ නා ඳ
ළ න් සඳ පවර සිරිපැරකුම්නිරිඳුස ඳ

39 සුරගඟ, ස්වර්ගඞ්ගායෙහි; තරඟවැලමැද, තරඞ්ගාවලී මධ්‍යයට; වන්, පැමිණාවූ; සුපුන්සඳරඟ, සම්පූර්ණ චන්ද්‍රයාසේ; බද, බන්ධනයකරණලද; සෙල්වියන්සට; සේවන(වස්ත්‍ර)විතානඅධෝභාගයෙහි; වට, සිසාරා; යෙදූ, යොජිත කරණලද; මුතුලැලින්, මුක්තාලතිකාවන්ගෙන් යුක්තවූ; මනකල්, සිත්කළුවූ; නිමල්, නිර්මලවූ; දළපුඩුසෙස්සතින්, දළකඩමුවාපිඩශෙවතඡත්‍රයෙන්; රැඳු, රජිතකළාවූ-ඈමල්, සැමකල්හි; දිලි, දීප්තිවූ; විමල්, නිර්මලවූ; හරසෙල්සදිසි, කෛලාසපර්වතයබඳුවූ; සිහසන,

සිංහාසනයෙහි-සරත්තුඹගැබේ, සරදෘකාශගර්භයෙහි; උදසඳිවයුරැව්ලෙස, උදෘසූර්‍ය්‍යාසේ; සරා, ෂඩ්වර්ණ රශ්මි ඇති; අබරණකිරණින්, ආභරණකාන්තියෙන්; සබේ, සභාව; එකලුකර, ඒකාලෝක කොට; (එනිරිඳුගී වාක්‍යශෙෂයි)-නදදෙන, නාද පවත්වන්නාවූ; රන් මිණිවළලු, ස්වර්ණමාණික්‍ය වලයාභරණ ඇති; කොමලතින්, සුකුමාලහස්තයෙන් යුක්තාවූ; ලඳ, කාන්තාවන් විසින්; දුන්, දෙනලද; සිනිඳු, සනිඹවූ; සුදුවල්විදුනාපවන්, ශුභ්‍රවාලව්‍යජනීමාරුතය; විඳ, ලැබ; නන්සුරසෙනගමැද, නානාදිව්‍යසෙනාමධ්‍යයෙහි; උන්, හුන්නාවූ; සුරනිඳුසෙ, ශක්‍රයාසේ; නද, නන්දනීයවූ; පවර, ප්‍රවරවූ; සිරිපැරකුම් නිරිඳුසඳ, ශ්‍රීපරාක්‍රමබාහු නරෙන්ද්‍රොත්තමයා; උන්සඳ, උන්කල්හි.

40 සුර ඹ ලෙ සින් දන මන නෙත් ඇද වෙත
සල ඹ ගො සින් රණහසරැව් නිසරු කො ට
නළ ඹ තො සින් දෙන රැඟුමට පළමු කොට
මෙනුඹ ගො සින් වැද එනිරිඳු සබ මැද ට

40 සුරඹලෙසින්, අප්සරාවන්සේ; දන, ජනයාගේ; මනනෙත්, මනොනෙත්‍රයන්; වෙතට, (තමන්) සමීපයට, ඇද, ආකර්ෂණය කොට; සලඹගොසින්, නූපුරධ්වනියෙන්; රණහසරැව්, ස්වර්ණ හංසයන්ගේ රාවය; නිසරු කොට, නිස්සාර කොට; නළඹ, නාටිකාවන් විසින්; දෙන, පවත්වනලද; රැඟුමට, නෘත්‍යයට; පළමුකොට, ප්‍රථමයෙන්; මෙනුඹ, මේ යුෂ්මත්තෙමේ; ගොසින්, ගමනයකොට; එනිරිඳු, ඒ නරේශ්වරයාගේ, සබමැදට, සභාමධ්‍යයට; වැද, ප්‍රවිෂ්ටව.

41 සුබ ද සියල් සිවුවේ දැන පිවි තුරැව
පැල ද කසුන්හු අබරණ විසි තුරැව
තොමද පෙරවිපෙමුණන් සට හිර තුරැව
එස ද කියන ජයතුතිනද අන තුරැව

41 සියල්සුබද, සකල ශබ්දබන්ධනයන්හා; සිවුවේ,
(ඍක් සාමආදි) චතුර්වේදයන්; පිවිතුරුව, පවිත්‍රව හෙ
සැකනැතිව; දැන, ජානනයකොට; කසුන්නූ, කාඤ්චන
ජපසූනුහා; අබරණ, ආභරණයන්; පැලඳ, පැලඳ
ගෙණ; විසිතුරුව, විචිත්‍රව; නොමඳ, බොහෝවූ; පෙර
වි බමුණන්, පුරෝහිත බ්‍රාහමණයන් විසින්; සිට, (අභි
මුඛයෙහි) සිටගෙණ; නිරතුරුව, අතුරුරහිතව; එස
ඳ, එසමයෙහි; කියන, කථනයකරනනාවූ; ජයතුතිනද,
ජයසෙත්‍රානු නාදයට; අනතුරුව, ඉක්බිතිව.

42 ඉ ගෙ ණ අදිකරණ දැන රදනිය නොයෙකා
නි ති න පෙමින් මුළුසත්වග රකිනල කා
එ දි න පැමිනි කටයුතු දන්වා නිස කා
සි ටි න දෙපස හැම මහමැතිවරන් දූ කා

42 නොයෙකරදනිය, අනෙක රාජනීති; දැන, ජාන
නයකොට; අදිකරණ, නඩුවිනිශ්චය, ඉගෙණ, උද්ග්‍ර
හණයකොට; නිතින, නිරන්තරයෙන්; ලක, ලඞ්කා
වෙහි; මුළුසත්වග, සමස්තසත්වවර්ගයා; පෙමින, ප්‍රෙම
යෙන්; රකින, රක්ෂාකරනනාවූ;–එදින, ඒ දවස්හි;
පැමිනි, පැමිනියාවූ; කටයුතු, කතීව්‍යයන්; නිසක, නි
ශ්ශඞ්කාව; දන්වා, (රජුට) සැලකොට; දෙපස, උභයපා
ර්ශ්වයෙහි; සිටින, සිටින්නාවූ; හැම්මහමැතිවරන්, සි
ලූ මහමන්ත්‍රිවරයන්, දූක, දර්ශනයකොට.

43 මු ද ලි ඳු බෙ යඳ මුල සැඩනෙලෙහි ඇමක ලා
වැඳ වැඳ උලැඟිවන සිඳුතරඟ සිරිසූ ලා
ර ද ප ද තඹුරු කිරුළග මිණිරැසින් ග ලා
වැදූ වැදූ නැගෙණ පිරිවරනරනිඳුන් බ ලා

43 ඇමකලා, සැමකල්හි; සැඩනෙලෙහි, චණ්ඩමාරු
තයෙන්; මුදලිඳුබෙයඳමුල, මෙරුමූලයෙහි; වැදවැ
ද, හැපෙමින්; උලැඟිවන, උලඞ්ඝනයවන්නාවූ; සිඳුත

රඟ, සමුද්‍රතරඞ්ගයන්ගේ; සිරි, සොභාව; උසුලා, දරා; රද, රජ්ජාගේ; පදතඹුරු, පාදනැමති තාමරසය; කිරුළගමිණිරසින්, සිඛාමාණික්‍යරශ්මියෙන්; ගලා, නිමගනකොට; වැඳවැද, වඳිමින්; නැගෙණ, උපෙක්‍ෂණාවභානාවූ; පිරිවර නරනිඳුන්, පරිවාර නරෙන්ද්‍රයන්; බලා, අවලොකනයකොට.

44 දෙසතුරු ඉසුරු නිරිඳුන් පියඳු ලක ලී
විසිතුරු මහරු මිණි මුතු පට රන් පබ ලී
පිවිතුරු කපුරු කස්තුරු නිසි කසිස ලී
පියකරු පඬුරු නරනිඳුහට පෑ පැසු ලී

44 ලකුලු, අලඞ්කෘතවූ; දෙසතුරුඉසුරු, දෙශාන්ත ර ඊශ්වරවූ; නිරිඳුන්පියඳු, නරෙන්ද්‍රයන් විසින් එවනලද; විසිතුරු, විචිත්‍රවූ; මහරු, මහාර්ඝවූ; මිණි, මාණික්‍යය; මුතු, මුක්තාය; පට, පටවස්ත්‍රය; රන්, සුවර්ණය; පබලු, ප්‍රවාලය; පිවිතුරු, පවිත්‍රවූ; කපුරු, කර්පූරය; කස්තුරු, මුවනැබය; නිසි, (හැඳීම් පෙරවීමට) යොග්‍යවූ; කසිසළි, කාශිකශාටක; (යන) පියකරුපඬුරු, ප්‍රියඞ්කර ප්‍රාභෘතයන්; නරනිඳුහට, නරශ්‍රෙෂ්ඨයාහට; පෑපැසුළු, දැක්වූපසු.

45 පරසිඳු කිවිඳු තෙපුලෙන් බැඳි දසටර ට
මෙනිරිඳු විරිදු නම්නොහැරම තෙසියසැ ට
ලෙලවිදු රතත් රැඳි වැඳිගණ දෙපිට සි ට
දලනිඳු ගොසෙව් තුතිගොසකර නැවතිච් ට

45 දසටරට, අෂ්ටාදශ රාෂ්ට්‍රයන්හි; පරසිඳු, ප්‍රසිද්ධවූ; කිවිඳුතෙපුලෙන්, කවිවර වාක්‍යයෙන්; මෙනිරිඳු, මේ නරෙන්ද්‍රයාගේ; නම්, නාමය; නොහැරම, අත්නොහැරම; බැඳි, බන්ධනයකරණලද; තෙසියසැට, තුන්සියසැටක් පමණවූ; විරිදු, විරුදාවලී (කීයමින්) ලෙලවිඳු, ලීලොපෙතවිද්‍යුත් බඳුවූ; රතත්රැඳි, රත්නාභසනයෙන් රජිතවූ; වැඳිගණ, වන්දිසමූහයා විසින්; දෙපි

ටසිට, උභයපාර්ශ්වයෙහි සිට; දලනිඳුගොසෙව්, සාගරඝොෂාවසේ; තුතිගොසකර, ස්තුතිඝොෂාකොට; නැවතිව්ට, නිර්මිතවූසැල.

46 ලියන කියන ලියගිරස විඳ නොහැ   ර
වියන රඳන මිණිකිරණින් උන් පව   ර
නයන නඳන පැරකුම්රජ දුන එත   ර
තයන ගමන සැලකර රැගෙණ අව   ර

46 ලියන, කාන්තාවන් විසින්; නිතොර, අතුරක් නැතිව; කියන, කථනයකරණලද; ලියගිරස, ලාංචිත ගීතිකාරසය; නොහැර, අත්නොහැර; විඳ, ලබාහෝ අසා; වියන, විතානයෙහි; රඳන, රජිතවූ; මිණිකිරණින්, මාණික්‍යකාන්තියෙන්; උන්, හුන්නාවූ; නයනනඳන, නෙත්‍රානන්දකරවූ හෝ කල්‍යාණ දර්ශනීයවූ; පවර, ප්‍රවරවූ; පැරකුම්රජ, පරාක්‍රමබාහු නරශ්‍රෙෂ්ඨයා; එතර, එසමයෙහි; දුන, හැඳින; තයනගමන, තා යන්නාවූ ගමන; සැලකර, දන්වා; අවසර රැගෙණ, අවකාසගෙණ.

47 ලකල් මිණිබිම් බිතු-කැල්මේ ගැලී නොපෙණී
ලියනිලොබින් නොමසිට-එසෙබෙන් අවුත් මදනැන්

47 ලකල්, අලඞ්කෘතවූ; මිණිබිම් බිතු, මාණික්‍ය භූමියෙහි හා භිත්තියෙහිද; කැල්මේ, කාන්තියෙහි; ගැලී, ගැලෙමින්; නොපෙණී, අදෘශ්‍යව (හෝ) ලියගීලොබින්, (පළමු කී) ලාංචිත ගීතිකාලොභයෙන්; නොමසිට, සිටිනොවී; එසෙබෙන්, ඒ (රජ) සභාවෙන්; මදනැන්අවුත්, මදක්ධුර අවුදින්.

48 පෙර උවිඳු ගෙණ ගිරිඳු කිරිසයු   ර
සලඹනාදු නැගිනොමඳු ගොස අයු   ර
තුරඟසමුදු නාදි ඇමදු දෙනා නොහැ   ර
වැදදලදු ගෙට දලදු වැඳමිතු   ර

48 පෙර, පූර්වයෙහි; උවිඳු, උපෙන්ද්‍රයාවිසින්; ගිරිඳු ගෙණ, මන්දරපර්වතයනගා; කිරිසයුර, ක්ෂීරසාගරය;

කලඹනද, අලලනකාලයෙනි; නැගි, උද්ගතවූ; නොම
ඳගොසඅසුර, අමන්‍ද ඝොෂසෙයින්; ඇමඳ, සැම දිවස්
හි; දෙන, පවත්වනලද; තුරුසඹුඳ, තූර්‍යසමූහයාගේ;
නද, නාදයෙන් යුක්තවූ; දළඳගෙට, දන්තධාතු ගෘහයට;
වැද, පැමිණ; දළඳා, දන්තධාතුන්වහන්සේ; මිතුර, සඟ
ලුව; වැඳ, නමස්කාරකොට.

49 දළදා පුදට දිවසෙන් එන ගුවන්ව ග
ඇමදා දිලෙන දන මන් කර නුවන් ද ග
විහිදා කිරණ බබලන රන්කැරලිඅ ග
සුසදා මදක් ඉඳ බඳ අගමිණක්ර ග

49 දළඳාපුදට, දන්තධාතු පූජාපිණිස; දිවසෙන්, දි
ව්‍යසෙනාව; එන, එන්නාවූ; ගුවන්මග, ආකාශමාර්ගයෙ
හි; දන, ජනයාගේ; මන්, සිත්හා; නුවන්, නෙත්‍රයන්;
දහකර, වශනකොට; ඇමඳ, සියලු දවස්හි; දිලෙන, දී
ප්තව; කිරණවිහිඳ, රැස්පතුරුවා; බබලන, භ්‍රාජිතව
නානාවූ; රන්කැරලිඅග, රන්කොත් අග; සුසඳ, සුසජ්ජි
තකොට; බඳ, බැන්දවූ; අගමිණක්රග, මුදුන් මැණිකක්
සේ; මදක්, ස්වල්ප (කාල) යක්; ඉඳ, විශ්‍රාමයකොට.

50 තෙලරතු ඔබ තුඩගින් මැද පියාසර
සලසිත්නොවී සතොසින් කොට පියාසර
නිලුපුල් කලඹ විලසින් යන පියාසර
නිලඹර අරා කොරෙමින් සෙද පියාසර

50 ඔබ, ශුමන්නුගේ; තෙල, මේ; රතුතුඩගින්, ර
ක්තවර්ණ තුණ්ඩාග්‍රයෙන්; පියාසර, පියාපත්; මැද, පි
රිමැඩගෙණ; සලසිත්නොවී, චපල චෙතනාඇතිනො
ව; සතොසින්, සතුටුසහිතව; පියාසරකොට, ප්‍රියාචරිත
යෙන් යුක්තව; පියාසර, විලහැරලා; යන, යන්නාවූ; නි
ලුපුල්කලඹවිලසින්, නීලොත්පල කලාපයක්සේ; නිලඹ
ර, ශ්‍යාමවර්ණ අහසට; අරා, නැගී; සෙද, සිඳුව; පියා
සරකෙරෙමින්, ගමන්ගෙණ (පියාහඹමින්).

51 සරිව තෙදිව පුර සුරකුම රුවන් මිලි
සුරුව තුරුව ඉඳනොව නුව රුවන් මැලි
තරව ලොලව තබමින් රන් රුවන් කිලි
ගිරව බලව කෙළිනා සොඳුරු වන් කෙළි

51 මිලිවන්, පැමිණියාවූ; තෙදිවපුර, ත්‍රිදශ පුරයෙහි; සුරකුමරුසරිව, දිව්‍යපුත්‍රයන්සේ; නුවරුවන්, නගරවාසීන්; මැලිනොව, මැලිනොවී; සුරුව, මුනුවිව; තුරුවඉඳ, තුෂ්ටව ඉඳ; තරවලොලව, සපිරලොභයෙන්; රන්, ස්වර්ණමයවූද; රුවන්, රත්නමයවූද; ඉකිලි, තාලීන්; තබමින්, ස්ථාපනයකරමින්; * කෙළිනා, ක්‍රීඩාකරන්නාවූ; සොඳ, සිත්කළුවූ; රුවන්කෙළි, රත්නක්‍රීඩාවන්; ගිරව, ගිරපක්ෂිය; බලව, අවලොකනය කරව.

52 නිතොර ගිගිරිදෙන මිණිසලඹ ලා ගෙණ
අඹර සරණ ඇතුළෙන් සඳව ලා ගණ
පැතිර යනෙන මනහර සුරඹ ලා වණ
පවර පුරඹරග වීමග බ ලා ගෙණ

52 නිතොර, නිරන්තරයෙන්; ගිගිරිදෙන, නාදපවත්වන්නාවූ; මිණිසලඹ, මණිනූපුරයන්; ලාගෙණ, (පය) බහාගෙණ; අඹර, අහස්හි; සඳවලාගණඇතුළෙන්, සන්ධ්‍යාවලාහකාන්තරයෙන්; සරණ, සඤ්චරණයකරන්නාවූ; සුරඹලාවණ, දිව්‍යාප්සරාවන්සේ ලාවණ්‍යතාපෙත; පැතිර, විසිරී; වීමග, වීථිමාර්ගයෙහි; යනෙන, ගමනාගමනයකරන්නාවූ; මනහර, සිත්කළුවූ; ! පවර, ප්‍රවරවූ; පුරඹරග, පුරවධූන්ගේ ස්වභාව; (එනම් රුචිරය) බලාගෙණ, නිරීක්ෂණයකරලා,

53 දිමුත් සඳලූවල කෙළිනා ලඳ අඳ ර
සුරත් බැබලි බිඹුපලයයි කාර අඳ ර
පුවත් නොදැන ගොස් අසුනොව සෙදමිනු ර
අවුත් යළි සොඳුරු විසිතුරු වෙහෙරතු ර

* මේ තුන්වෙනි පාදයට මෙසේත් අර්ථනිර්ණයම යෙදේ—තරවලොලව, සපිරලොභයෙන්; ඉකිලි, භාජනයන්හි; රන්, ස්වර්ණභා; රුවන්, රත්නයන්ද; තබමින්, ප්‍රක්ෂෙපකරමින්.

53 දිමුත්, දීප්තිමත්වූ; සඳලුවල, චන්ද්‍රකාන්තලයන්හි, කෙළිනා, ක්‍රීඩාකරන්නාවූ; ලඳ, කාන්තාවන්ගේ; සුරත්, ඉතා රතුවූ; අදර, ඔෂ්ඨයන්; බැබලි, දිලියෙනනාවූ; බිම්බුඵලයැයි, බිම්බ ඵලයැයි; අදරකර, ආසාකොට; පුවත් නොදැන, ප්‍රවෘත්තිය නොසොයා; ගොස්, ගමනයකොට; අසුනොව, (ඒ ස්ත්‍රීන්ට) අසුනොවී; මිතුර, මිත්‍රය; සොඳුරු, සුන්දරවූ; විසිතුරු වෙහෙරතුර, විචිත්‍ර විහාරාන්තරයට; යළි, නැවත; සෙද, සීඝ්‍රව; අවුත්, ආගමනයකොට.

54 සැදිමුනිසඳ සසුන්-නැවු කසුන් කුම්සුරු
සිවුපිරිසුදුසිල් සිවුරඟ සෙනගගෙ ණ
පව්බල රුදු මල්සැව් දළදප හර ණ
විනය නයසඳ දැන-යනුව නිවණට නුවන පහනින
දහම් විදුරුපාරිනරින පිලිඇදු රු
දහම් ඇදුරුමාහිමිසඳ සඟ සොඳු රු
යගපත් සිල් සුවඳවිලවුන් ගෙණ තිබ ද
පිළිවෙත් නැණ කුළුණුගුණ අබරණ පැළ ද
දිය සෙත් කර රඳනා කොළොසුන් සිදපසි ද
පිළිවෙත් සරු මගරු මගසඟගණ නැම ද

54 මුනිසඳ, මුනිශ්‍රේෂ්ඨයාගේ; සසුන්නැවු, සාශන නැමති නව්කාවෙහි; සැදි, හෙබියාවූ; කසුන්කුම්සුරු, කාංචනකුම්භය බඳුවූ-සිවුපිරිසුදුසිල්, චතුපාරිශුද්ධි ශීලනැමති; සිවුරඟසෙනගගෙණ, චතුරඞ්ගනී සේනා කැටිව; පව්බල, පාපනැමති භටයන්ඇති; මල්සැව්, කඳර්පයාගේ; දළදප, දෘඪවූ එඩිය; හරණ, පහකරන්නාවූ-නුවනපහනින, ඥානනැමති ප්‍රදීපයෙන්; විනයනයසඳ, විනයපිටක න්‍යායශබ්දශාස්ත්‍ර; දැන, දැනගෙණ; නිවණට, නිර්වාණයට, යනුව, යාම්පිණිස-දහම්, ධර්ම නැමති; විදුරුපාරින, වජ්‍රප්‍රහාරයෙන්; පිලිඇදුරු, විරුද්ධාචාරීන්; අරින, බැහැරලන්නාවූ; සොඳුරු, සුන්දරවූ; දහම්ඇදුරුමාහිමිසඳසඟ, ධර්මාචාර්‍ය්‍ය මහාස්වාමීන්ද්‍ර

යන් සමග-සහපත්, මනාවූ; සිල්, සීලනැමති; සුවඳවිල වුන්, සුගන්ධවිලෙපනයන්; නිබඳ, නිතොර; ගෙණ, ශරීරයෙහි තවරාගෙණ; පිළිවෙත්, ප්‍රතිපත්තිහා; නැණ සුවිණුගුණ, ඥාණකරුණාගුණනැමති; අබරණ, ආභරණයන්; පැළඳ, පැලඳගෙණ; කෙලෙසුන්, ක්ලෙශයන්; සිඳපසිඳ, ඡින්නප්‍රඡින්නකොට; දියසෙත්කාර; ජගත්‍ය හිතකෙරෙමින්; රඳන, රජමානවන්නාවූ; පිළිවෙත්සරැ, ප්‍රතිපත්ති සාරවූ; මහරැ, මහාඝිවූ; මහසඟගණ, මහාසඞ්ඝසමූහා; නැමද, නමස්කාරකොට,

55 පොරණ රැසින් කී තොපසතුරට පව      ර
ලද නි දෙ සි න් රිවිදින නැකත දිනක      ර
කුම රි රැ සි න් කිවි සුරගුරැ සිටිනොහැ      ර
මි තුර තො සි න් වඩු සිහිකර මෙත්සුතු      ර

55 තොපසතුරට, සුමිත්‍රගේ යාත්‍රාවට යොග්‍යවූ; පොරාණරැසින්, පුරාණ ඍෂින් විසින්; කී, කථිතයකරණලද; රිවිදින, දිවාකර දිනයෙහි; නිදෙසින්ලද, (අවයොගාදි) දොෂයන්ගෙන් වෙන්වනලද්දාවූ; දිනකරනැකත, අශ්වනාක්ෂත්‍රයෙහි; (එනම් රිවිදිනට අමෘතයොග වූ හතේ නැකතෙනි) කිවි, සිකුරැහා; සුරගුරැ, වෘහස්පති; සිටි, සිටියාවූ; කුමරිරැසින්, කන්‍යාරාශියෙන්; මිතුර, මිත්‍රය; මෙත්සුතුර, කරණීය මෙත්තසූත්‍රය; නොහැර, අත්නොහැර; සිහිකර, සිත්හිකොට; තොසින්, තොෂයෙන්; වඩු, ගමනාරම්භකරව.

56 වි ල ද රැ ඳු නු මී මීඅඹපල රසැ      ති
සො ඳ ව පැ සු නු දෙළුමුදු දිගුවුගු සැ ම      ති
ගෙණෙනතුරැණු කොමලඟ ලඟලඟ පැව      ති
නා ය න දකු ණු දිග මග මග පෙරනිමි      ති

56 මීරැඳුනු, මධුවෙන් රඳනාලද; විලඳ, ලාජද; රසැති, රසවත්වූ; මීඅඹපල, මධුරාම්‍රඵලයන්ද; සොඳව පැසුනු, මනාව පැසුනාවූ; දෙළුමුඳු, දෑඹිමද; කැමති, රැ

වූ; දිගුදිගු, දික් උක්ද; ගෙණ, ඇරගෙණ; ලඟලඟ පැවති, කැටිව හෝ සමූහව; ඒන, එන්නාවූ; තුරුණු කොමලඟ, තරුණ කොමලාඞ්ගනාවන්; නයන, නායන්නාවූ; දකුණුදිග, දක්‍ෂිණ දිශාවෙහි; පෙරමගනිමිති, පූර්‍වපථ නිමිත්තයන්; මිග, අවලොකනයකර.

57 නොමිද තෙදැති සිරිපැරකුම් නර පාය
පැහැද සඟනගෙණ හිම් බැඳ ගල පාය
නිබද පොහොය කරවනලෙස කළ පාය
සබද වඩින දැක නෙත සිත සත පාය

57 නොමද තෙදැති, අමන්‍දවූ තෙජස්ඇති; සිරිපැරකුම්නරපාය, ශ්‍රීපරාක්‍රම නරපාලයා; පැහැද, ප්‍රසන්නව; සඟනගෙණ, සඞ්ඝයා සහිතව; ගලපාය, ගලපමින්; හිම් බැඳ, සීමාබන්‍ධනයකොට; නිබඳ, නිතොර, පොහොයකරවනලෙස, උපොෂථකර්‍මකරවනු සඳහා; කළ, කරණලද; පාය, ප්‍රසාදය; සබඳ, මිත්‍රය; දැක, දර්‍ශනයකොට; නෙතසිත, නෙත්‍රචිත්තයන්; සතපාය, සන්තර්පණයකොට හෝ සතුටුකොට; වඩින්, ප්‍රයානයකරන්.

58 වටින නොයෙක් බඩු ඇරගෙණ ඇම දුම
වටින මිලට නොවිකොට කොට වෙළ දුම
සිටින ලියන් දැක සිහිකැර බණ දුම
වඩින කෝන්ගස සෙවණේ නොර දුම

58 වටින, අගනා; නොයෙක් බඩු, අනෙකභාණ්ඩයන්; ඇම්දුම, සෑමදවස්හි; ඇරගෙණ, රැගෙණ; වටින මිලට, වටිනා මුදලට; නොවිකොට, නොවිකුන; වෙළදුමකොට, වෙළඳුම්කොට; බණදුම, බණදහම්; සිහිකැර, ස්මරණයකොට; සිටින, සිටින්නාවූ; ලියන්, ස්ත්‍රීන්; දැක, දර්‍ශනයකොට; කෝන්ගස සෙවණේ; එනම් ස්ථානයෙහි; නොරදුම, නොනැවත; වඩින, ප්‍රයාණයකර.

59 ග ව සා සුනිල් වරලස කුසුම ප වි යෙ න
වෙහෙසා තනන තනායන් තිසර ප වි යෙ න
ස හ සා දිවෙන ලිය දැක තයනා අ වි යෙ න
නොලසා මිතුර යාගන් නොසිට ය වි යෙ න

59 සුනිල්වරලස, මනා නිල්වූ කෙස්වැටියෙහි; කුසුමපවියෙන, පුෂ්පපටලයෙන්; ගවසා, ගන්වාගෙණ; තනන, කම්පිතවන්නාවූ; තනයන්, පයොධරයන්; තිසරපවියෙන, හංසපටලයෙන්; වෙහෙසා, බන්ධනයකොට; තයනා, තෝයන්නාවූ; අවියෙන, (දැකීමට) ආසාවෙන්; සහසා, වහා; දිවඑන, ධාවනයකෙරෙමින් එන්නාවූ; ලිය, ස්ත්‍රීන්; දැක, දර්ශනයකොට; යවියෙන, එනම් ගම්හි; නොසිට, සිටිනනොව; මිතුර, මිත්‍රය; නොලසා, අලසනොව; යාගන්, යාත්‍රාග්‍රහණයකරන්.

60 * රිවි නුඹ ගැබින් බැස-හෙත සිඳුබැබලියානෙන්
සකි නුඹ නුඹින් ගොස්වැද-වෙහෙරට පැපිළියානෙන්

60 සිඳු, සමුද්‍රය; බැබලියානෙත්, බබුළුවා; රිවි, සූර්‍ය්‍යයා; නුඹගැබින්, නභොගර්භයෙන්; බැසහෙත, අවතීර්ණව එනකල්හි; සකි, යහළුව; නුඹ, යුෂ්මත්තෙම; නුඹින් ගොස්, අහසින්ගොස්; පැපිළියානෙත්, එනම් ග්‍රාමයෙහි; වෙහෙරට, විහාරයට; වැද, ඇතුල්ව.

61 පු න් ස ද කිරණ එත නුඹගඟ වතුරැලෙ ස
නා න්කොඳ කුමුදු සමගව දිලෙන තුරු රැ ස
දු න් ස ද මුනිඳු පුදයට පසඟ තුරුගො ස
ම න් බැ ඳ ලගින් පවුරස මිගඹ තුරු ගි ස

61 නුඹගඟ, නභොලක්ෂණ ගඟාවෙහි; වතුරැලෙස, ප්‍රවාහපරිද්දෙන්; පුන්සඳකිරණ, පූර්ණචන්ද්‍රකාන්තිය; එත, එනකල්හි; නාන්කොඳකුමුදුසමගව, නොයෙක් කුඳකොමුදයන් සමග; දිලෙන, බබලන්නාවූ; තුරුරැස, තාරකාශ්‍රේණීන්ඇති; (කල) මුනිඳුපුදයට, බුද්ධපූජාපිණිස; පසඟතුරුගොස, පඤ්චතූර්‍ය්‍යඝොෂාව; දුන්සඳ, පැවැත්වූකල්හි; පවුරස, ප්‍රාකාරසමීපයෙහිවූ; මිගඹතුරුගිස, සහ

* රවි - පොත්.

කාරවෘක්ෂ මසනකයෙක්හි; මස්බැඳ, සිත්ඵලවා; ලකින්, තවානැත්ගත්.

62 රඳ මුනුඳ රන්මිණිකිරණින් වෙසෙ ස
උදා දිනිඳු රතුකර සියරැස් සහ ස
උදා සිරස වැනුවාමෙන් ඉඳුරැඳෙ ස
එදා අරුණු දිසිසඳ නුබකුසින් බැ ස

62 මුනුද, සමුද්‍රයෙහිවූ; වෙසෙසරන් මිණිකිරණින්, නානාවිශෙෂවූ සවර්ණ මාණික්‍යකාන්තීන්; රඳ, රජිත ව; උදදිනිඳු, උදයදිවාකරතෙමේ, සහස, වහා; සියරැස්, සවකීය රශ්මීය; රතුකර, රතුකොට; උදසිරස, උදය පර්වතමුදුනෙහි; වැනුවාමෙන්, විසුල ක්‍රමෙන්; එදා, එදව ස; ඉඳුරැදෙස, පූර්වදිශාවෙන්; අරුණුදිසිසඳ, අරුණ ලොකය දෘශ්‍යවූකල; නුබකුසින්, නභොකුක්ෂියෙන්; බැස, බැසලා.

63 දිනිතිය දිව සුරැට-අදිතිය අයුරැ රිවිකුල
ලෙවු වැසි මන් තුටුකර රැදි සුපිරිසු දු
ම වූ බිස වුන් උදෙසා අප නිරිඳුස දු
කරවූ තුණුරුවන්-සතු සොඳුරුවන්වෙහෙරෙහි
මතු සගමොක් සිදුවනලෙස මිතු රත ට
සිතු සතොසින් සපැමිනමුනි මැදු රත ට
සුගත් පසිඳු ගුණවැකිමතිනි තුඩ ගය
මගත් සසර සයුරෙන් නැගුනුනිස ගය
කුසිත් * තබා කියමින් මුනිඳුගුණ ගය
පිනත් බඳුව වැද පෙතිපිළිම සහ ගය

63 දිවසුරැට, සූර්ය්‍යාගේ; දිනිතිය, මෑනියන්වූ; රිවිකුල, සූර්ය්‍යවංශයට; අදිතිය අයුරැ, අදිතිනම් දිව්‍යමාතාව බඳුවූ-ලෙවුවැසි, ලොවැසියන් සම්බන්ධවූ; මන්, චිත්තයන්; තුටුකර, සතුටුකොට; රැදි, රජමානවූ; සුපිරිසුදු, ඉතා පිරිසිදුවූ; මවුබිසවුන් උදෙසා, මාතෘමහෙසිකාව ස

* එසිත්-සමහර.

දහා; අපනිරිඳුසඳු, අපගේ ගරෙන්ද්‍රානාමිසාමිසින්; ත්‍රි
ණුරුවන්ඇතු ත්‍රිවිධරත්නය සනාථකකොට; කරවූ, කාර
වනලද; සෙද, සිත්කළුවූ; රුවන්වෙහෙරෙහි, රතනවි
හාරයෙහි-මිතුර, මිත්‍රය; නට, සුඹන්හට; මතු, (මරණි
න්) මත්තෙහි; සඟමොක්, ස්වර්ගමොක්ෂය; සිඳුවනලෙ
ස, සිඬවනමෙන්; සිතුසනොසින්, චිත්ත සන්තොෂයෙ
න්; මුනිමැඳුරනට, සර්වඥ මන්දිරාභ්‍යන්තරයට; සපැමි
ණ, සම්ප්‍රාප්තව-තුඹගය, තුණ්ඩාග්‍රය; සුනන්, සර්වඥය
න්ගේ; පසිඳුගුණාවැකි, ප්‍රසිඬ ගුණයෙන් ඇලුනාවූ; මි
තිනි, අනුකරණයෙන් යුක්තව; නිසගය, ස්වභාවයෙන්
ම; මහත්, විශාලවූ; සසරසයුරෙන්, සංසාරලක්ෂණ සා
ගරයෙන්; නැඟුනූ, උද්ගතවූ; කුසින්, කොසීදයෙන්;
තබා, බැහැරත ලා; මුනිඳු ගුණනය, බුඬගුණඝනයන්;
කියමින්, කථනයකෙරෙමින්; සගනය, අගයසනිතවූ; පෙ
හිපිළිම, ආලෙඛ්‍යරූපහා ප්‍රතිමාරූපයන්; වැඳ, නමස්
කාරකොට; පින්, ඒ පුණ්‍යයන්; අත්බඳුව, ආත්මයහා
නොහොත් චිත්තයහා බන්ධනයකරව.

64 බිතු සිතුයමට ඇඳි පෙලනුඳුල අඹතුරු
අතු අතරැඳි ගිරවුන්සැරි දැක සොඳුරු
තනු නොම දන ලොබබැඳ වැද නොවනිසරු
සිතු තුටුකර දැක එහි නොයෙක විසිතුරු

64 බිතු, භිත්තියෙහි; සිතුයමට, චිත්‍රකර්මයට; ඇඳි, ආලෙඛ්‍යකළාවූ; පෙළනුඳුල, ඵලයෙන් උජ්ජ්වලිතවූ; අඹතුරු, සහකාරවෘක්ෂයන්හි; අතුඅතර, ශාඛාන්තරයන්හි; රැඳි, රඤ්ජිතවූ; සොඳුරු, සිත්කළුවූ; ගිරවුන්සැරි, කීරපක්ෂීන්ගේ ස්වභාව; දැක, දැකලා; තනුනොමදන, තත්වය බොධනොකොට; ලොබබැඳ ලොභබන්ධනයෙන්; වැද, වැදී; නිසරුනොව, ලජ්ජාවට නොපැමිණ; එහි, ඒ විහාරයෙහි; නොයෙක විසිතුරු, අනෙක විචිත්‍රයන්; දැක, දැකලා; සිතුතුටුකර, සිත සතුටුකොට.

65 වස වතු දප් බිඳ බුදුවූ ගුණන ද නා
අප පිය බප් මුනිදගැබ කර න ද නා
කෙළ මුළුකප් පවතිනලෙස කළ න ද නා
වැද දා ගැප් වදිනාසඳ දියන ද නා

65 වසවතු, මාරදෙවියාගේ; දප්බිඳ, එඩි බිඳ; බුදුවූ, බුදුවූ; ගුණනදන, ගුණයෙන් නඳුනීයවූ; අපපියබප්, අපගේ ජගත්පිතෘවූ; මුනි, සර්වඥයන්ගේ; නදන, යහපත්වූ, දා, ධාතූන්; ගැබකර, ඇතුල්කොට; මුළුකප්, සමස්තකල්පයාගේ; කෙළ, අවසානයතෙක්; පවතිනලෙස, පවත්නාමෙන්; කළ, කාරණලද; නදන, නඳුනීයවූ; දාගැප්, ධාතුගර්භය; දිය, ජනත්නි; නදින, නොයෙක් ජනයා; වදිනාසඳ, වදිනකල්හි; වැද, (තෝද) වැදලා.

66 නිසග පවගදෙන මුනි උපදිනා දී නේ
සමග ඉපිද පිහිටව පැවති හැම දී නේ
ලොවග පුදය ලද දුමරදුට සබ දී නේ
සවග සැපත් සිදුවනාලෙසට නම දී නේ

66 නිසග, ස්වභාවයෙන්ම; අපවගදෙන, ස්වර්ගසම්පත් දෙනානාවූ; මුනි, සර්වඥයන්වහන්සේ; උපදිනාදිනේ, උපදින දවස්හි; සමග, (ඒසර්වඥයන්) සමග; ඉපිද, උත්පාදව; හැමදිනේ, සියලු දවසෙහි; පිහිටවපැවති, ප්‍රතිෂ්ඨාව පැවැත්තාවූ; ලොවගපුදයලද, බුඩපූජාලැබූ, දුම රදුට, බෝධිද්‍රැමයට; සබදිනේ, යහලුව; සවගසැපත්, ස්වර්ගසම්පත්තිය; සිදුවනලෙසට, සිඩවනමෙන්; නමදි නේ, වදින්නේයි.

67 එවෙහෙරතුර රදන-මනහර මහරු සහගත
මෙතින් සොඳුරු පිරිසිදු හියමගෙහි යො දා
නිතින් තිලොගුරුහට පිළිවෙතින් පු දා
හරදළකොතගවන්-හිමි තදතෙදින් බබලන
අමා කර විනය සිදුනය රුවන්ග ල
තමා නැන තිදුකිරණින් උදම්කා ල

නොමඳ වියත් ගහරලවැලසේ පුබු  දු
නිබඳ දිමුත් සිවුපිරිසිඳුසිල් පුරු  දු
පැහැදිම හත් මුනිබණ දෙසුමෙහි පසි  දු
නැමදසුනෙත් මහදෙව් පිරිවන් තෙරි  ඳු

67 එවෙහෙරතුර, ඒ විහාරාභ්‍යන්තරයෙහි; රඳනා, රාජමානවූ; මනහර, සිත්කළුවූ; මහත්, උතුම්වූ; සහගනා, සඞ්ඝසමූහයා-සොඳුරු, සුන්දරවූ; මෙතින්, මෛත්‍රියෙන්; පිරිසිදු, නිර්මලවූ; හිංමගෙහි, හිතමාර්ගයෙහි; යොදා, යුක්තකොට; නිතින්, නිරන්තරයෙන්; තිලෝගුරුහට, සර්වඥයාහට; පිළිවෙතින්, ප්‍රතිපත්තියෙන්; පුදා, පූජාකොට-හර, ඊශ්වරයා සම්බන්ධවූ; දළනෙතගවන්, ලලාටාක්ෂිවහ්නියසෙයින්; තදතෙදින්, උග්‍ර තෙජසින්; බබලනා, භ්‍රාජමානවන්නාවූ; හිමි, ස්වාමිතෙමේ-සිඳුනය, සර්වඥනීතිනැමති; රුවන්ගල, රත්නායන්ගෙන් යුක්තාවූ; විනය, වෛනෙයනැමති; අමාකර, කිරිමුහුද; තමා, තමන්ගේ; නැනතරිඳුකිරණින්, ඥානනැමති චන්ද්‍රමරීචියෙන්; උදම්කළ, ඔජාවැඩූ-වියත්ගඟ, ශාස්ත්‍රාදියෙහි; පුබුදු, ප්‍රබුද්ධවූ; නොමඳ, අමන්දවූ; රලවැලසේ, තරඞ්ගාවලිසෙයින්; නිබඳ, නිතොර; දිමුත්, දීප්තිමත්වූ; සිවුපිරිසිඳුසිල්, චතුපාරිශුද්ධිශීලය; පුරුදු, පරිචිතවූ; පැහැදි, ප්‍රසන්නවූ; මහත්, උතුම්වූ; මුනිබණදෙසුමෙහි, සර්වඥධර්මදෙශනාවෙහි; පසිඳු, ප්‍රසිද්ධවූ; සුනෙත්මහදෙව්පිරිවන්තෙරිඳු, සුනෙත්‍රා මහාදෙවීපරිවෙණාධිපති ස්ථවිරයානන්වහන්සේ; නැමද, නමස්කාරකොට.

68 සවන් පුදට සපැමිණි බැලුම කෝමල  ඟේ
නුවන් කැලුම් වැද තුඩ මලිනවෙයි ත  ගේ
ඒවන් කිලුටුවනතෙක් නොසිට උන්ල  ගේ
පවන් මගට වැද යාගන්න මනර  ගේ

68 සවන්පුදට, සර්වඥපූජාපිණිස; සපැමිනි, සම්ප්‍රාප්තවූ; කොමලඟේ, කොමලාඞ්ගනාවන්ගේ; බැලුම, (තාදෘශ) බැලුමහොත්; නුවන්කැලුම්, නෙත්‍රකාන්තිය; වැද, ගසා;

නාගේ, සුමන්නුගේ; තුඩ, තුණ්ඩය; මලිනවෙයි, කිලු ටුවේ; එවන් කිලුටුවනතෙක්, එසේ කලිෂ්ඨවනතුරු; උන්ලගේ, උන් සමීපයෙහි; නොසිට, සිටිනොම; පවන් මගටවැද, අහසට නැගී; මනරගේ, සිත්පරිද්දෙන්; යාගන්න, ගමන්ගනු.

69 සිත් එඩියෙන් යුදකර තමහිමි යෙහෙ නා
ලත් අඩියෙන් සතුටුව ඉඳ මනමනි නා
මත් වැඩියෙන් ලියගී කියන නැනනැ නා
අත් තිඩියෙන් යව ලඳලිය දුසා සොබ නා

69 සිත්එඩියෙන්, චිත්තදර්පයෙන්; තමහිමි, ස්වකීය ස්වාමීන් හා; යෙහෙන, සුවසේ; යුදකර, (කළදර්ප) සඞ්ග්‍රාමයකොට; ලත්අඩියෙන්, ලබනලද ධුරයෙන්; නැනනැන, තන්හිතන්හි; සතුටුවඉඳ, සන්තුෂ්ටවසිඳ; මනමනින, මනොමතන භාවයෙන් යුක්තාව; මත්වැඩියෙන්, මාත්‍රාවෘඩියෙන් හෝ දැඩිවූ අනුකරණයෙන්; ලියති, ලක්ෂණවූ ගීතිකාවන්; කියන, කියනනාවූ; සොබන, ශොභනාවූ; ලඳලිය, තරුණවුන්; දුසා, දුසලා; අත්තිඩියෙන්, එනම් ග්‍රාමයෙන්; යව, ප්‍රස්ථානයකර.

70 පලපල පොරණ යන-ගව මීරල ගිනිළියෙන්
ගව්පල්කෙළිනකෙළියෙන්-යව ඉවුමොරවුඑලියෙන්

70 පලපල, පලින්පල; පොරණයන, පොරඅතිමින් යනනාවූ; ගවමීරල, ගවමහිෂ සමූහයාගේ; ගිනිළියෙන්, ගර්ජනාඇත්තාවූ; කෙළින, ක්‍රීඩාකරන්නාවූ; ගව්පල්, ගොපාලයන් ඇති; මොරවුඑලියෙන්, එනම් ග්‍රාමයෙන්; ඉවු, සතුටුව; එකෙලියෙන් යව, සාප්‍රගමනින් යව.

71 සබ ද මිදක්නැන් ගිය මග දකුණුප සේ
බි හි ද රිබෙන වලුබර පොල්ලයන්රැ සේ
නොමිද තරගපහාරට බියවි නොයකම සේ
බු හු ද කැලුම් රැස්වූ වැන්න ඉවරල සේ

71 සබඳ, සහලුව; මදක්නැත්ගිය, මඳක්දුර ගියකල; මග, මාර්ගයෙහි; දකුණුපසේ, දක්ෂිණ පාර්ශ්වයෙහි; විහිදතිබෙන, විහිදී තිබෙන්නාවූ; වලුබර, වල්ලරී භාරඇති; පොල් උයන්රැසේ, නාරිකෙල උද්‍යානරාශිය (කොසේ දසත්); නොමඳ, අමඳවූ; තරඟපහරට, රළපහරට; බියව, භයවී; නොකමසේ, එකාහෙළා; මුහුදකැලුම්, සමුද්‍ර පැහැය; වෙරළසේ, වෙලාන්ත සමීපයෙහි; රැස්වූවැන්න, රාශීභූතවූවාක්මෙනි.

72 නිලඹ රේ වැජඹෙන ගනකුළු ලෙස ට
මුදුතෙ රේ යන එන නැව් පෙණෙය ත ට
පැර තෙ රේ පිස දුක්නොසිතා ගත ට
පානදු රේ තොටිනෙතරව යව එපි ට

72 නිලඹරේ, නිල් අහස; වැජඹෙන, විජෘම්භමාණවන්නාවූ; ගනකුළුලෙසට, මේඝකූටසෙයින්; මුදුතෙරේ, සමුද්‍රතීරයෙහි; යනඑන, ගමනාගමනය කරන්නාවූ; නැව්, නෞකාවෝ; තට, තුඹන්හට; පෙණෙය, දෘශ්‍යමානවන්නේය; ගතට, ශරීරයට වන්නාවූ; දුක්, දුඃඛයන්; නොසිතා, නොසලකා; තෙරේපැර, තරගේ පීඩා ගසා; පානදුරේ තොටින්, පානදුර (නදී) තීර්ථයෙන්; එතරව, පරතෙරට පැමිණ; එපිටයව, දුරටයව.

73 කාණ ලා උපුල් මල්ගවසා කෙස්වැ ටිය
බිඳ ලා පොකුරු තැර ලා මුහුනරසැ ටිය
බැඳ ලා ගවන් වෙත ගවපලුලිය සි ටිය
නොබ ලා මිතුර යාගන් මග පොතුපි ටිය

73 කාණ, කාර්ෂ්ණයෙනි; උපුල්, උත්පලයන්; ලා, බහාගෙණ; කෙස්වැටිය, කෙශකලාපය; මල්ගවසා, පුෂ්පයෙන් ගන්වා; පොකුරු, පුෂ්කරයන්; බිඳලා, භග්නකරලා; මුහුනරසැටිය, මුඛාකාර පරිච්ඡේදය; තාර, ශ්‍රීවයෙහි; ලා, බහාගෙණ; ගවන්, ගව්‍යයන්; බැඳලා, බන්ධනයකොට; වෙත, (ඒ ගවයන්) සමීපයෙහි; සිටිය, සිටිය

වූ; ගවපලලිය, ගොපදසත්‍රීන්ඇති; පොතුපිටිය, එනම් ග්‍රාමය; තො, සුළමත්හු; බල, නිරීක්ෂණයකොට; මග, මාර්ගයෙහි; යාගන්, ප්‍රයාණකර.

74 දු ල් පමු නලල්තලා ය දී තා ලා ය
පු ල් රතුපුල්ම ලා ය සවණා ලා ය
ග ල් කුළුමුදුන්ව ලා ය සිටි කා ලා ය
ඇ ල් ගොවිලියන් බ ලා ය තෝ ප ලා ය

74 දුල්, ජ්වලිතවූ; පමු නලල්තලාය, පමුවූ ලලාටතට යෙහි; තලාසදී, තිලකලා; පුල්, පිපියාවූ; රතු උපුල් මලාය, රක්තොත්පල කුසුමයන්; සවණලාය, කර්ණපෑලඳ; ගල්කුළුමුදුන්වලාය, ශෛලකූට මතුයෙහි; සිටි, සිටිතවූ; කලාය, සිත්කලුවූ; ඇල්ගෙවිලියන්, ශාලිගොපිකාඞ්ගනාවන්; බලාය, නිරීක්ෂණයකොට; තෝ, නුඹ, ත්තෙමේ; පලාය, ඔබ්බෙහි යව.

75 වෙ ණන් මියුරු පලරස විඳ මගදෙපි ට
සෙ ණන් වඩා වැද සියනෑසියවෙත ට
මෙ ණන් ගිමන් දුක් දුරුකර ගිය තොප ට
පෙ ණේ සොඳුරුපල තුරුමෙමගොඩකලුතො

75 මගදෙපිට, මාර්ගය උභයපාර්ශ්වයෙහි; වෙණේ, වනයෙහි (ඇති); මියුරු පලරස, මධුර ඵලරසයන්; විඳ, ආස්වාදකොට; සෙණෙවඩා, සෙනාභවර්ධනයකොට; සිය, ශතසඞ්ඛ්‍යාතවූ; සියනෑවෙතට, ස්වකීය බන්ධුන්කරා; වැද, පැමිණ; ගිමන්, (ශරීර) ශ්‍රමයෙහා; මෙණේ, සිත්හි; දුක්, දුඃඛය; දුරුකර, බැහැරකොට; ගිය, ගියාවූ; තොපට, නුඹත්හට; සොඳුරු, මනොඥවූ; පල, ඵලවත්වූ; තුරු, වෘක්ෂයෑ ඇති; කලුතොට මෙගොඩ, කාලගංගාවෙන් මොබවූවූ; පෙණේ, දෘශ්‍යමානවේ.

76 උඳු මුං තල කලත් මාතුරු තණ විව ග
* කිතුල් තල් තැඹිලි අඹ රඹ උගු සම ග
ඇඹකල් සැදි නිමල් කෙත්වත් දුක එම ග
මදනැන් නොසින් නොගොසින් මිතුර මනරග

* බෙදකල්—පොත්.

76 උඳු, මාෂඃ; මුං, මුද්ගය; තල, තිලඃ; කලන් කොල්ලුය; මාතුරා, පොල්ගස්ය; තණ, කඩිතුය; වී වග, ආශුවර්ණිය; කිතුල්, හිනතාලය; තල්, තාලඃ; නැම්ලි, සන්නීරය; අඹ, ආම්‍රඃ; රඹ, කදලිය; උක් සමඟ, ඉක්ෂුනා සමග; ඇම කල්සැදි, නිරන්තරයෙන් සජ්ජිතවූ; මනරඟ, සිත්කලුවූ; නොයෙක් කෙත්වත්, අනේකක්ෂේත්‍රාරාමයන්; දැක, දැකලා; එමඟ, ඒපථයෙහි; මිතුර, සහෘදව; නෝ, සුඹත්නෙම; ගොසින්. සංනතාෂයෙන්; මදන ්න් ගෙසින්, මදක්පුර ගොස්; (මතුසම්බන්ධයි)

77 ලකකොමල ඟ සමනලගිරිහිසින් ගො නා
හළමනර ඟ මලිගියමල්දම්න්සු නා
වරලසර ඟ පෙනවැල *රැලිසියෙන්දි නා
දිලි කලුග ඟ ලඟවැද හැර ගිමන් ග නා

77 ලකකොමලඟ, ලඹකානැමති කොමලාඞ්ගයෝ විසින්; සමනලගිරිහිසින්, සමනතකූටපර්වත නැමති ශීර්ෂයෙන්; ගොනාහළ, ගුනර්නායකොට්ඨ; මනරඟ, මනොඥවූ; මලිගියමල්දම්න්සුනා, මාලතීපුෂ්පදාමයෙන් යුක්තවූ; වරලසරඟ, කෙශකලාපය බඳුවූ; පෙනවැලරැලිසියෙන්, ඵේනපඞ්ක්තිවලිශතයෙන්; ඉනාදිලි, අතිශයින් සොබනා; කලුගඟලඟ, කාලනදී සමීපයට; වැද, පැමිණ; ගනාගිමන්, ශරීර ශ්‍රාන්තඃ; හැර, පහකොට.

78 ගි මනා නිවනා සිසිලස තරඟරොන් වැ දී
බ මනා බමරරැව්සහ මල්සුවඳ ගැ දී
හ මනා සිනිඳු මඳනලපහස විඳ වි ඳී
නා මනා ලෙසින විසිතුරු තුරුසිරෙන ඔ දී

78 ගිමන නිවන, ග්‍රීෂ්මය නිවන්නාවූ; සිසිලස, සීතලවන්වූ; තරඟරොන්වැද, රළරොණනී වැදී; බමන, (පුෂ්පයන්හි) භ්‍රමනයකරන්නාවූ; බමරරැව්සහ, භෘඞ්ගනාදසහ; මල්සුවඳ, කුසුම සුගන්ධය; ගැද, ආකර්ෂණයකොට; හමන, හමන්නාවූ; සිනිඳුමඳනලපහස, ස්නිග්ධමන්දමාරුත ස්පර්ශය; විඳම්ඳ, ලබමින්; නාමනාලෙසින, තුඹ සිත්

* හැලි-පොත්

පරිද්දෙන්; විසිතුරු, විචිත්‍රවූ; තුරුසිරෙක, වෘක්ෂශ්‍රී
යෙකින්; ඉඳ, විශ්‍රාමයකොට.

79 සුරගඟ දියකෙළිනා සුරැසුර ඹා
තුනුවඟ සිරිසොඳ රුසිරෙන් පසු බා
තම රඟ දුටුසත සතනද කළ ඹා
බල ගඟ දියකෙළිනා ලිය සසො බා

79 සුරගඟ, ස්වර්ගඞ්ගාදියෙහි; දියකෙළිනා, ජලක්‍රීඩාකරන්නාවූ; සුරඹාසුරු, දිව්‍යාප්සරාවන්සේ; තුනුවඟ සිරි, කන්දර්පයාගේ ශ්‍රිය; සොඳරුසිරෙන්, මනොඥරුචිරතාවෙන්; පසුබා, පසුකොට; තම්රඟ, ස්වකීයස්වභාව; දුටුසත, දර්ශනයකළ ජනයාගේ; සතනද, සිතද; කලඹා, විකලකොට; ගඟදිය, ගඞ්ගාජලයෙහි; කෙළිනා, ක්‍රීඩාකරන්නාවූ; සසොබාලිය, ශොභාසහිත ස්ත්‍රීන්; බල, අවලොකනයකර.

80 සිට ගඟ ඉවුරෙහි සොඳ නොහැ ලී යා
මනරඟ මලවල මුහවර ලී යා
කොමලඟ පැනායන රඟ උදු ලී යා
විසොව ග ලෙල දද සිරි ජය ලී යා

80 සොඳ, මනොඥවූ; ගඟඉවුරෙහි, නදීකූලයෙහි; නොහැලීයාසිට, අනාලීනවසිට; මනරඟ, මනොඥවූ; මලවල, කුසුමාකුලවූ; මුහවරලීයා, මුදනාලද කෙස්වැටිඇති; උදුලීයා, උස්ව දිලිහී; පැනායන, (දිසව) පැනයන්නාවූ; කොමලඟරඟ, කොමලාඞ්ගස්ත්‍රීන්ගේ ස්වභාව; විසොවග, කුසුමචාපයාගේ; ලෙලදදසිරි, ලීලොපෙතධ්වජශ්‍රිය; කියලීයා, කියාලූමාය.

81 කෙළි නා ලිය පියයුරුබිත ගැසෙමි නි
විදෙද නා රලපෙරෙන් වැද වැද වෙසෙසි නි
සොබ නා සොම්ලවනින් නදවිලසි නි
රද නා අමකිරණින් පිරිසද වැ නි

81 කෙළිනාලිය, (දිය) කෙළින්නාවූ ස්ත්‍රීන්ගේ; පියයුරුබිත, පයොධරභිත්තියෙහි; ගැසෙමිනි, හැපෙමින්;

විදෙනා, විහිදෙන්නාවූ; රලරෙන්මැද, තරඞ්ගාරණු ඛයෙහි; වෙසෙසින්වැද, විශෙෂයෙන් හැපෙන; නදවිලසිනි, සිත්කලු ස්වභාවෙන් යුක්තවූ; සොබනා, සොභනාවූ; සොම්ලවනත, සෞම්‍යවක්ත්‍ර (කොසේද); අම්බිරණින්රඳනා, සඳකැලුම්න් හෙබියාවූ; පිරිසඳවැනි, ණිණ චන්ද්‍රයාවැන්න.

82 කිය මින් වෙන වෙන වාසි පැබ ල
ඉදි මින් දියතුල නොපෙණී බෝක ල
පෙණෙමින් තැන තැන විදුලියසේ දු ල
ගස මින් කෙළ කෙළ යෙති දියකෝකි ල

82 වෙනවෙන, වෙන්වෙන්ව; වාසිකියමින්, වහසිබෙණෙමින්; බලපෑ, බලය පෙන්වා; දියතුළ, ජලයඇතුළත; බෝකල, බොහෝවේලා; නොපෙණී, අදෘශ්‍යව; ඉඳිමින්, නිමිදනය කෙරෙමින්; තැනතැන, තන්හිතන්හි; දුල, ජ්වලිතවූ; විදුලියසේ, විද්‍යුල්ලතාසෙයින්; පෙණෙමින්, (නැවත) දෘශ්‍යවෙමින්; දියකෝකිල, දියකාවුන්ට; ගසමින්, පහරදෙමින්; කෙළකෙළයෙති, කෙළිමින් යත්.

83 වි ල සි න් දිය කෙළ කෙළ යෙත නොමැ ලී
වෙසෙ සි න් නැගී රලරෙණ් ගඟ ඉපි ලී
ප හ සි න් තම එකසරියයි එක ලී
සතො සි න් ලොමුදැ හැගත් සිරි කිය ලී

83 විලසින්, ස්ත්‍රීන්; නොමැලී, මැලිනොව; දියකෙළකෙළ, ජලක්‍රීඩාකෙරෙමින්; යෙත, යත්ම; ගඟ, නදියෙහි; ඉපිලී, ඉල්පී; නැගී, උද්ගතවූ; රලරෙණ්, තරඞ්ගශ්‍රෙණීන්; වෙසෙසින්, විශෙෂයෙන්ම; පහසින්, ස්පර්ශයකරණකොටගෙණ; තම, තමන්හා; එකසරියයි, එකසදෘශයයි; සතොසින්, සන්තොෂයෙන්; එකලී, එකහෙලා; ලොමුදැහැගත්සිරි, රොමොද්ගතශ්‍රීය; කියලී, ප්‍රකාශකළා.

84 කොමලඝනක් උවනත උඩුකුරුකො ට
තම මුහුලත් බැඳ පිහිනානු දියපි ට
හැම සියපත් හැකිළෙනු සොමිතරිඳු ට
මෙමරඟයි පානාවැනි දිනිඳු ට

84 කොමලඝනක්, කොමලාඞ්ගියක්නුගේ; උවනත, වකතුය; උඩුකුරුකොට, උත්මුඛකොට; තම, සව කීයවූ; මුහුල, ධම්මිල්ලයෙහි; අත්බැඳ, හස්තබන්ධනය කොට; දියපිට, ජලමතුයෙහි; පිහිනනු, පිහිනීම (කෙසේද); සොමිතරිඳුට, සෞම්‍ය චන්ද්‍රයාට; හැමසිය පත්, සකලශතපත්‍රයන්; හැකිළෙනු, මුකුලිතවීම; මෙමරඟයි, මෙයාකාරයයි; දිනිඳුට, සූය්‍ය්‍යාට; පානා වැණි, දක්වන්නාක් වැන්න.

85 අසි රී දිසි දියදහරින් අඹ රා
සසි රී හුනු ඉඳුසැව්සිය පත රා
නැව රී ගිය ගඟ ලතකොකුමඟ රා
අසි රී සිතුයම් දක්වී පත රා

85 අසිරී, ආශ්චය්‍ය්‍යීමත්වූ; දියදහරින්, ජලධාරාවෙන්; අඹරා, ආවෘතකොට; දිසි, දෘශ්‍යවූ; පතරා, මහත්වූ; සසිරී, ශොභාසහිතවූ; ඉඳුසැව්සිය, ඉන්ද්‍රචාපශතයන්; හුනු, පතිතවූවාසේ; ගඟ, නදියෙහි; නැවරීගිය, ආලෙපවගියාවූ; ලතකොකුමඟරා, ලතා කුඞ්කුමාභරණය; අසිරී, විස්මයවත්වූ; සිතුයම්පතරා, සිතියම් ඇතිරිය; දක්වී, පෙන්වී.

86 අව ර ඇඳුරු මෙමහෙසුරු රිවි දළමෙනී නා
නොහැර දිනත දිනමින්දදහු වෙමෙසෙයි නා
පැති ර නැඟුනු නලසිළු ගිනිරෙණ් ලෙසි නා
එත ර පෙණේ සඳුවෙල තුරු මද මදි නා

86 අවරඇඳුරු, අපරපව්‍ව්‍යතනැමති; මෙමහෙසුරු, චන්ද්‍රශෙඛරයා; රිවිදළමෙනතින, ආදිත්‍යයානැමති ලලාටාක්ෂියෙන්; දිනමින්දදහු, දිවසලක්ෂණ මකරධවජයා; නොහැර, දහනාකොට; වෙසෙසින් දිනාන, විශෙෂයෙන්

ශ්‍රී ලංකා ජාතික පුස්තකාලය

ජයනනුත්මි; පැතිරනැගුනු, විසිරි නැංගාවූ; නලසිළු, ශි ඛිශිඛාභා; ගිනිරෙන්ලෙසින, සඵුලිඞ්ගයන්සෙයින්; එත ර, එසමයෙහි; සඳමෙල, සන්ධ්‍යාවලාහකයන් හා, තුරු තාරකාවන්; මදමදින, මදින්මද; පෙණේ, දෘශ්‍යවේ.

87 වි දු සිනිඳු සුදුරැස් දිගුපියපත ර
නා දු සුපුන්හිමකර පිවිතුරු * හිස ර
ස දු සිතඹසියපත් නුඹතඹරක ර
උ දු දෙසෙන් වැද එනරඟ බල මිතු ර

87 සිනිඳුසුදුරැස්, ස්නිග්ධශ්වෙත රශ්මිනැමති; දිගුපි යපතර, දීර්ඝවූ පක්ෂපත්‍රයන්; විදු, විහිදු; නදු, නැඟුනාවූ; සුපුන්හිමකර, සම්පූර්ණ චන්ද්‍රබිම්බෙනැමති; පිවිතුරුහි සර, ශොභන හංසයා; සිතඹ, ශ්වෙතවලා නැමති; සියප ත්, ශතපත්‍රයෙන්; සදු, සජ්ජිතවූ; නුඹතඹරකර, න භොලක්ෂණ පද්මිනියට; උදුදෙසෙන්, පූර්වදිග්භාග යෙන්; වැද, ප්‍රවිෂ්ටව; එනරඟ, එන්නාවූ ආකාරය; මිතු ර, යහලුව; බල, අවලොකනයකර.

88 විය ත උදුල කිරණවරල පැහැපස ස
දිය ත විපුල සුදුගඟුලැලි සිරිවිල ස
දිය ත පතළ පිරිසිදු සඳරැස් වෙසෙ ස
තමනෙත පුරා දැක දැහැ ගතෙහි සරනැ ස

88 වියත, අහස්හි; උදුල, උජ්ජ්වලිතවූ; කිරණවරල, ස්ඵුරණීව තාරකායන්ගේ; පැහැපස, ප්‍රභාස්පර්ශයෙසි න්ද; දියත, ජගත්හි; විපුල, විස්තීර්ණවූ; සුදුගඟුලැලි, ශුභ්‍රගඞ්ගා නිර්ඣරයන්ගේ; සිරිවිලස, ශ්‍රීයෙසින්ද; දිය ත, ලොකයෙහි; වෙසෙස, විශෙෂයෙන්; පතළ, පැතිර ගියාවූ; පිරිසිඳුසඳරැස්, නිර්මල චන්ද්‍රරශ්මීය; තමනෙතපු රා, තමාගේ ඇස්පුරා; දැක, දර්ශනයකොට; ගතෙහිසරනැ ස, ශරීර ශ්‍රාන්තය; දැහැ, දුරුකොට; මතුසම්බන්ධයි.

---

* පියකරු-යි පොත්.

89 පල ඟ ගහණකලසඳ විහිදුනු විස ද
සම ග කලාවැද නොගැසුනු මැද සිරි ද
මත ග ඉසිඟු බටමග තව නොමැකුණෙ ද
බල ග මෙබඳු සැකබිඳ ලපසඳ සබ ද

89 පලඟ, රාහුවිසින්; ගහණකලසඳ, ග්‍රහණයකළ
කාලයෙහි; විහිදුනු, විසතීර්ණවූ; විසඳසමඟ, විෂත් ස
මග; කලා, ෂොඩශභාග සංඛ්‍යාතවූ කලාවන්නා; වැද, ප්‍ර
විෂ්ටව නොහොත් හැපී; නොගැසුනු, සංඝනනුවූ හෙව
ත් එකසනනුවූ; මැදසිරිද, මධ්‍යයෙහිවූ රේඛාශ්‍රීයෙහෝ;
මතගඉසිඟු, (මාතඞ්ග ජාතකයෙහි අපරිද්දෙන්) මාත
ඞ්ග තාපසයා විසින්; බට (සඳමඬල පළාගෙණ ලොක
යට බැස්සේය යන කථාපරිද්දෙන්) අවතීර්ණවූ; මග, මාර්ගී
ය; තව, මේකල් දක්වා; නොමැකුණෙද, මැකීනොගි
යේද්දෙහෝ; මෙබඳු සැකබිඳ, මෙසාකාරවූ ශඞ්කාබඩවූ;
ලපසඳ, ලාඤ්ජනයෙන් යුක්තවූ චන්ද්‍රයා; සබද, මිත්‍රය; බ
ලග. අවලොකනයකර-(මේ කාලයෙහි අම්බරය හා චන්ද්‍ර
යා උක්ත ප්‍රකාරයෙන් සැකකටයුතුසේ පෙණෙයි ශේෂී)

90 තුරුවැ ල උදුල සඳරැස්පිරි නුඹගැබ ද
බිඟුර ල බමන පිපිමල් නිල්වනහිස ද
ලෙලර ලූ වතල පෙණපිඩු සැදි සමුදුර ද
මනදෙ ල වඩා දූක දූක උන්සඳ සබ ද

90 තුරුවැල, තාරකාවලියෙන්; උදුල, උජ්ජ්වලිතවූ;
සඳරැස්පිරි, චන්ද්‍රමරීචියෙන් පිරුණාවූ; නුඹගැබද, න
භොගර්භයද; බිඟුරල, භෘඞ්ගශ්‍රේණීහු විසින්; බමන,
හැසිරෙන්නාවූ; පිපිමල්, මිනිදූපිර කුසුම්යෙන් යුක්ත
වූ; නිල්වනහිසද, හරිතවර්ණාරණ්‍ය ශීර්ෂයද; ලෙලල
රල, ලීලාපෙත තරඞ්ගයෙන්හා; වතලපෙණපිඩු, වි
සතෘත ඵේණපිණ්ඩයෙන්; සැදි, හෙබියාවූ; සමුදුරද,
සාගරයද; (යනාදෑ) මනදෙලවඩා, ප්‍රීත්සතුටුවඩා; සබ
ද, සකිය; දැකදැක් උන්සද, දර්ශනයකරමින් උන්ස
ලේහි,

91 සිඳුරැ ව උදයගිරිගජ දැඩි කුඹුතලු ට
වළඹ ව අඳුරැරැස් පිරි නුඹසමුදුර ට
සඟලෙ ව රතඹරෙකලෙස ඉඳුරැදිගඹ ට
සොඳුරැ ව අරැණුරැස් පැහිරෙයි පෙරඹර ට

91 උදයගිරි, උදයපර්වත නැමැති; දැඩි, බලවත්වූ; ගජ, හස්තීනුගේ; කුඹුතලට, කුම්භස්ථලයෙහි; සිඳුරැව, රුධිරසෙයින්ද, අඳුරැරැස්, අන්ධකාර ජාලයෙන්; පිරි, පිරුණාවූ; නුඹසමුදුරට, නභෝලක්ෂණ සාගරයට; වලඹව, වැඩබාගෙනි සෙයින්ද; එකලෙහි, එසමයෙහි; ඉඳුරැදිගඹට, ඉන්ද්‍රදිශාවනිතාවට; සඟලෙව්, සගයෙක්වූ; රතඹරෙකලෙස, රක්තවස්ත්‍රයක් සෙයින්ද; සොඳුරැව, මනාසේ; අරැණුරැස්, අරුණාලෝකය; පෙරඹරට, පූර්වදිග අහසෙහි; පැහිරෙයි, ප්‍රසාරිතවේ.

92 දරැ ණු උලැඟි කෝනල වන් සිත් සත නා
කුළු ණු සිහිල් මෙත්ගුණ පහවන ලෙසි නා
අරැ ණු කිරණරැස් පැතිරි පෙරදිගි නා
පිරැ ණු නරිඳුරැස් තරැ වියකෙයි ගුව නා

92 සතන, ජන්තූන්ගේ; සිත්, චිත්තයට; වන්; පැමිණියාවූ; දරැණු, රෞද්‍රවූ; උලැඟි, උසස්වූ; කෝනල, ක්‍රෝධලක්ෂණ වහ්නිය කාරණාකොටගෙණ; කුළුණු, කරුණාහු; සිහිල්මෙත්ගුණ, ශීතල මෛත්‍රී ගුණයන්; පහවනලෙසින, බැහැරවන්නාසේ; පෙරදිගින, පූර්ව දිගින්; අරුණු කිරණරැස්, අරුණාලොක ශ්‍රීන්; පැතිරි, විහිදී; ගුවන, අහස්හි; පිරැණු, පිරුණාවූ; නරිඳුරැස්, චන්ද්‍රකාන්තිහු; තරැ, තාරකාවන්; වියකෙයි, මැකේ.

93 පියුමා කර මඳ මඳ පුබුදිනා තඹ ර
ඇසිරැ කර හෙන බිහදුල් දිසි එව ර
සිලිලා කර වෙන ගම් බිම් දැක නොනැ ර
තොදයා කර සෙද සිත සතොසව මිතු ර

93 පියුමාකර, පද්මිනියෙහි; මදමද. මදින්මද; පුබුදින්, ප්‍රබොධවනනාවූ; තඹර, තාමරසයන්; ඇසිරැකර, ආශ්‍රයකෙරෙමින්; හෙන, පතිතවනනාවූ; බිඟුදැල්, භෘඞ්ගජාලාවන්; දිසි, දෘශ්‍යවනනාවූ; එවර, එකල්හි; සිලිලාකරවෙත, සාගරසනතයෙහි; ගම්බිම්, ග්‍රාමභූමින්; දක, දශීනයකොට; මිතුර, මිත්‍රය; තොද, තෝද; සිත සතොසව, චිත්තසනතුෂ්ටව; සෙද, වහා; නොහැර, නොවැලකා; යාකර, යාත්‍රාකර.

94 පතඟ කිරණ දුරුකල තුරුසෙවනැ ල්ල
තරඟ රඟන රඟබිම්රඟ සුදුවැ ල්ල
සිතඟ ලෙසට පියතෙපලැති ලියගො ල්ල
බලග මිතුර පෙරමග සැදි කලමු ල්ල

94 පතඟකිරණ, සූර්‍ය්‍යරශ්මිය; දුරුකළ, බැහැරකලාවූ; තුරුසෙවනැල්ල, වෘක්ෂච්ඡායා ඇති; තරඟරඟන, ඌර්මිනෘත්‍ය පවත්වනලද; රඟබිම්රඟ, නෘත්‍යභූමි ආකාරවූ; සුදුවැල්ල, ශ්වෙතවාලුකාතලඇති; සිතඟ ලෙසට; සිත්හි අධ්‍යාශයමෙන්, පියතෙපලැති, මධුරාලාප ඇතතාවූ; ලියගොල්ල, ස්ත්‍රී සමූහයා ඇති; පෙරමග, පූර්වමාර්ගයෙන්; සැදි, සජ්ජිතවූ; කලමුල්ල, එනම් ග්‍රාමය; බලග, අවලොකනයකර.

95 පසියාගල වෙහෙර-මුනිරූ බලා වෙසෙසින
වසියාකරන්මනරම්-පලරන්හිසින් සතොසින්

95 පසියාගල, එනම්ගම; වෙහෙර, විහාරයෙහි; මුනිරූ, බුඩරූපය; බලා, අවලොකනයකොට; වෙසෙසින්, විශෙෂයෙන්; මනරම්, සිත්කළුවූ; පල, ඵලයන් ඇති; රන්හිසින්, අරණ්‍ය ශීර්ෂයෙන්; සතොසින්, සනෙතාෂයෙන්; වසී, වහා; යාකරන්, ප්‍රයාණයකරන්.

96 සි ත් ස න ගන රත් ලවනාත බිඹු පලය
වෙ ත් ව න සත මත් වන මියුරුතෙ පලය
අ ත් ව න සකි නෙත්යුග තගෙලත්පලය
ම ත් ගො න කෙළියුන් ලියසැටි දක පලය

96 සිත්සනහන, චිත්තාශ්වාසනකරන්නාවූ; බිඹුපලය, බිම්බඵලාකාරවූ; රත්ලවනත, රක්තාධරඇති; මෙත්වනසන, සම්පවන ජනයා; මත්වන, උමතුවන්නාවූ; මියුරුතෙපලය, මධුරාලාපඇති; ෂාංග, නාගේ; නෙත්යුගලත්පලය, දෘග්යුග්මප්‍රාප්ති ඵලය; අත්වන, අයිති වන්නාවූ; මත්ගෙන, එනම් ගමිනි: කෙළිසුත්, ක්‍රීඩායෙන් යුක්තාවූ; ලියසැරි, ස්ත්‍රීන්ගේ ස්වභාව; දක, දර්ශනයකොට; සකි, සහලුව; පලය, පසුකොට යව.

97 රන් පන් සවන් යොන්ලිය රඳනා නිමල
සන් රන් රුවන් සල්පිල් සොබනා ගෙවල
බන් නන් දෙදෙන් බබලන සිඳුනා අසල
මන් සන් තොයින් තො ගොසින්වැද බේරුවල*

97 සවන්, කර්ණයෙහිබැඳූ; රන්පන්, ස්වර්ණතාඩඇති; නිමල, නිර්මලවූ; යොන්ලිය, යොනක ස්ත්‍රීන් හෝ යෞවන ස්ත්‍රීන්; රඳනා, රඳන්නාවූ; රන්රුවන්, ස්වර්ණමාණික්‍යයෙන්; සන්, ගැවසුනා; සල්පිල්, මණිශාලා ඇති; සොබනා, ශෝභනවූ; ගෙවල, ගෘහයන් ඇති; බන්, බඳනාලද; බබලන, භ්‍රාජිතවන්නාවූ; නන්දෙදෙන්, නානාධ්වජයෙන් යුක්තාවූ; සිඳුනා අසල, සින්ධුස්වාමිහෝ සමුද්‍රආසන්නයෙහි; බේරුවල, එනම් ගමට; මන්සන්තොසින්, සිත් සතුටින්; තො, යුෂ්මත්තෙමේ; ගොසින්, ගමනයකොට; වැද, පැමින.

98 මත් වනා අඹින් කංසා කා රළු පර ළු
අත් තන කුසුම් රත්මල් කණලා ලකු ළු
ගත් වනා මුගුරු ලෙලවා ඇදඇදෙරවූ ළු
සිත් මෙන බමන බඹුරන් රඟ බල යහ ළු

98 මත්වන, උම්මත්තවන්නාවූ; රළුපරළු, ප්‍රකෘතියෙන් රළුවූ; අඹින්, අහිඵේනහා; කංසා, කංසාද; කා, ඛාදනයකොට; අත්තනකුසුම්, උම්මත්තපුෂ්පයන්හා; රත්මල්, රත්මල්ද; කණලා, කර්ණයෙහි බහා; ලකුළු, අලංකෘතවූ; ගත්, ගන්නාලද; වනමුගුරු, වනමුද්ගර

* බැරුවල-බොහෝ.

ඇති; ලෙළෙමා, ලීලාලෝපනකරමින්; රඹුඩ, ගමන්දුරුගාජීන්; ඇලැදද, ඇදීමින්; සිත්මෙන, සිත්වූපරිද්දෙන්; බමන, හැසිරෙන්නාවූ; බඹුරන්රශ, සුරඟනාඹුන්ගේ ස්වභාවය; සහවි, මිත්‍රය; බල, අවලොකනයකර.

99 නොබැ ද විදෙන වරලස මල් පටින් පටින්
නොහැ ද නාව ගිළිහෙන සළුපටින් පටින්
පැහැ ද තමෙන දිවඑන ලිය වටින් පිටින්
සබ ද නොසිටගාගන්බෙන්නොපින්තුටින්

99 නොබැඳ, බන්ධනය නොකිරීමෙන්; විදෙන, විහිදෙන්නාවූ; මල්පටින්පටින්, කුසුමපට්ටයෙන් යුක්තවූ; වරලස, ධම්මිල්ල ඇති; නරමෙනොහැඳ, නාරයේ නොහැඳ; ගිළිහෙන, මිදෙන්නාවූ, සළුපටින්පටින්, සාටකපට්ටයෙන් යුක්තවූ; තමෙනපැහැද, තමාකෙරෙහි ප්‍රසන්නවූ; වටින්පිටින්, හාත්පසඇතහාගයෙන්; දිවඑන, ධාවනයකෙරෙමින්එන; ලිය, ස්ත්‍රීන්ඇති; බෙන්නොපින්; එනම් නිච්චප්‍රදෙශයෙන්; සබඳ, සගය; තුටින්, තොෂයෙන්; නොසිට, නොනැවත; යාගන්, ගමනගනු.

100 විදිනා සේ මනු සගමොක්සැප නොම ද
වනවා සේ වෙහෙරට ගොස් වැද සබ ද
දුටුවා සේ දිව කුරුමුනිඳුන් පැහැ ද
සවබෝ සේ බුහුමන් වඩවමින් වැ ද

100 සබඳ, සහලුව; මනු, අනාගතයෙහි; නොම්දසගමොක්සැප, අමන්ද ස්වර්ගමොක්ෂසම්පත්තීන්; විදිනාසේ, ලබනුසඳහා; වනවාසේ වෙහෙරට, වනවාස විහාරයට; ගොස්වැද, ගොසින්පැමින; දිවකුරුමුනිඳුන්, දිව්‍යකාරශබ්දයෙන්; දුටුවාසේ, දර්ශනයකරන්නාමෙන්; පැහැද, ප්‍රසනා; සිටි, (ඒකාන්තපක්ෂව) සිටිනව; බෝසේ, බොහෝසෙයා; බුහුමන්වඩවමින්, බහුමානවර්ධනයකෙරෙමින්; වැඳ, වැඳලා.

401 දිඹුසර නාය රුසිතරන් පැදනාස කාය
සැදී අල කාය ඇදි නලලතෙහි තල කාය
සිටි නිස කාය ලදකොමලහනන් දූ කාය
සරකර කාය වැද යව මගනොවැල කාය

101 රුසිරෙන්, රුචිරයෙන්; දන, ජනයන්ගේ; සඳසඳ වැසුවට; දිවසරකැ, දිවයවනිතාදෙහය; පෑ, ප්‍රත්‍යක්‍ෂ කොට; අලසාසැදී, කිංසුරිජියෙන් * ගෙව්වාවූ; නළල් තා, ලලාටතලයෙහි; තිලකසැදෑ, තිලකයන්දැදලා; නි සකය, නිශ්ශබ්දව; සිටි, සිටියාවූ; ලඳුනෙ මලනනන්, තරුණිකොමලාඞ්ගනාවන්; දුකාය, දර්ශනයකොට; පර තරකය, එනම්නදීප්‍රදෙශයෙහි; වැද, පැමිණ; නොවැලකා, නොවැලකී; මගය, මාර්ගයෙහියව.

102 ඒලිකො ට අවා රිවි බට සිඳු මැදුරත ට
ඒකවි ට ලොවට ඵලිබ ට ගනඳුරකඳ ට
රොසකො ට යුදට අඹරට සඳ ඒනකල ට
වැලිතො ට ගමට ලැගුමට ගොස්මගනොසිට

102 අවට, භාන්පය; එළිකොට, ආලොකකොට; රිවි, සූර්‍ය්‍යයා; සිඳුමැදුරත, සින්ධුමන්දිරාභ්‍යන්තරයට; බට, අවතීර්ණවනකල; ලොවට, ලොකයට; ඒකවිට, ඒකක්‍ෂණයෙහි; එලිබා, බැහැරබමුවාවූ, ගනඳුරකඳට, ඝනාන්ධකාරයට; රොසකොට, ක්‍රොධකොට; යුදට, යුද්ධපිණිස; සඳ, නිශාකරයා; අඹරට ඒනකලට, ආකාශයට ඒනකල්හි; මග නොසිට, මාර්ගයෙහිනොසිට; ලැගුමට, විශ්‍රාමයපිණිස; වැලිතොටගමට, එනම්ග්‍රාමයට; ගොස්, ගමනයකොට.

103 නිල්පැහැබ ර කොළඅතු මැදුරු විසිතු රේ
දිගු තරස ර කඳුමග විහිදි මනහ රේ
රැදි පියක ර බිඟු දඳ සෙනග නොවිත රේ
තුරු කදතු ර සැතපෙව අම්බලම්කෙ රේ

103 නිල්පැහැ, ශ්‍යාමවර්ණයෙන් යුක්තවූ; කොළ, පත්‍රයන්ගෙන්; බර, භාරවූ; විසිතුරේ, විචිත්‍රවූ; අතුමැදුරු, රිකිලිමැදුරුඇති; දිගු, දීර්ඝවූ; තරසර, ස්ථිරසාරවූ; මනහරේ, සිත්කාඩුවූ; මහවිහිදි, විශාලවවිහිදුනාවූ; කඳ, ශාඛාඇති, නොවිතරේ, සබ්බාභිකාන්තවූ; පියකර, ප්‍රියංකරවූ; බිඟු, භෘඞ්ගයන්හා; දඳසෙනග, පරපුටුසමූහයාවිසින්; රැදි, රඳනාලද; අම්බලම්කෙරේ, විශ්‍රාමශාලාසමීපවූ; තුරුකදතුර, වෘක්‍ෂස්කන්ධාභ්‍යන්තරයෙහි; සැතපෙව, සන්තර්පිතවෙව.

---

* මෙකල තරුණියෝ නළල මතෙහි [illegible] [illegible] නයෙන්ද ගොතනලද "භ්‍රමරක" නම් [illegible] [illegible].

සබඳ තොප එහි නිවාස ග්‍රහණයකොට උන්කල්හි ඒ විශ්‍රාමශාලොපගත නෛක ජනසමූහයාගේ මෙබඳු අන්‍යොන්‍ය වර්ණනාවිශෙෂයකුදු පවත්නේය - එද - තොපගේ කර්ණයෙහි වර්ණිත ප්‍රකාරසාර.

සගය තොප එම සහසතකඩයෙහි නවාතැන්ගෙණ උන්කල ඒ දෙඹුල්හලට පැමිණිනාවූ නොයෙක් ජනසමූහයාගේ මෙබඳුවූ ඔවුනොවුන් වර්ණනාවිශෙෂයක්ද ඇත්තේ ස-තෙද-තොපකණ්සුවන් ප්‍රකාරසාර.

104

සපැමිණ දෙසතුරෙ න්
සරනගව මිගයතුරෙ න්
සැදිනත්පලතුරෙ න්
තුටුවසැතපුනුදනන්අතුරෙ

105

අවාමග අවර ණ
සිඳුනරණ සැප අපම ණ
ගුණගණගෙණ එළඹ ණ
කියනිසමහරු බුදුන්ගේගු

104 දෙසතුරෙන්, (නානා) දෙශාන්තරයෙන්; සපැමිණ, සම්ප්‍රාප්තව; මිගයතුරෙන්, මාර්ගාන්තරයෙන්; සරනගව, ශ්‍රමහෙසවපැමිණී; සැදී, සජ්ජිතවූ; නත්පලතුරෙන්, නානාඵලවර්ගයෙන්; තුටුව, සතුටුව; සැතපුනු, සන්තර්පිතවූ; දනන්අතුරෙන්, ජනයන්අතුරෙන්.

105 අවාමග, අපායමාර්ගයා; අවරණ, ආවරණයකරන්නාවූ; අපමණසැප, අප්‍රමාණසම්පත්; සිඳුනරණ, සිඳකරන්නාවූ; එළඹණ, තෙශහලිඛණීයන්; ගුණගෙණ, උද්ග්‍රහණයකොට; සමහරු, ඇතම්කෙනෙක්; බුදුන්ගේගුණ, බුද්ධගුණයන්; කියති, කථනයකෙරෙත්.

106

නොයෙක් මිසදිටුන ත්
නොයෙක් කව්නළුරසද ත්
පෙර තමතමනුන ත්
රඹසිතාකතා තෙපල ත්

107

සමහරු උදා රා
උනුනට වෙමින් වා රා
බසින් බස සා රා
කියති සිත්නාමපද තෝ

106 නොයෙක් මිසදිටුගත්, අනෙකමිථ්‍යාදෘෂ්ටිගතවූ; නොයෙක් කව්නළුරස, නානාවිධ කාව්‍යනාටකාරයන්; දත්, විජානනයකළාවූ (නැනැත්තෝ); පෙර, පූර්වයෙහි; තමතමනුනත්, තමතමන්උගත්නාවූ; රඹසිතාකතා, රාමායණකථා හා සීතාකථාවන්; තෙපලත්, කියත්.

107 සමහරු. ඇතම්කෙනෙක්; උදාර, උතුම්ව; උනුනට, අන්‍යොන්‍යයන්ට; වාරවෙමින්, අවමරීව; බසින්බස, එමනයෙන්වචනයෙ; සාර, සරුකොට; සිත්නාමපද,

චිත්‍රනාමිපදයන් හෝ චිත්‍රපද්‍යාක්‍ෂයන්, හෝරාකියති, වි සඳ ක්‍යත්.

108

වෙනවෙනම පැසී
කියමින් උතුන් මාසී
සමගරු සිනාසී
කියති සිවුපද දෙපදුරුසී

109

රුපුන්මන් සින්දූ
දිසැදද දිගතැ රැන්දූ
රඳුනම්නි බැන්දූ
කියති සමගර අනෙක් සින්

108 වෙනවෙනම, වෙන්වෙන්ව; පැසී, සම්හිව; උතුන්, අනෙ‍්‍යාන්‍යයන් විසින්; මාසීක්යමින්, මහසිබෙණෙමින්; සමගරු, ඇතම් කෙනෙක්; සිනාසී, හාස්‍යකොට; සිවුපදදෙපදරුසී, චතුෂ්පදද්විපදයරුසීන්; කියති, කථනය කෙරෙත්, 109 රුපුන්මන් සතුරන්ගේ ප්‍රියමානය; සින්දූ, භින්නකරවූ; දිගත, දිශාන්තයෙහි; දිසැදද, ජයධ්වජයන්; රැන්දූ, රඳවූවාවූ; රඳුනම්නි, රාජයන්නාමින්; බැන්දූ, බන්ධනයකරණලද; සිඳු, සංගීතක්‍රමයෙක්; සමගර අනෙක්; ඇතම්කෙනෙක්; කියති, කථනයකරත්.

110

නරනිඳුනට සොඳුරු
බඳුයස සොලොස් විසිතුරු
දන පඬුරුත් මියුරු
කියාවනපොත් කරති සමග

111

සමගරු උන්බිසින්
පිබිද ඉඳුගෙණ සතොසින්
පවසති සැඩගොසින්
නිරිඳුවිරුදාවලි සතොසින්

110 සොඳුරු, සුන්දරවූ; නරනිඳුනට, නරේන්ද්‍රයන්ගේ; යස, කීර්ති ශරීර සම්බන්ධකොට; බඳ, බන්ධනයකරණලද; විසිතුරු, විචිත්‍රවූ; සොලොස්, ශ්ලෝකයන්ගේ; මියුරුපඬුරුත්, මධුර පදාර්ථයන්; දන, ජනනයකොට; කියා, කථනයකෙරෙමින්; සමගරු, ඇතම් කෙනෙක්; වනපොත්කෙරෙති, හදාරති. 111 සමගරු, ඇතම්කෙනෙක්; උන්බිසින්, ඔවුන්ගේ කථායෙන්; පිබිදඉඳු ගෙණ, ප්‍රබුද්ධව හිඳගෙණ; සතොසින්, සන්තොෂයෙන්; නිරිඳු, නරේන්ද්‍රයන්ගේ; විරුදාවලී, විරුදාවලීකතීන්; සැඩගොසින්; චණ්ඩඝොෂාමෙන්; පවසති, කියති.

112

පෙර ලක්දිව නොමද
රජකළ රජුන්ගේ ගොද
ගුණෙණිනි බඳ සිවුපද
කියති සමගර මහත්ලෝ ඉද

113

පඬිනිරිඳු ගෑනසස්
පැහුබිදේරණ අනසස්
දිහුවසි විරිඳුයස්
අනෙක් පවසති ඔහුගෙ වෙසෙසක්

112 පෙර, පූර්වයෙහි; ලක්දිව, ලංකාද්වීපයෙහි; රජ කළ, රාජ්‍යය කළාවූ; නොමද, බොහෝවූ; රජුන්ගේ, නරේන්ද්‍රයන්ගේ; සොඳ, සුන්දරවූ; ගුණෙණි, ගුණයෙන්; මිද, බඳනාලද; සිවුපද, චතුෂ්පදයන්; සක්හරමහල් ලෙල්, ඇතැම් ප්‍රාණීහු; ඉඳ, නිශ්ශබ්දකොට; කියති; කවි නායකාරෙන්. 113. නැනාසන්, ඥානවත්වූ; පඬිනි රිඳු (දඹදිව විසූ) පඬිනරේන්ද්‍රයා; මුලුදෙරණ, සකල ධරණියෙහි; අනසක්, ආඥාචක්‍රය; පැ, ප්‍රකාශකොට; විරිඳුන්, වෛරිසමූහයා; දිනුවයි, ජයගත්තේයයි; දෙසෙන්, ඇතැම්කෙනෙක්; මුහුගේ, ඒ නරේන්ද්‍රයාගේ; බෞෂ්ගසක්, විශේෂයක්; පවසති, කියති.

| 114 | | 115 | |
|---|---|---|---|
| සොළි පාඬි ලාර | ඒ | ජයගෙණ රුපුර | දුන් |
| ගුජ්ජර තුඹර මහර | ට | තුටුකර සියල් දිළි | ඳුන් |
| තෙළිඟු වඟුරට සි | ට | විඳ සව්සිරි නා | ඳුන් |
| පැමිනි දන කමනමන්ගේ ර | | වණන රජකරණාරඟ නි | රිඳුන් |

114 සොළි, සොළීරටය; පාඬි, පාඬිරටය, ලාරට, ලාඩරටය; ගුජ්ජර, ගුජ්ජරරටය; තුඹර, එනම් රටය; මහර ට, මහාරාෂ්ට්‍ර (මරාඨ) ය; තෙළිඟු, තෙළිඟුරටය; වඟුරට සිට, වඟුරටය (යන මේ නිරාෂ්ට්‍රයන්හි) සිටලා; පැමිනි, ප්‍රාප්තවූ; දන, ජනයෝ; කමනමන්ගේරට, සියසියරටෙහි

115 රුපුරදුන්, වෛරිනරේන්ද්‍රයන්; ජයගෙණ, පරදවා; සියල්දිළිඳුන්, සකලදරිද්‍රයන්; තුටුකර, (මහදන් පැවැත්වීමෙන්) සතුටුකොට; නඳුන්, නන්දනීයවූ, සව්සි රි, සකලශ්‍රීන්; විඳ, විඳනයකොට; නිරිඳුන්, නරේන්ද්‍ර යන්; රජකරණරඟ, රාජ්‍යකරණපරිද්දි; වණනා, වර්ණනාකරණුම.

| 116 | | 117 | |
|---|---|---|---|
| අප නිරිඳු සහ | සා | දිනමිණි කුලනෙ | න් |
| නොකීසා ඔවුන් සහ | සා | ගිරිදොඹවෙ ලකා | න්* |
| පවසන බස් අ | සා | ඵෂීන්ප රජුපම් | න් |
| පවරනුව නැතිදෙනෝවෙසෙ | | මෙසේ අසවයි කියා පවස | |

116 අපනිරිඳු, අස්මත්ස්වාමී නරේන්ද්‍රයාණන්; සහසා, නිරන්තරයෙන්; නොකීසා, කට්නසනොකොට, ඔවුන්, ඔවුනු; සහසා, සාහසිකව; පවසන, කියන්නාවූ; බස්, වචනයන්;

* යහමක්-සි උඩරට පොත්.

වෙසෙසානුවනැති, විශිෂ්ටඥාණයෙන් යුක්තවූ; පවර, ප්‍රවරවූ; දනෝ, ජනයෝ; අසා, ශ්‍රවණයකොට. 117 දිනමිණිකුල, සූර්‍ය්‍යවංශයට; අගපත්, අග්‍රප්‍රාප්තවූ; සිරි ගෙදොම්, නරේන්ද්‍රයෝම; සැහැපත්වේ, (ලෝවැස්සන්ට) සැපත්වන්නාහ; ඒසින්, එහෙයින්; අපරප්‍රවත්, අපගේ රාජ්‍යසම්බන්ධිවූ ප්‍රවෘත්තිය; අසමයි, ශ්‍රවණයකරව යි; කියා, කථනයකොට; මෙසේ, මෙපරිද්දෙන්, පමසත්, කියත්.

| 118 | | 119 | |
|---|---|---|---|
| තෙදින් රිවිබි | ම් බා | මෙරද සිරි සර | ණය |
| නිරිඳුසඳ පැරකු | ම් බා | නිරිඳුන් මුදුන් බර | ණය |
| රුපු සිඳුකල | ම් බා | සිරිසඳට වර | ණය |
| කෙලෙය විරුසිරියඳ ඔ | ලොම්බා | වේය මුලුලොවට එකස | රණය |

118 තෙදින්, තෙජසින්; රිවිබිම්බා, ආදිත්‍ය බිම්බයබඳුවූ; පැරකුම්බා නිරිඳුසඳ, පරාක්‍රමබාහු නරශ්‍රේෂ්ඨයා; රුපුසිඳු, සතෘසාගරය; කලම්බා, ආලොලනයකොට; විරුසිරියඳ, වීරශ්‍රීවධූතාව; ඔලොම්බා කෙලෙය, අවලම්බිතකෙළේය 119. නිරිඳුන්, නරේන්ද්‍රයන්ගේ; මුදුන්බරණය, මකුටාභරණවූ; මෙරද, මේ රජ්‍යාගේ; සිරිසරණය, ශ්‍රීචරණය; සිරිසඳට, ශ්‍රීදේවියම; වරණය, ආවරණයහ; මුලුලොවට, සමස්තලොකයට; එකසරණයවේ, අසහාය සරණවේ.

| 120 | | 121 | |
|---|---|---|---|
| බලකොටු ගිරිඳුදු | එ | සුදදප පසි | න්දු |
| බලසෙන් සමග තෙදර | එ | ඔවුන් බිඳලුහුබ | න්දු |
| බුන් තැනතැන අඹු | එ | යස දසත අ | න්දු |
| නැඹුළු වකුමැති නොයෙක් රජමු | එ | කොලෙයමුලුදඹදිවට හි | න්දු |

120 ගිරිඳුදුළු, පර්වතෙන්ද්‍රයන්හිවූ; බලකොටු, බලකොෂ්ඨයන්හි; තෙදරළු, මණ්ඩපරුළුවූ; බලසෙන්සමග, හස්ත්‍යසෙනාසහිතවූ; නැඹුළුවිකුමැති, මහත් වික්‍රම ඇත්තාවූ; නොයෙක්රජමුළු, නානාරාජසමූහයා; බුන්, බිඳහකොට; තැනතැන, තන්හිතන්හි; අඹුළු, ආවෘතකෙළේය. 121 ඔවුන්, ඒ සතුරන්ගේ; සුදදප, සුඛාපාව; පසිඳුදු, ප්‍රච්ඡන්නකොට; බිඳලුහුබන්දු, භග්නකොට එළවා; යස, කීර්තිය; දසත, දිශාන්තයෙහි; අන්දු, ආලම්බනකොට; මුළුදඹදිවට, සකල ජම්බුද්වීපයට; හින්දුකෙළෙය, අපහාසකෙළේය.

**122**

දසටක් ගිරිඳුද ළු
ජයගෙණ විකුම්තෙදර ළු
හළදළ රැපුඅඹු ළු
දරැනුමරසෙන්අසුරැබලමුළු

**123**

අඹිලු මෙරමතවැ ඳ
වෙරළු ගිලිසිඳු දියස ඳ
රොසකර ගොසනොම ඳ
ඇවිත්වන්සඳ යුදටඑකබඳ

122 දසටක්, දශබාහුසම්බන්ධතාවූ; ගිරිඳුදළු, පර්වත ශ්‍රීයන්; ජයගෙණ, ජයග්‍රහණයකළාවූ; තෙදරළු, දුඃසි සකීෂවූ; විකුම්, වික්‍රමඇති; රැපු, සතුරන්; අඹුලු, අශාසනකොට; හළු, බැහැරලූ; දළ, දැඩිවූ; දරුණු මරසෙන්අසුරැ, ඝොර මාරසෙනාබඳුවූ; බලමුළු, (මොහුගේ) භටසමූහයා. (මතුසම්බන්ධයි)

123 රොස, කොපව; නොමඳගොසකර, අධිකඝොෂපැවැත්වීමෙන්; ඇවිත්, ආගමනයකොට; යුදට, යුද්ධපිණිස; වන්සඳ, වන්කාලනී; මෙරමත, මෙගැකූමත් තෙනි, වැද, හැපී; අඹිල, ආවෘතතාව; වෙරළ, වෙළාතාය; ගිලි, ගැලූ; සිඳුදිය සඳ, සමුද්‍රජලස්කන්ධයහා; එකබඳ, එකසදෘශයි.

**124**

මැතිසෙනග සළු සා
සාපාපවුන සත සා
ගෙණ අදහසලෙ සා
නිබිය පස්වාදහස්යස සා

**125**

මෙනරපව රයා
හළනැව් සෙන්පු රයා
අනර උදු රයා
ගතිරයත්වලව රයා

124 මැතිසෙනග, මන්ත්‍රීසෙනාව; සළුසා, මෙහෙයා; සාපාපවුන, එනම්දිශාව; සතසා, මනාව; අදහසලෙසා, අධ්‍යාසයෙයින්; ගෙණ, ග්‍රහණයකොට; පස්වාදහස්, පඤ්චගුණිතදශවර්ගයක්; යසසා, කීර්තිය; නිබිය, පැවැත්විය,
125 මේනරපවරයා, මෙ නරෙන්ද්‍රවරයා; නැව්පුරයා, නාවුකා පුරවා; හළු, යැවූ; සෙන්; සෙනාතොමෝ; අනර, අනතරප්‍රදෙශයන්; උදුරයා, අත්පත්කොට; රයත්වලවරයා, එනම් යාත්‍රාතීර්ථය; ගති, ග්‍රහණයකළා.

**126**

දඹදිව සොළිර ට
ආදිව රාම්පවුන ට
මහසෙනඟ යුදය ට
සවා මහනැව්පිමින් එකවිට

**127**

නිබඳබඳ යුදසො ඩ
දෙමළ බළසෙන් බලුමැ ඩ
දඹදිව්තලුනිහ ඩ
කෙලෙස්සිරිලක්දිවටදියැවැ

126 දඹදිව, ජම්බුද්වීපයට හා; සොළිරට, සොළිදෙශ ය; ආදිව, ආදිවූද; රාම්පවුනට, රාමපට්ටනමටද; යුද

සට, සුබපිණිස; මහනැව්පිවින්, මහානාවුකාපිවින්; එක විට; එක්ඇසිලෙනි: මඟ ගනාග, මහාසෙනාව; ඇවා, ගමන්කරවා. 127 නිබඳ, නිරන්තරයෙන්; බඳ, බඳිනලද; සුදසොඩ, සුඩාසඇති; තෙදබලයෙන්, ද්‍රවිඩ භට සෙනාවගේ; බල, ශක්තිය; මැඩ, මඩිනයකොට; දඹදිවිතල, ජම්බුද්වීපතලයෙහි; නිගා, යශෝඝොෂාහා; සිරිලක් දිවට, ශ්‍රීලංකාධිපයට; දියවැඩකෙළේ, ජයාභිවෘද්ධිකොළේය.

128

නෙවිකුම් විකුම් ඇති
අපනිම් දිනිඳුකුලපති
පෙර නිරිඳුන් අගති
තුවූ දසවක්වන්නි ජයගති

129

සියගණනක් මෙමෙසේ
රුදුරණු දිනාමෙවෙසෙසේ
දක්වී සසරුසේ
මහළු පැරකුම් නිරිඳු විලසේ

128. නෙවිකුම්, විෂ්ණුබඳුවූ; විකුම් ඇති, වික්‍රම ඇති; දිනිඳුකුලපති, සූර්‍යවංශාධිපතිවූ; අපනිම්, අපගේ ස්වාමිතෙමේ; පෙරනිරිඳුන්, පූර්ව නරෙන්ද්‍රයනට; අගතිතුවූ, සටත්තුවූ; දසවක්වන්නි, දශවාදශවන්නි; ජයගති; දිනූයේය. 129 මෙමෙසේ, මෙපරිද්දෙන්; සියගණනක්, ශතප්‍රමාණයක්; රුදුරණු, රෞද්‍ර යුද්ධයන්; මෙවෙසෙසේ, විශේෂයෙන්; දිනා, ජයගෙන, මහළුපැරකුම්නිරිඳුවිලසේ, මහළු පරාක්‍රමබාහු නරේන්ද්‍රයාසෙයින්; සසරුසේ, කීර්තිරශ්මිය; දක්වා, පෙන්වා.

130

පිවිස මුළුලෝකු ස
සුගකෙළුසයුරු ගොසලෙ ස
මැඩ රුපු රජයස ය
කොතන නොපතළෙද මොහු ජයගොස

131

දිසි දසදෙස ගොසින්
මොහුගෙඅනාකවෙසෙසින්
සැණමල්දම්ලෙසින්
කාවර රද නොදැරීදසිරසින්

130 සුගකෙළුසයුර, කල්පාන්ත සාගරයා සම්බන්ධිවූ; ගොසලෙස, ඝොෂාසෙයින්; මුළුලෝකස, සකල භූතලයෙහි; පිවිස, ප්‍රවිෂ්ටව; රුපුරජ, ශත්‍රුරාජයන් ගේ; යසස, කීර්තිය. මැඩ, මඩිනසුලාවූ; මොහු, මොහුගේ; ජයගොස, ජයඝොෂාව; කොතන, කිනම් ස්ථානයෙක්හි; නොපතළෙද, පැතිරනොගියේද.

131 දසදෙස, දශදිගන්හි; ගොසින්, ගමන්කොට; වෙසෙසින්, විශේෂයෙන්; දිසි, දිශෙවූ; මොහුගෙ, මේ නරෙන්ද්‍රයාගේ; අනාක, ආඥාචක්‍රය; සැණමල්දම්ලෙසින්, ස්වර්ණමාලාදාමයක්සේ; කාවරරද, කිනම්රාජයෙක්; සිරසින්, ශීර්ෂයෙන්; නොදැරීද, නොපැළැන්දේද.

| 132 | | 133 | |
|---|---|---|---|
| නමනතදු අනවිල | ඳු | මුවදඹදිව අව | ට |
| නිම්සාර සතරදලනි | ඳු | බැලුවත් දෙරණවිකුම | ට |
| පිම්බූසැඩවිරි | ඳු | මෙඅප නරනිඳුහ | ට |
| පසිඳු කනනාධිනිරිඳුන්ගේ රුදු | | ඇද්ද සරිවනරජෙක් මෙක | ට |

132 උද, සාදුම්; නමතෙදනට. සකීර්තිනාමජෝතක වූ; සතරදලනිඳු, චතුස්සාගරය; නිමසාර, සීමාකොට; පසිඳු, ප්‍රසිද්ධවූ; කනනාධිනිරිඳුන්ගේ, කානනාධිනරේන්ද්‍රයා ගේ; රුදු, රෞද්‍රවූ සැඩවිරිද, මණ්ඩලේශ්වරයා; පිඹු, පිම්බනාරසේය. 133 මුවදඹදිව, සකලජම්බුද්වීපයෙහි; අව, හාත්පස; බැලුවත්, බැලුවේනද; මෙඅප, මේඅපගේ; නරනිඳුනට, නරේන්ද්‍රයාහට; සරිවනරජෙක්, සදෘශවූ රජෙක්; මෙක ට, මේකාලයෙහි; දෙරණ, ධරණියෙ හි; ඇද්ද, විද්‍යමානද.

| 134 | | 135 | |
|---|---|---|---|
| බෙලෙන්බලදෙවිඳු | නා | සිව් මුළුලොව දි | ළී |
| අප නරනිඳුට සිරිම | නා | තොපනු අනාමසක් නොමැ | ළී |
| නොවී නිති අවන | නා | කවරෙකු අනබ | ළී |
| කවර නිරිදෙක් ඉදිද මෙදිය | | විද පරරජ ගජන් හැකි | ළී |

134 බෙලෙන්, ශක්තියෙන්; බලදෙවිඳුන, බලභද්‍රයාබඳුවූ; සිරිමත, ශ්‍රීමත්වූ, අපනරනිඳුට, අපගේනරේන්ද්‍රයාට; නිති, නිත්‍යකාරයෙන්; අවනනොවී, නතනොවූ, කවරනිරිදෙක්, කවරනරේන්ද්‍රයෙක්; මෙදියන, මේජගත්හි; ඉදිද, ඉඳිද. 135 මුළුලොව, සියලුලෝකයෙහි; දිළිසිව, දීප්තිමත්ව සිටියාවූ; නොමැළී, මලානනුවූ; තොපනු, තොපගුණ; අනාමසක්, ආඥාමුත්; කවරෙකු, කිනම් කෙනෙකුගේ; අන, ආඥාවක්; බලී, බලවත්වූ; පරරජ, අන්‍යරාජයන්ගේ; ගජන්, හස්තීන්; හැකිළීවද, සංකෝචකළද.

| 136 | | 137 | |
|---|---|---|---|
| වසන හැම දිඳු | ලේ | ජයගෙණමුළුදෙර | ණා |
| රුදුරු පුරඳුන්දප | ලේ | පෙන්වාහමින් කන්දඅ | ණා |
| රැඳුදපඹුළුසො | ලේ | ලකවකනිරවර | ණා |
| කුඹනවිකුම්ක්දමෙහිනුනොක | | කෙලේ අපනිම්විකුම් අ | ණා |

136 හැමදිසිලේ, සියලුදිශාවන්හි; වසන, වසන්නාවූ; රුදු, රෞද්‍රවූ; රුපුරඳුන, සතුරුරාජයන්ගේ; දපලේ, දප

සහලේය; උවිඳද, උපෙන්ද්‍රයාද; පසුකෙලේ, පැරැදූයේ; ජොනු, මේරුණ්‍යාවසින්; නොකෙලේ, නොකරණලද් දේ; කුමනාට කුමක්ද, කිනමට කුමක්ද. 137 මුදිදෙර ණ, සකලධරණිය; ජයගෙණ, ජයග්‍රහණයකොට; ත මන්. තමාගේ; තෙද, තෙජසහා; ඝන, අධිකව; පෙන්වා, දක්වා; අපමණවිකුම්, අප්‍රමාණවික්‍රමඇත්තාවූ; අපනිම් අපගේස්වාමියා; ලක, ලංකාව; එකනිරවරණකෙලේ, එක (යොවන) ජත්‍රකෙලේය.

138

දසදහසක් යොදු න්
දඹදිව දිනූ විරිඳු න්
දම්යෝ නරඳු නි න්
ම්සක්නවරෙක්සරිදමෙරදු

139

තමකුළෙසට මනු ත්
වනලෙසට ලක එකස ත්
පෙන්වා රජ සිරි ත්
වීසම නුනිරිඳුමෙන්මැදහ ත්

138 යොදුන්, යොජනසඛ්‍යාවෙන්; දසදහසක්, දශසහස්‍රයක්වූ; දඹදිව, ජම්බුද්වීපයෙහි; විරිඳුන්, වෛරී න්; දිනූ, ජයගත්තාවූ; දම්යෝනරඳුන්මිසක්, ධර්ම්‍යාශොකනරෙන්ද්‍රයාමුත්; නවරෙක්, කිනම්කෙනෙක්; මෙ රඳුන්, මෙරාජයන්නා; සරිද, සදෘශවේද. 139 මනුත්, අ නාගතයෙහිත්; තමකුලසට, ස්වකීයවංශයට; ලක, ලංකාව; එකසත්වනලෙස, එක සම්මතව ගැපරද්දෙන්; රජ සිරින්, රාජවර්නයන්; පෙන්වා, දක්වා; මනුනිරිඳුමෙන්, මනුරජුසෙයින්; මැදහත්වය, (ජනයන්ට) ඇතුළුත්වී.

140

තමන් සිළුමිණි දූ
සිලිලෙන්සරණකර දූ
රජුගුණ්කෙසෝ දෝ
සිරිලක්ශ්‍රීලකසිසල්නිරි දෝ

141

වැද ඔහු පදකම ල
ලැබසව්ඉසුරු මුනක ල
සොලි පාණ්ඩි කු ල
නොයෙක් නිරිඳෝ සිටිති හැමකල

140 තමන් තමන්ගේ; සිළුමිණි, ශිඛාමාණික්‍ය යන්; ගෙසිලලෙන්, ප්‍රභානැමතිඔෂයෙන්; සරණ, චර ණය; ගන්කර, බොවනයකොට; රජු, රජයාගේ; ගුණ; ගුණය; සොදෝදූන, ශොභමානගෙණ; සිරිලක, ශ්‍රීල ඞ්කාවෙහි; සකලනිරිඳෝ, සකලනරෙන්ද්‍රයෝ; සිටිති, සි ටින්නාහ. 141 ඔහු, ඒ රාජයාගේ; පදකමල, සරණාස රොජය; හැමකල, සෑමකල්හී; වැද, නමස්කාරකොට; මුනකල, මනොඥවූ; සව්ඉසුරැලැබ, සකලශ්‍රීලබා; සො ළිපාණ්ඩිකල, සොළිපාණ්ඩි යන කලයන්හි (ජාතවූ); නො යෙක්නිරිඳෝ, අනෙක නරෙන්ද්‍රයෝ; සිටිති, සිටින් නාහ.

**142**

මුනි බණ අසා නි ති
අපනිමි තිසුණු නුවනැ ති
සසමය දැන පැව ති
මිහිඳුරදුසේවිය දනුමැ ති

**143**

විරිඳුන් හැරදුර ම
වැද රද නිති අසර ම
දැන අවිසිප් සර ම
සියල් කිවිනව් ඇසී නො හැර ම

142 තිසුණු නුවනැති, තිසෂර්ණඥානන්විතවූ; අපනිමි, අපගේ ස්වාමිනෙමේ; නිති, නිරන්තරයෙන්; මුනිබණ, සර්වඥධර්මය; අසා, ශ්‍රවණයකොට; සසමයදැන, සවිධ සමයොදග්‍රහණයකොට; පැවති, පැවැත්තාවූ; මිහිඳුරදුසේ, මලන්‍ද රජනුසෙයින්; දනුමැතිවිය, ප්‍රඥාවන්තවී. 143 විරිඳුන්, වෛරීජනයන්; දුරමහැර, ඈතහාගයා පමුනුව; රදනිතිඅසරම, රාජනීතිආශ්‍රයටම; වැද, පැමින; අවිසිප්සරම, ආයුධශිල්පප්‍රමාණය; දැන, විජානනයකොට; සියල්කිවිනව්, සකලකාව්‍යනාටකරසයන්; නොහැරම, ඉතිරි නොකොටම; ඇසී, ශ්‍රවණයකෙලේය.

**144**

මනුනිතිදසර ද
දහැමින්ලොවට අගර ද
අප නිරිඳුව පැහැ ද
පඹුරැනෙත්වනකෙනෙක් කවුරැ ද

**145**

පසිඳුරිව්වං සා
සපැමිනිමෙරදහා සා
මුළුලොවට හිං සා
නොකොටකරනුය නිතිප සංසා

144 මනුනිති, මනුනීතියෙන්හා; දසරදදහැමින්, දශරාජධර්මයෙන්; ලොවට, ලොකයාට; අගරැඳි, අගණ්‍යන්වූ; අපනිරිඳුව, අපගේනරෙන්ද්‍රයාට; පැහැද, ප්‍රසන්නව; පඹුරැ, ප්‍රාභෘතයන්; නෙත්වනකෙනෙක්, නෙත්වන්නාවූ කෙනෙක්; කවුරැද, කවරහුද. 145 පසිඳු, ප්‍රසිද්ධවූ; රිව්වංසා, සූර්‍ය්‍යවංශයට; සපැමිනි, සම්ප්‍රාප්තවූ; මෙරදහාසා, මේ රජලනුමා; මුළුලොවට, සකලලොකයාට; හිංසා නොකොට, පීඩානොකොට; නිති, නිරන්තරයෙන්; පසංසාකරනුය, ප්‍රශංසාකෙරේ.

146 මෙමඅප නරපව රා
මනුනය සිහින් සපු රා
නොහැරසිවුසඟ රා
ලොවට නිරතුරැ කෙරෙයි සක රා

146 මෙඅප, මේඅපගේ; නරපවර, නරෙන්ද්‍රතෙම; මනු නය, මනුනීතිය; සිහින්, විනයෙන්; සපුරා, සම්පූර්ණ කොට; සිවුසඟරා, චතුස්සංග්‍රහවස්තූන්; නොහැර, අත්නො හැර; ලොවට, ලෝකයට; නිරතුරු, නිරන්තරයෙන්; සඟරාකෙරේයි, සංග්‍රහකරයි.

147

මෙඅපනරනි න්දේ
රජදහම සිතරැ න්දේ
තොස්සිඳුකිමි න්දේ
නොයෙක්බමුණන්ටනිති දන්දේ

148

ගත්මෙන්නවන දන්
කෙරෙමින්කලිඅතුරුදන්
සරහම්සිතන දන්
දේසඅමුරුඳුපනා මහ දන්

147 සිත, සිත්හි; රජදහම, රාජධර්මය; රැඳේ, රඳනාලද; මෙඅප, මේඅපගේ; නරනින්දේ, නරේන්ද්‍රතෙ මේ; තොස්සිඳු, තොෂනැමතිසින්ධුයෙහි, කිමින්දේ, කිම ඤනවෙමින්; නොයෙක්බමුණන්ට, නානාබ්‍රාහ්මණයන් ට; නිති, නිරන්තරයෙන්; දන්දේ, දානපරිත්‍යාගකෙ රේ. 148 නවනදන්, නවනිධානනිධානයන්; ගත් මෙන්, ග්‍රහණයකලාසේ; කලි, දුඃඛයන්; අතුරුදන්කෙ රෙමින්, අන්තර්ධානකෙරෙමින්; තාවසිත, ස්වකීය චිත්ත ස්; නාදන්කෙරෙමින්, සතුටුකෙරෙමින්; අමුරුඳුපනා, වර්ෂාකා; මහදන්දේය, මහදානපවත්වන්නේය.

149

මේ අප නර පව ර
සිරිලකරදන මනහ ර
මහසනගණ නොහැ ර
දේයඅමුරුඳුපනාපිරිකා ර

150

දිවමන්මුනර ද
දුටුමෙන්වසිනපස ද
පුදපඩුරෙන්ස ද
සුදසිඳුගුමන්සිනින්දල ද

149 මේඅප, මේ අසමත්සාමිවූ; නරපවර, නරශ්‍රේෂ්ඨයා තෙමේ; සිරිලක, ශ්‍රීලඞ්කාවෙහි; රඳන, රජකාරමන්නාවූ; මනහර, මනොඥවූ; මහසනගන, මහාසඞ්ඝපර්ෂදයා; නො හැර, අත්නොහැරම; අමුරුඳුපනා, වර්ෂාකා; පිරිකර දේය; පරිෂ්කාරදානයකරයි. 150 දිවමන්මුනිරද, බුද් ධකාරමුනිඳුතුමා; දුටුමෙන්ව, දුටුවාසේම; සිතපහද, චි ත්තප්‍රසන්නකොට; පුදපඩුරෙන්, පූජාප්‍රාභෘතයෙන්; සු දුසිරසා; සුනුවන්සිනින්, ඛිනුමාල විනයෙන්; දළදාපුද, දළදාධාතුපූජාකරයි.

151

රුපුවිසමුල් පැහැ ර
සදහම් සිතින් නොමහැ ර
කරමා මහවෙහෙ ර
කරසිඑනි නිබැඳ පුදපෙළහර

152

කුළුණෙන් උප්ප තුන්
තියුණුනුවණින් විය තුන්
විකුමෙන් බලව තුන්
නිබඳ දෙන මහදනින් නිවතු

151 රුපුවිසමුල්, සතෘආබාධයන්; පැහැර, දුරුකොට; සිතින්, චිත්තයෙන්; සදහම්, සද්ධර්මය, නොමහැර, මෙන්නොකොට; මහවෙහෙර, මහාවිහාරයන්; කරමා, ගොඩනගා, එනි, ඒ විහාරයන්හි; නිබඳ, අතුරුනැතිව; පුදපෙළහර කරයි, පූජාප්‍රාතිහාර්‍ය්‍ය පවත්වයි.
152 කුළුණෙන්, කරුණාවෙන්; උප්පතුන්, දුකටපැමිණියන්ද; තියුණුනුවණින්, තීක්ෂණඥානයෙන්; වියතුන්, ව්‍යක්තයන්ද; විකුමෙන්, (ශෞර්‍ය) වික්‍රමයෙන්; බලවතුන්, ශක්තිවන්තයන්ද; නිබඳ, නිරන්තරව; දෙන, ප්‍රදානය කරන්නාවූ; මහදනින්, මහාදානයෙන්; නිවතුන්, වස්ත්‍රහීනයන්ද. (මතුනට සම්බන්ධයි)

153

මෙතින් නරපති යන්
නිතිනනකුරෙනි මැති යන්
වැඩුමෙන් කුලැති යන්
නොකඩ බැතිපෙම් සිතින් යතියන්

154

තෙපලෙන් සුබැසි යන්
ඉසුරෙන් සියකුලැසි යන්
විලසින් විළැසි යන්
මෙලෙස ගත්තෙය් ලෝවැසියන්

153 මෙතින්, මෛත්‍රියෙන්; නරපතියන්, නරපේන්ද්‍රයන්ද; නිති, නිරන්තරවූ; තනකුරෙනි, ධානානතරයෙන්; මැතියන්, මන්ත්‍රීන්ද; වැඩුමෙන්, (ස්ථානමානාදීයෙන්) වර්ධනකිරීමෙන්; කුලැතියන්, කුලවතුන්ද; නොකඩ, අවිච්ඡින්නවූ; බැතිපෙම්සිතිනි, භක්තිප්‍රෙමචිත්තයෙන්; යතියන්, යතීන්ද්‍රයන්ද, (මතුනට සම්බන්ධයි)
154 තෙපලෙන්, (මධුර) වචනයෙන්; සුබැසියන්, සුභාසිතයන්ද; ඉසුරෙන්, ඓශ්වර්‍ය්‍යයෙන්; සියකුලැසියන්, ස්වකීය බන්ධූන්ද; විලසින්, (රූපලාවණ්‍ය) විලාසයෙන්; විළැසියන්, කාන්තාවන්ද; මෙලෙස, මෙබඳුපරිද්දෙන්; ලෝවැසියන්, ලෝකවාසීන්; ගත්තෙය්, ග්‍රහණය කෙළේය නොහොත් වශංගත කෙළේය.

155

රැක සිරිලකලක ළ
සවසතසතන් තුමූක ළ
අප නරනිඳු පුව ළ
ලොවම කවපින්පිඬෙකනි සැසල

156

අම්බලමේ නොම ද
දනරැස් උතුන් මන්බැ ද
මෙලෙසින් කීසන බො ද
තෙපුළී ගා අසඳසා උත්සඳ

155 ලකළ, අලඞ්කෘතවූ; සිරිලක, ශ්‍රීලඞ්කාව; රැක, රක්‍ෂාකොට; සව්සත, සකලසත්ත්වයන්ගේ; සතන්, චිත්තයන්; තුටුකළ, සතුටුකළාවූ; පුවළ, ප්‍රෞඪවූ; අපනා රනිඳු, අපගේ නරේන්ද්‍රයා; ලොවා, ලෝකයට; බට, බැස්සාවූ; නිකසළ, නිශ්චලවූ; පින්පිඩෙක, පුණ්‍යපිණ්ඩයෙකි.

156 අම්බලමෙහි, විශ්‍රාමශාලාවෙහි; නොමඳද නරැස්, අමන්ද ජනසමූහයා; උනුන්, අන්‍යෝන්‍යයන්; මන්බැඳ, අභිමානබැඳ; මෙලෙසින්, මේපරිද්දෙන්; කියන, සම්භාෂණය කරන්නාවූ; සොඳතෙපුල්, සුන්දරවූ වචනයන්; තා, සුඹමත්තෙනමෙ; අසඅසා, ශ්‍රවණයකරමින්; උන්සඳ, උන්කල්හි.

157 සරණැවි රුව්කෙරේ ය තුරුසිරේ ය
පැහැද බමරසිරේ ය පුල්සරේ ය
තුඹුල් ගන අඳුරේ ය කරදුරේ ය
අරුණුරැස් පැතිරේ ය පෙරඹරේ ය

157 සරණැවි, තාමුඹවුන්ගෙන් විසින්; තුරුසිරේය, වෘක්‍ෂශිඛරයෙහි; රුව්කෙරේය, හඬලනකල; බමර, භෘඞ්ගසමූහයා; පැහැද, ප්‍රසන්නව; පුල්සරේය, පුල්ලසරසියෙහි; හැසිරේය, බමනකල්හි; තුඹුල්, මහත්වූ; ගනඅඳුරේය, ඝනාන්ධකාරය; දුරේකර, බැහැරකළා; අරුණුරැස්, අරුණාලෝකය; පෙරඹරේය, පූර්වදිග්භාගයෙහි; පැතිරේය, ප්‍රසාරිතවේ.

158 සඳ රැස් වතුරු ලොව පිරෙමින් බසිනස ඳ
තුරු හිස් අතුරු රැඳි පෙණපෙළලෙස විහි ඳ
එදවස් උදය වන කුසුමන් දැක විහි ඳ
සිත තොස් වඩා මිදනැන් නොගෙසින් සබ ඳ

158 සඳරැස්, චන්ද්‍රිකානාමිකවූවූ; වතුරු, ඔෂ්ඨයනමේ; ලොව, ලෝකය; පිරෙමින්, පූර්ණවෙමින්; බසිනසඳ, බස්නාකල; තුරුහිස්අතුරු, වෘක්‍ෂශිඛරාන්තරයෙහි; රැඳි, රඳිතවූ; පෙණපෙළලෙස, ඵේනපඞ්ක්තීන් සෙයින්; එදවස්උදය, ඒ දිවසමුඛයෙහි; විහිදවන, ප්‍රබුද්ධවන්නාවූ; නොමඳ, බොහෝවූ; කුසුමන්, පුෂ්පයන්; දැක, දැකනා කොට; සබඳ, සහලුව; තො, සුඹමත්තෙමේ; සිතතොස්, සිත්සතුටුවඩා; මිදනැන්ගොසින්, මිදක්ෂරගො ස්. (මිත්‍රාම සම්බන්ධයි)

159 සමග පබළු කැල දිලිපෙණවැල ලක ළ
තරඟ විසුල නිල් සුදුපැහැය පළ කළ
සුලඟ ලෙළෙණ දලු මල් තුරු වැල වන ළ
බලග උදුල පෙර මග වන ගල නැබ ළ

159 පබල කැල සමග, ප්‍රවාලසමූහයකැටිව; දිලි, හෙබියාවූ; පෙණවැල ලකළ, ඵෙනාවලි අලඞ්කෘතකළාහා; විසුල, විස්තෘතවූ; තරඟ, උර්මින් සම්බන්ධවූ; නිල්, ශ්‍යාමවර්ණයකා; සුදුපැහැය, ධවලප්‍රභාව; පළකළ, දැක්වූ; සුලඟ ලෙලෙන, මාරුතයෙන්ලෙලෙණා; දලු, පල්ලවයෙන්හා; මල්, පුෂ්පයෙන් යුක්තාවූ; තුරුවැල, වෘක්ෂලතායෙන්; වනළ, වනපන්තවූ; පෙරමග උදුල, ඉදිරිමාර්ගයෙහි හෙබියාවූ; නැබලවනගළ, මහත්වූ වනඛණ්ඩය; බලග, අවලොකනයකරං.

160 සිකිපිල් සන්කෙ ලේ ය ගිරිකු ළේ ය
රොන් සක් සකඹ ලේ ය තුරුබෙ ලේ ය
බිඟු දල් චමු දු ලේ ය ගජර ලේ ය
රජ සිරි අත්කෙ ලේ ය වන ගෙ ලේ ය

160 ගිරිකුලේය, පර්වතකූටයෙහි; සිකිපිල්, මයුරසමූහයා; සන්කෙලේය, කෙකාරවිනැගී; තුරුබෙලේය, වෘක්ෂනැමති භටයන්විසින්; රොන්සක්, (කුසුම) රෙණුනැමති චක්‍රායුධය; අඹලේය, බැමවිය; ගජරලේය, සින්ධුරසමූහයා; බිඟුදල්, භෘඞ්ගශ්‍රෙණීන්ගෙන් යුක්තාවූ; චමු, කොපුල්තලයෙන්; දුලේය, දිලිහිනා; (එහෙයින්) වනගෙලේ, වනඛණ්ඩය; රජසිරි, රාජශ්‍රීය; අත්කෙලේය, දැරුයේය.

161 දිළිහෙන ගඟුලැ ලී ය ඇද හැ ලී ය
ගිලී මල් රොණනවු ලී ය සුදුවැ ලී ය
මදමත් හස කු ලී ය වන ර ලී ය
දැකඇව මන ක ලී ය වනවි ලී ය

161 ඇදහලීය, ඇදවැටෙමින්; දිලිහෙන, බබලන්නාවූ; ගඟුලැලීය, ගඟුල්හැලිඇති; ගිලී, ගලිතවූ; මල්රොණ්, පුෂ්පරේණුයෙන්; අවුලීය, ආකූලවූ; සුදුවැලීය, පණ්ඩරපුලිනඇති; මදමත්, රාගයෙන්මත්ව; රලියවන, [illegible]කදනා; කුලීය, කුතුහලවූ; හස, හංසයන්ගෙන්; මනකලීය, මනොඥවූ; වනවිලීය, වනතටාකයෙන්; දැක, දර්ශනයකොට; ඇව, ප්‍රයාණයකර.

162 අතු අති නැඳ ග සා ය  තුරුරැ  සා ය
කෙළන පන්දුලෙ ළ ය  සහතො  සා ය
පැනගෙණවනගී සා ය  මිග අ  සා ය
යන වඳුරන් කී සා ය  ගොවිල  සා ය

162 තුරුරැසාය, වෘක්ෂසමූහයෙහි; අතු, ශාඛාවන්; අ තින්, බාහුයෙන්; ඇද, ආකර්ෂණයකොට; ගසාය, ගැසීමෙ න්; සහතොසාය, සන්තොෂයෙන්; පන්දුකෙළන ලෙසා ය, පන්දුක්‍රීඩාකරන්නාසේ; මිගඅසාය, මෘගාක්ෂිකාවෙ න්; වනගීසාය, ආරණ්‍ය ගීතය; පැනගෙණ, ලබිකනාය කොටගෙණ; ගොවිලසාය, අලසගොවී; යන, යන්නා වූ; වඳුරන්, වානරයන්ගෙන්; කීසාය, ශුකනාවූ.

163 අඹ දලු පල ර ඹා  සිද ගොනා  බා සා
ගෙණනම පියඅ ඹා  තුඩ ගනා  බා සා
සිඹ සිඹ රතිලො බා  දෙපිය ග  බා සා
උන් පරපුටු සු බා  සකි නර  ඹා සා

163 අඹදලු, අඹුපලුවනා; රඹාපල, කදලීඵලද; ගොනා බායා, ඉතාරිනොගෙනකොට; සිදගෙණ, ජිනාණකොටගෙ ණ; නම, නමින්ගේ; පියඅඹා, ප්‍රියකාන්තාවන්ගේ; තුඩ ග, තුණ්ඩාග්‍රයෙහි; නබායා, තබමින්; රතිලොබා, රති ක්‍රීඩාලොභයෙන්; දෙපියගබායා, පියපත්දෙගැබ; සිඹ සිඹ, චුම්බනයකෙරෙමින්; උන්, නිසිඳනසකණුගු; සුබා, සොභනාවූ; පරපුටු, කොවුල්සමූහයා; සකි, සහාලුව; න රඹායා, බැළුව.

164 එන රිවිබිඹු දු ලා  ගිරගබ  ලා සා
ගිරිතිල් මල්තු ලා  පිල්යස  ලා සා
දිගකර නිල් ගෙලා  දිගු හඩ  ලා සා
රගනමොණර බ ලා  සිව නොපා  ලා සා

164 ගිරග, (උදය) ගිරිශිඛරයෙන්; එන, එන්නාවූ; දුලා, ජ්වලිතවූ; රිවිබිඹු, සූර්‍ය්‍යබිම්බය; බලායා, අවලොකනය කොට; ගිරිතිල්මල්තුලා, ගිරිකන්ර්‍ය්‍යසඥශවූ; පිල, පිල්වැටින්; සසලායා, චපලකොට; නිල්ගෙලා, නිල්ව ර්ණග්‍රීවය; දිගකර, දික්කොට; දිගුහඩලායා, දීර්ඝ ස්වරණපවත්වා; රගන, නටනානාවූ මොණර, මයූර සමූහයා; බලාසිව, දර්ශනයෙන් සිව; නොපා, නොසමන් තෙමි; පලායා, පලාකාරයව.

165 දිනුකෝපෙනි ගයා නා වරල ඉ නා යා
පිපිමල් රොන් ග නා නවර ග නා යා
වියොවග යුරප නා එවනපෙ නා යා
එන වන සරක නා නොකරක නා යා

165 ඉනායා, මනාවූ; වරල, කෙස්වැටිය; දිනුකෝපෙනි, ගිරිකොතකී (අඹප) පනුයෙන්; ගොනා, ග්‍රථිතකොට; ගනයා, ශරීරයෙහි; පිපි, පිබුදුවූ; මල්රොන්, පුෂ්පරෙණුන්; නවර ගනා, නවරාගෙණ; වියොවගසුඳ, කාන්තා සහිතාවූය; පනා, ප්‍රාප්තනාකොට; එවනපෙනායා, එවන පඞ්නෙහියෙනි; එන, එනානාවූ; වනසරකනා, වනඩවනී නාමන්සමිණ; කනායානොකර, කඩානොකොට.

166 වන සර දක නම සිනබිය සල සෑ
ගනගන නැඹ ලෙලදෙන විදු විල සෑ
වන ගැබ ඕබි නොබ පැනසන නොල සෑ
නැන නැන මුවරල දක යම සනො සෑ

166 වනසර, වනඩසත්‍රීන්; දක, දක්නාසකොට; නමසින, සවකීය සිත; බියසැලසා, භයටපමුනා; ගන, ඝනවූ; ගනගැබ, මෙඝගර්භයෙනි; ලෙලදෙන, ලීලාදක්නයකරන්නාවූ; විදුවිලසා, විද්‍යුත්ලෙද; වනගැබ, අරණ්‍යගර්භයෙහි; ඕබිනොබ, ඇත්මැත්ශී; නොලසා, ශීඝ්‍රව, පැනසයා, ලඹිගනායකොරෙමින් යන්නාවූ; මුවරල, හරිණසමූහයා; නැන නැන, හැකිහැකි; දක, දකලා; සනොසාසම, සතුටිකල්යම.

167 ව න ච ල් වැදබොල් සෙවෙලන නව රෑ
ග න ව ල් කැල ඇරගෙණ දිනිනුදු රෑ
දි ගු උ ල් සිඟු යොමුකරකර අඹ රෑ
පි ලි ම ල් වන මිනිවුන් දකු නුදු රෑ

167 වනවිල්, වනගතාගයෙහි; වැද, පැමින; බොල්සෙවෙල්, ඝනාවූ ශෛවාලයන්; ඇඟනවරු, ශරීරයෙහි තවරුයෙණ; ගනවල්කැල, ඝනවූ ඇළෑටින්; අනිනුදුරු බාහුයෙන්උදුරු; ඇරගෙණ, රැගෙණ; දිගු, දික්වූ; උල්සිඟු, තියුණුශෘඞ්ගයන්; අඹරු, ආකාශයකොට; යොමුකරකර (උතුනුන්ට) යොමුකෙරෙමින්; පිළිමල්, විරූඩවනාවූ මිනවුන්, මහිෂසමූහයා; නුදුරු, සමීපයෙහි; දකු, බලව.

168 ව ල් තෙරවල්බිඳ හෙව මබ නව රෑ
ලො ල් කර හෙලනෙලඹිල කම්නුදු රෑ
බො ල් කෙල පෙණ පිඩු දෙනොලින්වනු රෑ
ව ල් වැද එන උරන බඳ ඉඳු රෑ

168 පිල්තෙරවල්, තටාකතීරයන්; බිඳ, භගනංකොට; හෙ
ව, ගිනි; මඩනවරා, කලලනවරාගෙණ; හෙලනෙලුඹ
ලු, හෙලනෙලුම්බුදලි; ලොල්කර, ලොභකොට; උදුරාකා
මිත්. උපුටාකාමින්; බොල්, ඝනවූ; සෙලපෙණපිඩු, සා
න්ද්‍රපෙණපිණ්ඩයන්; දෙතොලින්, ඔෂ්ඨයෙන; වගු
රා, වගුරමින්; වල්වැදඑන, වල්වැදඑන්නාවූ; ඌරන්, සූ
කරයන්; ඉඳුරාබල, මනාවබලව.

169 වැද සෙද උනුනට පසුනොබසිමි නේ
බිඳ බිඳ මී අඹ කැන් ගෙණ අති නේ
ඇද ඇද තුරුවැල ගළපන ලෙසි නේ
රොද බැද එන රිලවුන් දකු තොසි නේ

169 උනුනට, අන්‍යොන්‍යයන්ට; පසුනොබසිමිනේ, පසු
බටනොවී; වැද (ඉදිරියට) පැමින; මී අඹකැන්, සහකා
රවල්ලරීන්; බිඳ බිඳ, කඩමින්: අතිනේගෙණ, හස්තයෙ
න්ගෙණ; තුරුවැල, වෘක්ෂලතාවන්; ගළපන ලෙසි
නේ, ගලපන්නාහුමෙන්; ඇදි ඇද, ඇදිමින්; රොදබැදඑ
න, සමූහවඑන්නාවූ; රිලවුන්, ශාඛාමෘගයන්; තොසිනේ,
සන්තොෂයෙන්; දකු, බලව.

170 නිති වලඳගෙණ තුරුහිමියෙ නී
එන බමරුන් දැහැ පලුසුරති නී
සිවි පිපිලිය දැකකුලඟන මෙ නී
සකි සලනොව යව නොසවඩමි නී

170 තුරුහිමියෙනී, වෘක්ෂනාමිස්වාමීන්; නිති, නිර
න්තරයෙන්; වලඳගෙණ, වැළඳගෙණ; එන, එන්නා
වූ; බමරුන්, භෘංගයන්; පලුසුරතිනී, පලුවනැමති දකු
ණතීන්; දැහැ, එලවා; කුලඟනමෙනී, කුලවනිතාවන්
සේ; සිවි, සිවියාවූ; පිපිලිය, ප්‍රිල්ලලතාවන්; දැක, දර්ශනය
කොට; සකි, යහලුව; සලනොව, චචලනොවී; නොසව
ඩමිනී, සන්තොෂවඩා; යව, ප්‍රාණාක්ෂකර.

171 ලොබ කොට ඉන් ගිරවුන් තුඩප බා
අසු කොට නොහැරම ඇතුලත තබා
පිව තව පැසුරු බිඹු වැලසු බා
[illegible] තම පෙණෙනුය මහ වන ගැබා

171 ගිරවුන්, කීරයන්ගේ; තුඩු, තුණ්ඩයන්කි; දුන්, ජනී
තමූ; පබා, ප්‍රභාවූ; ලොබකොට, ලොභකොට; නොහැ
රම, අත්නොහැරම; අසුකොට, අල්වාගෙණ; ඇතුළ
ත්, අභ්‍යන්තරපාර්ශවයෙහි; තබා, ස්ථාපනයකොට; පිව

නට, බාහ්‍යයට; දැසුරු, දක්වූයේ; සුබා, සහපත්දකුම් ඇත; බිඹුවැල, සොම්වැලින්යුක්තාවූ; මහවනගැබා, මහත්වූ ආරණ්‍යගර්භය; තනෙනට, තාගේනෙත්‍රයට; පෙණෙහුය, පෙණෙන්නේය.

172 නි ක ස ල වැලිතල පිටුවල මෙ නේ
පි ල ඹ ල සිනිකැත් ලෙස වෙන වෙ නේ
රොන්දෙල විඟුමුළු රැඳි තැන තැ නේ
පැ හැ දු ල කුසමල් තුරුවැල පෙ ණේ

172 මෙනේ, වනයෙහි; නිකසල, නිශ්චලවූ; වැලිතලපිටුවල, පුලිනතලාවතුයෙහි; පිලඹල, පිරීවෘත්තකලාවූ; වෙනවෙනේ, භූදකලාවූ; සිනිකැත්ලෙස, මියුරසභූගයාසෙයින්; රොන්දෙල, රේණුලෝභයෙන්; රැඳි, රැඳීනවූ; විඟුමුලු, භෘඞ්ගශ්‍රේණීන්ඇති; පැහැදිල, ප්‍රභාවොජ්වලිතවූ; කුසමල්තුරුවැල, වැලිකුසුපුෂ්පවෘක්ෂපෙළ; තැනතැනේ, තන්හිතන්හි; පෙණේ, දෘශ්‍යමානවේ.

173 වනදෙවඟන සරණ ත ලා
තැන තැන වැකිලෙස උඟු ලා
වනතුරු කිස රැඳි ලද ලා
මනතොස කරබල ඒක ලා

173 වනදෙවඟන, වනදිව්‍යස්ත්‍රීන්ගේ; සරණතලා, චරණතලයන්; තැන තැන, තන්හිතන්හි; උඟුලාවැකිලෙස, ඉඳිරහුනුයේ; වනතුරුකිස, ආරණ්‍යවෘක්ෂශිඛරයෙහි; රැඳි, ශොභිතාවූ; ලදලා, බාලපල්ලවයන්; මනතොසකර, සිතසතුටුකර; ඒකලා, එකල්හි; බල, අවලොකනයකර.

174 ගු ව න පැතිරි රිවිරැසි නේ
එ ව න බියෙන් සැඟවෙමි නේ
සැ ලෙ න අඳුරු කඩ ලෙසි නේ
එ ලෙ න විවුලු කැලන් පෙ ණේ

174 ගුවන, අහස්හි; පැතිරි, විස්තීර්ණවූ; රිවිරැසිනේ, සූර්ය්‍යරශ්මියෙන්; බියව, භයවී; එවන, ඒවනයෙහි; සැඟවෙමිනේ, ගුප්තවෙමින්; සැලෙන, චංචලවන්නාවූ; අඳුරුකඩලෙසිනේ, අන්ධකාරඛණ්ඩයන්සෙයින්; එලෙන, එලවෙන්නාවූ; විවුලුකැලන්, ජතුකාසමූහයා; පෙණේ, දෘශ්‍යමානවේ.

175 එ ව න රජුගෙ තාංනොදමු ළු
බ ම න විලස් පෑ සුරඟ ළු
ස ර ණ වෙසෙස් වලිකුළුමු ළු
තා ම න ලෙසට බලග යහ ළු.

175 එවනරජුගෙ, ඒ [illegible] සර්වඥ ශාක්‍යා [illegible] ජීවූ; තදනොදමුළු, සන්ධ්‍යාතොරණයින්; බමනවිලස්, භ්‍රමනයවන විලාසය; පෑ, දැක්වූ; වෙසෙස්, විශේෂයෙන්; ළලකුළු, ඔබලඹිකානව; සරණ, හැසිරෙන්නාවූ; වලිකුළුමුළු, වලාකුළු සමූහයා; යහළු, මිත්‍රය; තාම නලෙසට; තාගේ සිත්වූපරිද්දෙන්; බලග, අවලෝකනය කරව.

176 නොමද රැසින් රැඳුනුඅම ට
ක ර ද කුසුම් දැකතුරැය ට
වි ල ද වෙදුසි සිත සැනසෙ ට
ස බ ද ගොසින් නොවන් නිව ට

176 තුරැයට, වෘක්‍ෂාග්‍රභාගයෙහි; අමට, සිසාරා; රැඳුනු, (කිරණ්) රැඳුනාවූ; නොමඳරැසින්, අමන්දරශ්මියෙන් යුක්තවූ; කරදකුසුම්, ශ්‍යාමවර්ණ පුෂ්පයන්; දැක, දකිනායකොට; විලදවෙදුසි, ලාජයසි; සිත්සැනසෙට, සිත් සන්තෝෂකොට; ගොසින්, ගමනායකොට; සබඳ, සහවීම; නිවටනොවන්, ලජ්ජානොවනු.

177 වි සි ර ගෙණ ගඟුලැලිවැ දේ
තැ ව ර ගෙණ මල් මුවර දේ
බ ම ර රැව් ඇද මඳම දේ
පැතිර එන මඳනල වි දේ

177 ගඟුලැලි, ගඟුල්හාලෙලි; වැදේ, ගැටී; විසිර ගෙණ, විසිරී; මල්මුවරදේ, කුසුම මකරන්දයන්, තවර ගෙණ, තවරාගෙණ; මදමදේ, මඳින්මඳ; බමරරැව්, භෘංගනාදය; ඇද, ආකර්ෂණයකොට; පැතිරඑන, පැතිරීඑනාවූ; මඳනල, මන්දමාරුතය; විදේ, විදිමින්.

178 දිසි නිමල වනදෙවිතා ලා
මිණිමෙවුල්ලෙස මනනා ලා
රැඳි මිදෙල්මුත් සැන්බ ලා
සබ කොබොල්මිණි සිරිසු ලා

178 දිසි, දෘශ්‍යවූ; නිමල, නිර්මලවූ; වනදෙවිතලා, වනදේවාංගනාවන්ගේ; මනනලා, මනොඥවූ; මිණි

පෙමුල්ලෙස, මාණික්‍යමේඛලාදාම බඳුවූ; රැඳි, රජිතවූ; මිලේල්මල් කැන්, නිර්මලස්වභාවයන්; බැඳා, නිර්මාණය කොට; මිණිකොබොල්සිර, (ඒ වනදේවතාවන්ගේ) මාණික්‍යකුණ්ඩලාගරණශ්‍රීය; උජ්ජ්වලා, දුරු; යම, ගමනය කර.

179 ගිම න දුරපලමනනි සා
සල න මිණිනල්වැටලෙ සා
යෙනෙ න යුග පිළපත්ග සා
දක් න සිය සියොතුන්රැ සා

179 ගිමන, ග්‍රීෂ්මය; දුරපලමනනිසා, බැහැරලනු පිණිස; සලන, සලනලද; මිණිනල්වැටලෙසා, මාණික්‍යජාලමාතින්සේ; යුගපියපත්ගසා, පක්ෂද්වයහතිය ගසමින්; යෙනෙන, ගමනාගමනයකරන්නාවූ; සිය, ශතසංඛ්‍යාතවූ; සියොතුන්රැසා, පක්ෂිසමූහයා; දකින, දර්ශනයකරව.

180 සර ද නුබ තුරුවැටලෙ සේ
නොමද පිපි කොඳමල් රැ සේ
සබ ඳ ඉඳ ලියමඹුසු සේ
පැහැද විඳ වනපලර සේ

180 සරදනුබ, සරත්කාලයෙහි; තුරුවැලලෙසේ, තාරකාශ්‍රේණින සෙයින්; පිපි, ප්‍රබුද්ධවූ; නොමඳ, අමන්දවූ; කොඳමල්රැසේ, කුමුදකුසුමරාශීඇති; ලියඹුසුසේ, ලතාමණ්ඩපකුසුම්ගෙහි; සබඳ, සඛයා; ඉඳ, විශ්‍රාමයකොට; වනපලරසේ, වනඵලරසයන්; විඳ, ආස්වාදකොට; පැහැද, ප්‍රසන්නව.

181 කොවුල්කුල් පිරි නොකම සේ
සු පු ල්මල් සැදි තුරැයි සේ
කම ල්විල් වෙත මුවරැ සේ
වි ස ල්වල් දක නොයි නො සේ

181 සුපුල්මල්, සොන්පුෂ්පකුසුමයෙන්; සැදි, සජ්ජිතවූ; තුරුනිතෙස්, වෘක්ෂවිස්තාරයෙහි; පිරි, රැස්ව; නොකමෙස්, ලාගෙලා; කුල්, නාදපවත්වන්නාවූ; කොවුල්, කෝකිලයන්ඇති; කමල්විල්වෙත, පද්මනීගෝසන්තානයෙහි; මුවරැසේ, මහසමූහයන් යුක්තවූ; විසල්වල්, විශාලවූ අරණ්‍යයන්; දක, දර්ශනයකොට; නොයෙස්, සන්තානයෙන්, නොයෙස්, ගමනයකොට.

152 ඇවිඳුම් වලා දියගෙණ සිඳුමැදට බැ සා
වෙරළ වලා සිව යනු බැරිව නුඹකු සා
නොමඳ වලා කුළුලෙස දිලි ඇමඳව සා
මුනුදු බලා තුරුපෙනවැද ඉඳ සතො සා

182 වලා, මේඝයෝ; ඇවිඳුම, ආකීර්ණව නොහොත් පුළුබඩව; සිඳුමැදට, සින්ධුමධ්‍යයට; බැසා, අවතීර්ණව; දියගෙණ, සාගරජලය ගෙණ; නුඹකුසා, නභොකුක්ෂියට; යනුබැරිව, යානොහී; වෙරළවලා, වෙලාන්තය ගැවසී; සිව, සිවයාවූ; ඇමඳවසා, සියලු දවස්හි; දිලි, බබලන්නාවූ; නොමඳ, අමන්දවූ; වලාකුළුලෙස, මේඝකූටබඳුවූ; තුරුපෙන, වෘක්ෂපංක්තියට; වැද, පැමිණ; මුනුද, සමුද්‍රය; බලා, නිරීක්ෂණයකොට; සතොසා, සතුටුසහිතව; ඉඳ, විශ්‍රාමයකොට.

183 සියොතුන් පා පහරින් හැසිරෙණ දෙනෙ ර
නිති කම්පා වනතුරුමල් රෙණ්පැනි ර
තදගිම් පා කරලැබ එන දියදහ ර
මහදම් පා මුවදෙර දැක යවමිතු ර

183 දෙනෙර, (ජලනිර්ගම) උභයතීරයෙහි; හැසිරෙණ, සංචාරණයකරන්නාවූ; සියොතුන්, පක්ෂීන්ගේ; පාපහරින්, පක්ෂප්‍රහාරයෙන්; නිති, නිරතුරුව; කම්පාවන, කම්පිතවන්නාවූ; තුරු, වෘක්ෂයන්ගේ; මල්රෙණ්, කුසුමරේණුවෙන් යුක්තාව; පැනිරඑන, විහිද එන්නාවූ; දියදහර, ජලධාරාව; ලැබ, ලබා; තදගිම්, සනාබාධග්‍රීෂ්මය; පාකර, බැහැරකොට; මිතුර, මිත්‍රය; මහදම්පාමුවදෙර, එනම් ද්‍රෝණිමුඛය; දැක, දර්ශනයකොට; යව, ප්‍රයාණයකර.

184 විනිගුම් වෙරළවැද-දැක දෙණ සිඳුගොසායෙන්
පළසිත්ව බානොගෙ සිත්-තොගොසින් සෙදකසායෙන්

184 විනි, වනපනඳු; ගුම්වෙරළ, මහත්වූ වෙලාන්තයෙහි; වැද, (ජලතරඞ්ග) ගැටීමෙන්; දෙන, පවත්නා; ගොසායෙන්, ඝොෂාවෙන් යුක්තවූ; සිඳු, සාගරය; දැක, දර්ශනයකොට; පළසිත්ව, චපල සිතින්; බානොගොසින්, බැලීමනින් නොගොස්; සෙද, වහා; තො, නුඹ; කසායෙන්, කහවනම් ගමින්; ගොසින්, ගමනයකොට.

185 වදිව නිගුම් සමුදුර වෙරළ තහ මුව
සුර පුර සිරි බැමෙන් තුවුව නල මුව
සැදිප ලර සිරි පසිතුරු ගෙඩුයන්නු මුව
දකු මනරම් සව්සිරිසිරි තොටග මුව

185 විදි, මහත්වූ; විනිගුම්, විනිර්ගත ශොභාඇති; සමුදුරවෙරළත, සාගරවෙලාන්තය; හමුව, සම්මුඛව; සුරපුර, දිව්‍යපුරය; බිම්බටමෙන්, භූමියට බටුවාසේ; ලමුව, හෘදයාභිමුඛවූකල; තුටුවන, සතුටුවන්නාවූ; රම්, රම්‍යවූ; පල, ඵලයන්ගෙන්; සැදි, ගෙබියාවූ; විසිතුරු ගෙවු යන්, විචිත්‍ර ගෘහෝද්‍යානයෙන්; තුමුව, සුකනාවූ; මනරම්, මනොඥවූ; සව්සිරපිරි, සකලශ්‍රීන් පිරුණාවූ; තොටගමුව, තිත්ථග්‍රාමය; දකු, දර්ශනයකර.

186 උ දු ල තරල මිණි වෙන් අරගතැයි ත මා
පු ව ළ නහිඳුහට පමුනනලෙසින් බ මා
ත ර ල නැඹල රළගොස පහලකරද මා
වෙර ළ වතළ සිඳුරඟබලග නෙත්යො මා

186 වෙන්, වාසුදේවතෙමේ; තමා, ආත්මීයයා සම්බන්ධවූ; උදුල, උජ්ජ්වලිතවූ; තරලමිණි, කෞස්තුභපාෂාණය; අරගතැයි, ආග්‍රහණයකොට; පුවළ, ප්‍රෞඪවූ; නහිඳුහට, නාථදෙවියාහට; බමාපමුනනලෙසින්, ආවෘතකොට මෙහෙයන්නාසේ; තරල, චපලවූ; නැඹල රළගොස, මහත්වූ තරඞ්ගඝොෂාව; පහලකරදමා, ප්‍රකාශකොට හැර; වතළ, ව්‍යාපතවූ; වෙරළ, වෙලාන්ත ඇති; සිඳුරඟ, සින්ධුස්වභාව; නෙත්යොමා, නුවන්මෙහෙයා; බලග, අවලොකනයකර.

187 සුනිල් නෙරළු වන පියපතර මොරැදි නා
ලකල් වෙහෙර පැහැසර ගුරුළිඳුනුපි නා
විස ල් සයුරතින් ගන්නා රදකුව නා
නිමල් පුළිනතල පෙත්මගට බැසගෙ ණා

187 සුනිල්, අතිනීලවූ; නෙරළුවන, නාලිකේරවනය නැමති; පියපතර, පක්ෂපත්‍රයන්ගෙන්; මොරැදිනා, විරාජිතවූ; ලකල්, අලඞ්කෘතවූ; වෙහෙර, විහාරනැමති; පැහැසර, ප්‍රභාස්වරවූ; ගුරුළිඳු, ගරුඩරාජයතෙමේ; පිනා, සතුටුවූ; විසල්, මහත්වූ; සයුරතින්, සාගරාභ්‍යන්තරයෙන්; ගන්නා, ග්‍රහණයකරනලද; රදකුවනා, ආශීර්විෂයෙක් බඳුවූ; නිමල්, නිර්මලවූ; පුළිනතල, වැලිතලාඇති; පෙත්මගට, පද්ධතියට; බැසගෙණ, පැමිනලා

188 වෙහෙර තුරට සෙද නොගොසින් පළමුකො ට
ප ච ර සුරිඳු නඳුනුයනෙව් දිසි අව ට
නි ත ර සුසැදි මල්පලරම් වනපෙත ට
මි තු ර පිවිස නරඹව සිත් සතුටුකො ට

188 මෙහෙරකුරට, විහාරය තුළට; සොඳහොශො භින්, මහා ශෝභාවෙන්; පවර, ප්‍රවරවූ; සුරඳු, ශක්‍රයාගේ; නඳුනුයනෙව්, නන්දනොද්‍යානයමෙන්; අමව, හාත්පස; දිසි, දෘශ්‍යවූ; නිහර, නිරන්තරයෙන්; සුපැදි, සොභපත් සැදුම්ඇති; පිල්පලු, කුසුම්ඵලයෙන්; රම්, රම්‍යවූ; වනපෙතට, වනපඞ්ක්තියට; පළමුකොට, ප්‍රථමයෙන්; මිතුර, මිත්‍රය; පැමින, ප්‍රාප්තව; සිත්සතුටුකොට, මනස්සන්තුෂ්ටකොට; නරඹට, බලව.

189 වෙන වෙන රඟට බඳ තෝතැනි පියකෙ ළ ස
ස න ඒ ග සිහොත්කැල රුව්පිළිරුව්කැ ළ ස
ද න ම න සතුටුවන රසපලවැල දු ල ස
තැන තැන අමට බබලන නක්තුරු පෙ ළ ස

189 වෙන වෙන රඟට, (එකිනෙකට) විශෙෂපරිද්දෙන්; බඳ, බිඳිනලද; තෝතැනි, ජලයන්ත්‍රනාවන්ති; පියකෙළිය, ප්‍රියකෙළිමින්; රුව්පිළිරුව්කැළිය. රුව්පිළිරුව්දෙමින්; සනඒග, ගමනාගමනයකරන්නාවූ; සිහොත්කැල, ...සමූහඇති; දනමන, ජනයාගේමනස්; සතුටුවන, සන්තුෂ්ටවනානාවූ; රස, රසවත්වූ; පලවැල, පරිනතඵලයෙන්; දුලය, දිලෙනා; අමට, ඊසාරා; තැනතැන, තන්හිතන්හි; බබලන, සොබනා; නක්තුරුපෙලය, නානාවිධවෘක්ෂපංක්තිඇති.

190 ර ළි න් ර ළ බිඟුන් කෙළි වැහිර දිමු තු ස
කෙළින්කෙළ පොකුණු මලතඹර නුමු තු ස
පෙළින් පෙළ සුරත් නිල් මල් මිනිමු තු ස
ප ළි න් ප ල සුවඳ විහිදෙන මල්ව තු ස

190 රළින්රළ, රොදින්රොද; වැහිර, ශිශිර; දිමුතුස, දීප්තිමත්වූ; බිඟුන්, භ්‍රමරයන්ගේ; කෙළි, ක්‍රීඩායෙන්යුක්තවූ; මලතඹර, කුසුමතාමරසඇති; පොකුණු, පුෂ්කරිණීන්; කෙළින්කෙළ, කොන්කොන්හි; නුමුතුස, ...; සුරත්, ඉතාරක්තවූද; නිල්, නීලවර්ණවූද; මිනිමුතුය, මනිපරිබරවූ; මල්, කුසුම්යන්ගේ; පෙළින්පෙළ, පංක්තිඇති; පලින්පල, තැනිනින්හි; සුවඳවිහිදෙන, සුගන්ධවිහිදෙන්නාවූ; මල්වතුය, ප්‍රකාරඇති.

191 නොයෙක සුවඳ මුවරදයෙන විසි තු රැ ස
පමෙසක ක සුපුල්පල් කොළඹින් විසි තු රැ ස
පසක ක සඟ ගෙසර සිරගෙණවිනොව තු රැ ස
දෙමෙස ක දුපිපි සසු නාසිසිසිර තු රැ ස

191 පසෙක, පාර්ශ්වයෙක්හි; විසිතුරුය, විචිත්‍රවූ නොයෙක සුවඳ මුවරදයෙන, අනෙක සුගන්ධමකරන්දයෙන් සුකනාවූ; සුපුල්, සොත්ඵුල්ලවූ; සල්, සාලවෘක්ෂයෙන්හා; කොළොම්හ, කදම්බවෘක්ෂයෙන්ද; විසිතුරුය, ශෝභියාවූ; පසක, ප්‍රත්‍යක්ෂවූ; නොවතුරුය, අතුරුරහිතවූ; සහසකරකිරණෙණි, සූර්‍ය්‍යරශ්මිපරිද්දෙන්; දෙසෙක, දිශාවෙක්හි; සුපිපි, මනාවපිපුනාවූ; සපු, චම්පකහා; නා, නාගස්හා; කිණිහිරිතුරුය, කිණිහිරිවෘක්ෂද ඇති.

192 මල්රෙණ් තුරුසි රේය නිරතු රේය
පවන් වැදී සි රේය මලුතු රේය
බිඟු ලොබකර ත රේය නොවිත රේය
දම් පිළිරැව් යු රේය නාදකො රේය

192 තුරුසිරේය, වෘක්ෂශිඛරයෙහිවූ; මල්රෙණ්, කුසුම්රෙණු; නිරතුරේය, නිරන්තරයෙන්; පවන්වැදී, සුළංවැද; මලුතුරේය, (විහාර) මාලකාතුළ; දුසිරේය, ස්වනයවත්ම; නොවිතරේය, බොහෝවූ; බිඟු, භෘඞ්ගයෝ; තරේයලොබකර, තරයේ ලොභකොට; ඇසිරේය, බමමින්; දම්පිළිරැව්යුරේය, ධර්‍මයාගේ ප්‍රතිවචනසෙසින්; නාදකොරේය, නාදපවත්වති.

193 නොමද බමරකැල රැඳි මල් රෙහෙණු ප ට
පැහැද නිතොර ඇරගෙණ සියඅතු අත ට
ප බ ඳ කොවුල්රැව් තෙපලින් මිහිරි කො ට
තු රු ද දහම් පවසන වැනි වෙහෙර ව ට

193 නොමද, අමන්දවූ; බමරකැල, භෘඞ්ගශ්‍රෙණීන් විසින්; රැඳී, රඳනාලද; මල්රෙහෙණුපට, කුසුමරෙණු පට්ටය නොහොත් උතුරුසළුව; සියඅතු, ස්වකීය ශාඛා යැමිනි; අතට, හස්තයෙන්; ඇරගෙණ, රැගෙණ; නිතොර, අනවරතයෙන්; පැහැද, ප්‍රසන්නව; පබඳ, අබිම්ජිනාවූ; කොවුල්රැව්, කෝකිලනාදනැමති; තෙපලින්, වාක්‍යයෙන්; මිහිරිකොට, මධුරකොට; තුරුද, වෘක්ෂයෝද; වෙහෙරවට, විහාරසභාන්පස; දහම්පවසන වැනි, ධර්‍මකථනය කරනොහෝ වැන්නාහ.

194 ම හා රු මහසඟන එවෙහෙර තුරරඳ නා
සි වු රු පැහැ දිසුණුකර නිරතුරු දර ණා
සොඳුරු පිපි නිමල් මල්කැන් සැදි සොබ නා
රු සිරු ඇසතුරු බබලති නොයෙකතු නා

194 එවෙහෙරතුර, ඒ විහාරාභ්‍යන්තරයෙහි; රඳන, වසනානාවූ; මහරු, මහාර්ඝවූ; මහසඟන, මහාසඞ්ඝයාවිසින්; නිරතුරු, නිරන්තරයෙන්; දරණ, දරනානාවූ; සිවුරුපැහැ, චීවරප්‍රභාව; දිගුණුකර, ද්විගුණකොට; සොඳුරු, සුන්දරව; පිපි, ප්‍රඵුල්ලවූ; නිමල් මල්කැන්, නිර්මලවූ පුෂ්පවල්ලරියෙන්; සැදි, සැරසුනාවූ; සොබන, සොභනාවූ; රුසිරු ඇසළතුරු, රුචිරවූ ඉන්දිවර වෘක්ෂයෝ; නොයෙකතැන, නානාතන්හි; බබලති, භ්‍රාජිතවෙත්.

195 තුරුයවියෙන් හුනු පැවිලෙහෙනුන් රැගෙණ
සිතුඅවියෙන් පිඹ ඇඟ පිරිමැද සෙමෙණ
මල්ගොමුවෙන් පැන් පොවමින් අතිනති ණ
සිටි පැවිනන් හෙරණුන්ගෙන් වෙයි හොබ ණ

195 තුරුයවියෙන්, වෘක්ෂයෂ්ටියෙන්; හුනු, පතිතවූ; පැවිලෙහෙනුන්, කලන්දකපොතකයන්; රැගෙණ, ඇරගෙණ; සිතුඅවියෙන්, සිත්හිආසායෙන්; පිඹ, පිඹිමින්; ඇඟ, ශරීරය; සෙමෙන, සෙමින්; පිරිමැද, පරිමර්දනයකොට; අතිනතින, හස්තයෙන්හස්තයටගෙණ; මල්ගොමුවෙන්, කුසුමවෘන්තයෙන්; පැන්පොවමින්, ජලයපොවමින්; සිටි, සිටියාවූ; නන් පැවිහෙරණුන්ගෙන්, නොයෙක් කුඩාසාමණෙරයන්ගෙන්; හොබනවෙයි, සොභමානවේ.

196 තුරුයට සුපිපි නිල්කටරොළු මල් කැලය
කැම්කොට විදූ දිගු නිල් ඇස් පිල් කැලය
නදකොට රඟන ගෙමොණරගන ඇම් කලය
මුතු පට සදිසි පිරිසුදු සුදු වැලි තලය

196 තුරුයට, වෘක්ෂඅධෝභාගයෙහි; කැම්කොට, එක්තැන්කළාවූ; නිල්කටරොළුමල්කැලය, නීලවර්ණකටරොළුමල් පෙළක්සේ; දිගු, දීර්ඝවූ; නිල්ඇස්පිල්කැලය, නීලවර්ණසාන්ද්‍රාක්ෂිසමූහය; විදූ, විහිදූ; නදකොට, නාදපවත්වා; ඇම්කලය, සියලු දවසෙහි; රඟන, නෘත්‍යකරනානාවූ; ගෙමොණරගන, ගෘහමයූර සමූහයාඇති; මුතුපටසදිසි, මුක්තාපට්ටයක් සෙයින්; පිරිසුදු, නිර්මලවූ; සුදුවැලිතලය, ශුභ්‍රවාලුකාතල ඇත්තේය.

197 සල රස බී තුරින්–තුර එහි කුසුම් රෙදෙසින්
නැමරී සැරි සැනහී–වෙහෙරට නොසිත් සතොසින්

197 තුරින්තුර, වෘක්ෂයෙන් වෘක්ෂයට; පලරස, ඵලරසයන්; බී, පානයකොට; එහි, ඒ වෘක්ෂයන්හි; කුසුම්රේණුසින්, කුසුමරජසින්; තැවරී, ගැල්වී; සැරී, සැරසී; සැනහී, ශාන්තව; සතොසින්, සන්තොෂයෙන්; වෙහෙරට, විහාරයට; ගොසින්, ගමනයකොට.

198 බඳ දද ලැල් පැහැරද පැතිරි දසඟ තේ
නද සඳ කැල් මෙන් දිලි කෙලෙසකුළු යු තේ
කොඳ සඳ කල් සුණුයම් උදුලපල බි තේ
ඉඳ මඳ කල් වහසල් කැරලි මුදුන තේ

198 දසඟතේ, දිශාන්තයෙහි; පැතිරි, විහත්තවූ; පැහැරද, ප්‍රභාරශ්මිඇති; ලැල්, මුක්තාලතිකාවෙන් යුක්තවූ; දද, ධ්වජයන්; බඳ, බඳනාලද්දාවූ; නද, නන්දනීයවූ; සඳකැල්මෙනදිලි, සඳපහනින්හෙබියාවූ; කෙලෙසකුළුයුතේ, කෛලාසකූටයබඳුවූ; කොඳ, කුන්දයෙන්හා; සඳකල්, චන්දනකල්කයෙන්; සුණුයම්, සුණුකම්කළාක්වැනිවූ; උදුලපලබිතේ, උජ්ජ්වලිත මහත්භිත්තිඇති; වහසල් කැරලිමුදුනතේ, ගොපුරමාර්ගාග්‍රගම්භාතකයෙහි; මඳකල්, මඳක්කල්; ඉඳ, විශ්‍රාමයකොට.

199 පහල සිනඹ හිම හිමසෙල් මහිම හැ ර
වනළ අහස්ගඟ රළවැල පැහැ පැහැ ර
අඹල කිරණ පෙණ පෙළ සදිසි පැහැස ර
උදුල පොහොයමලු සිරියර බල වෙහෙ ර

199 පහල, ප්‍රකාශවූ; සිනඹ, සුදුවලාවන්ගේ හා; හිම, තුෂාරයෙහිද; හිමසෙල්, හිමාලකූටයෙහිද; මහිම, මහිමය; හැර, බැහැරකළා; වනළ, වනපතවූ; අහස්ගඟ, ස්වර්ණදියෙහි; රළවැල, තරඞ්ගපරම්පරා සම්බන්ධවූ; පැහැ, ප්‍රභාව; පැහැර, මැඩ; කිරණ, ක්ෂීරාර්ණවයෙහි; පැහැසර, ප්‍රභාස්වරවූ; අඹල, ආවෘතනවූ; පෙණපෙළ සදිසි, ඵෙණපඞ්ක්තිබඳුවූ; උදුල, උජ්ජ්වලිතවූ; පොහොයමලුසිරියර, උපොසථමාලක ශ්‍රීසාරය; වෙහෙර, විහාරයෙහි; බල, බලම.

200 නි ත ර රඳන සඳරැස් ලෙස මුනිඳුද ට
වි සි ර බැබලි මලුපැහැසර සතරපි ට
පැ ති ර අඹර කඳු ගෙණ සිටිමෙන් අව ට
මි තු ර උදුල මහවුර දුට වෙයි සතු ට

200 නිතර, නිරන්තරයෙන්; මුනිඳුදට, බුද්ධපූජාපිණ්ඩය; රඳන, හොබියාවූ; සඳරැස්ලෙස, චන්ද්‍රමරීචියෙයින්; සතරපිට, (විහාරය) සිවුපසෙහි; විසිර, විසිර්ණවූ; බැබලි, භ්‍රාජිතවූ; මලුපැහැසර, මාලකප්‍රභාරශ්මිය; අඹර, අහස්හි; පැතිර, ගලාගොස්; අවට, හාත්පස; කඳුගෙණ සිටිමෙන්, මෑතිමත්වසිටියාසේ; උදුල, උසස්වදිලෙනා; මහවුර, මහත්ප්‍රාකාරය; දුට, දර්ශනයකළ කල; මිතුර, මිත්‍රය; සතුටුවෙයි, ස්න්තුෂ්ටවේ.

201 ගු ව න් කුස පැතිරි රන්කැරලි මිණිරැ සේ
ප ව න් වැද ලෙලෙන දද මිණිකිකිණිගො සේ
ලෙ ව න් සතුටුකළ හිමගිරිකුළෙක ලෙ සේ
ස ව න් මැදුර බලු දිලිහෙන උතුරුදෙ සේ

201 ගුවන්කුස, නභොකුක්ෂියෙහි; පැතිරි, ව්‍යාපතවූ; මිණිරැසේ, මාණික්‍යරශ්මියෙන් යුක්තවූ; රන්කැරලි, සුවර්ණශාඛාඇති: පවන්වැද, මාරුතස්පර්ශයෙන්; ලෙලෙන, ලීලෝපෙතවනානාවූ; දද, ධ්වජයන්සම්බන්ධවූ; මිණිකිකිණිගොසේ, මාණික්‍යකිංකිණිකඝොෂාවෙන්යුක්තවූ; ලෙවන්, ලෝවැස්සන්; සතුටුකළ, සන්තුෂ්ටකළාවූ; හිමගිරිකුළ, හිමාලපර්වතකූටයහා; එකලෙසේ, එකසදෘශවූ; උතුරුදෙසේ, උත්තරදිශා (පාර්ශ්ව) යෙහි; දිලිහෙන, බබලන්නාවූ; සවන්මැදුර, සර්වභූමමන්දිරය; බලු, අවලොකනයකර.

202 න ර ණ සකොබකල සඳ නොවල සේ යා
කි ර ණ පිඹුව දිසි අමරඹ ලෙ සේ යා
දෙ ර ණ පසිඳු එවෙහෙර වම් දෙ සේ යා
කි ර ණ විහිදු දහගැබ බලු තො සේ යා

202 නරණ, වාසුදෙවයා විසින්; කිරණ, ක්ෂීරාර්ණවය; නොවලසේයා, අනලස්ව; සකොබකළසඳ, ඇලේ

කාල; පිඬුවඳිසි, පිණ්ඩවද්‍යශයවූ; අමරසලෙලෙස්යා, අමෘ
තොජ්ජසෙයින්; දෙරණ පසිඳු, ධරණියෙහිප්‍රකටවූ; එවෙ
හෙර, ඒ විහාරයෙහි; වම්දෙදෙස්යා, වම්පැත්තෙහි; කිර
ණවිහිදු, රශ්මිපැතිරෙණ; දගනැබ, ධාතුගර්භය; තො
ස්යාබල, සතුටින්බලව.

203 වි දු කි ඳු වැලඳි මුදුනත රැඳි කලඹ කු ළු
උ දු රු දු කෙලෙසගිරිකුළු පැහැ සිරි රුකු ළු
මු දු උ දු ලන දලු නිල් සාඛර ලකු ළු
සු දු රැ ඳු කඳිනුදුල දුමිඳුන් බල යහ ලු

203 විදුකිඳු, විද්‍යුත්රාජින් විසින්; වැලඳි, වලඳනාල
ද; කලඹකුළු, කාළාභ්‍රකූටයන්විසින්; රැඳි, හෙබියාවූ; මුදු
නත, මස්තකයැහි; උදු, සෘජුවූ; රුදු, මහත්වූ; කෙලෙ
සගිරිකුළුපැහැසිරි, කෛලාසකූටපර්වතප්‍රභාශ්‍රිය; රුකු
ළු, ඵලවූ; මුදු, මෘදුවූ; උදුලන, බබලනනාවූ; දලු, පල්ල
වයෙන්හා; සාඛර, ශාඛාභාරයෙන්; ලකුළු, අලඞ්කෘත
වූ; සුදුරැඳු, පාණ්ඩුරවර්ණයෙන් රජිතවූ; කඳින්උදුල, සක
න්ධයෙන් උජ්ජ්වලිතවූ; දුමිඳුන්, බොධිද්‍රුමරාජයන්; යහලු,
මිත්‍රය; බල, බලව.

204 ප ත ග කිරණ දුරුකළ දද ගළ පා ය
ස ර ග කවුළු බිම් බිතු දිලිපල පා ය
නි ස ග බැබලි සුරපහ සිරි වෙළ පා ය
බ ල ග උතුරු දිග විජයබ මහ පා ය

204 දද ගළපාය, ධවජගළපා; පතගකිරණ, සූර්‍ය්‍යර
ශ්මිය; දුරුකළ, බැහැරකළවූ; සරඟ, රශ්මිමත්වූ; කවු
ළු, කවාටහා; බිම්, භූමියද; දිලි, ජ්වලිතවූ; බිතු, භිත්ති
ද; පල, ජදනද යන මෙයින්; පාය, ආලොකවූ; සුරප
හසිරි, වෛජයන්ත ප්‍රාසාදශ්‍රිය; වෙළපාය, මැඩලා;
නිසග, ස්වභාවයෙන්ම; බැබලි, භ්‍රාජිතවූ; විජයබ මහපා
ය, විජයබාහු මහාප්‍රාසාදය; උතුරුදිග, උත්තරදිශායෙහි;
බලග, අවලොකනයකර;

තවද ඒ විශුද්ධ ප්‍රසිද්ධ සමෘද්ධ විහාරයාගේ මේද
එක් අසාධාරණ කාරණයෙකි.

205 එනරම් වෙහෙර තුර තැන තැන සපැමිණය
සිතුඇම් බණවසුන් විදහා අපමණය
සිතසොම් නසින් සිහිකර කර බුදුගුණය
අබිදම් පෙළ අරුත් විමසන සඟනය

205 එනරම්, තත්ප්‍රමාණවූ; වෙහෙරතුර, විහාරාන්තරයෙහි; තැන තැන, තන්හි තන්හි; සපැමිණය, සම්ප්‍රාප්තව; සිතුඇම්, චිත්‍රකර්මයෙන්යුක්තවූ; බණවසුන්, ධර්ම (පුස්තක) වඡාදන වස්ත්‍රයන්; විදහා, උනා; අපමණය, අප්‍රමාණවූ; සිතසොම්නසින්, චිත්තසෞමනස්‍යයෙන්; බුදුගුණය, බුද්ධගුණයන්; සිහිකරකර, ස්මරණය කෙරෙමින්; අබිදම්පෙළ, අභිධර්මපාළියෙහි; අරුත්විමසන, අර්ථපරීක්ෂාකරන්නාවූ; සඟනනය, සඞ්ඝසමූහයෙක.

206 උතුරුගුණෙන් සපැමින පිළිවෙත් මගය
පතුරුවමින් සත වෙත මෙත් මහගඟය
අතුරුදහන් කරමින් සිවුඅවමගය
සුතුරුදහම් පවසන සමහර සඟය

206 උතුරුගුණෙන්, උත්තරීතර ගුණයෙන්; පිළිවෙත්මගය, ප්‍රතිපත්තිමාර්ගයට; සපැමින, සම්ප්‍රාප්තව; සත වෙත, සත්වයන්කෙරෙහි; මෙත්මහගඟය, මෛත්‍රීනැමති මහානදිය; පතුරුවමින්, පළකෙරෙමින්; සිවු අවමගය, සතර අපාය මාර්ගය; අතුරුදහන්කරමින්, අන්තර්ධාන කරමින්; සුතුරුදහම් පවසන, සූත්‍රධර්මයහෙවත් සූත්‍රපිටකය වදරන්නාවූ; සමහර සඟය, ඇතම් සඞ්ඝ සමූහයෙක.

207 සමහර සුපිළිපන් සඟගන වෙන වෙනය
පුවතර අරුත් විකා ගෙණ වෙන වෙනය
පැනසර ඇදුරු උවදෙස් බස් දැන ගෙණය
නොමහැර ගැඹුරු තැන් විමසති විනයය

207 සමහර සුපිළිපන් සඟගණ, ඇතම් සුප්‍රතිපන්න සඞ්ඝ සමූහයා; වෙන වෙනය, වෙන් වෙන්ව; පුවතර, මහත්වූ; අරුත්විකා, අටුවා හා ටීකා; ගෙණ, ඇරගෙ

ණ; මෙන මේනය, විශේෂවූ; පැනසර, ප්‍රඥාසාරවූ; ඇදු
රැ ඌව දෙස් බස්, ආචාර්‍ය්‍ය උපදෙශ වාක්‍යයන්; දැනගෙ
ණය, විජානනයකොට; විනයනය, විනය ක්‍රම සම්බන්ධ
වූ; ගැඹුරුතැන්, ගම්භීරස්ථානයන්; නොමහැර, ඉතිරි
නොකොට; විමසති, පරීක්ෂාකෙරෙත්.

208 ගැඹුරු නොයෙක් තැන් පිළිවිස සිත් ලෙසිනා
වෙහෙර පසෙක ඉඳ සොඳ පොත්පත්රැගෙණ
නොහැර සලකමින් සන් සඳ රුත් සෙදෙනා
හෙරණ රැසෙක විසරණ වනපොත්කරණ

208 සොඳ, සුන්දරවූ; පොත්පත්, පුස්තකපත්‍රයන්; රැ
ගෙණ, ඇරගෙණ; වෙහෙර, විහාරයෙහි; පසෙක, පා
ර්ශ්වයෙක්හි; ඉඳ, නිසද්‍යකොට; ගැඹුරු, ගම්භීරවූ; නො
යෙක්තැන්, නානා ස්ථානයන්; සිත්ලෙසින, සිත්වූපරිද්
දෙන්; පිළිවිස, පර්‍ය්‍යුපාසනකෙරෙමින්; සෙදෙනා, (ඒ ඒතැ
නා) සොදන්නාවූ; සන්, සඥා; සඳ, සන්ධි; අරුත්,
අර්ථ; නොහැර, අත්නොහැරම; සලකමින්, සංලක්ෂ
ණයකෙරෙමින්; විසරණ වන පොත් කරණ, වත්කර
ණ හදාරනනාවූ; හෙරණරැසෙක, සාමණෙර සමූහ
යෙක.

209 තිසුණු නැණින් කෙරෙමින් සැක නිවාරණ
පමුනුවමින් එකිනෙක සමය කාරණ
දැපුණු සිතින් ඉඳ කර වෙහෙර පුරණ
බමුණු රැයෙක වෙදරුත් කරණ දරණ

209 තියුණු නැණින්, තීක්ෂණ ඥානයෙන්; සැකනි
වාරණකෙරෙමින්, සඞ්කානිවාරණයකෙරෙමින්; සමය
කාරණ, (නානාවිධ) සමය සම්බන්ධවූ කාරණයන්; එකි
නෙක, එකිනෙකට; පූරණකර, පුරැවා; පමුනුවමින්,
ප්‍රාප්තකෙරෙමින්; දැපුණුසිතින්, (නානාශාස්ත්‍රයෙහි) දැ
ප්තවිත්තයෙන්; වෙහෙර, විහාරයෙහි: ඉඳ, හිඳගෙණ;
වෙදරුත්, වෙදාර්ථයන්; පූරණ කරණ, හදාරන්නාවූ;
බමුණුරැසෙක, බ්‍රාහ්මණ සමූහයෙක.

210 ස බා තුරුලෙසින් බොලන් ගෙණ නොම ද
න බා පෙළින් පෙළ ඇද නිල් පලසමැ ද
බ බා සෙද තැනින් තැන ගහගණන් බ ඳ
ප බා කරති දත් සමහරු ගණිත ඉ ඳ

210 සබා, ස්වභාවයෙන්; තුරුලෙසින්, තාරකාබඳුවූ; නොමද, බොහෝවූ; බොලන්ගෙණ, බොලන්රැගෙණ; නිල්පලසමැද, නීලවර්ණපලස්මධ්‍යයෙහි; පෙළින් පෙළ, පඞ්ක්තියෙන් පඞ්ක්තිය; නබා, නබමින්; ඇද, (අඳනමැත) අඳිමින්; සෙද, වහා; බබා, භාසකොට; තැනින් තැන, තන්හි තන්හි; ගහගණන්බඳ, ග්‍රහසඞ්ඛ්‍යාබන්ධනකරමින්; ගණිතදත්, ගණිතශාස්ත්‍රයදන්නාවූ; සමහරු, ඇතම්කෙනෙක්; ඉඳ, සිඳගෙණ; පබාකරති, (ඒ ශාස්ත්‍රය) ප්‍රභාගකෙරෙත්.

211 මු නි වි රු දෙසූ සදහම් මෙන් ඇම දව ස
උ ව දු රු දුරැර රකිනුව සත්වග වෙසෙ ස
පෙ රැ දු රු ඉසිවරන් පැවසූ නොයෙකලෙ ස
වෙ ද ව රු වෙදසතර පිරුවති එකි සතො ස

211 මුනිවිරු, සර්වඥවීරයන් විසින්; දෙසූ, දේශනාකළාවූ; සදහම්මෙන්, සද්ධර්මයපරිද්දෙන්; ඇම දවස, සියලුදවස්හි; වෙසෙස, විශේෂවූ; උවදුරු, උපද්‍රවයන්; දුරැර, දූරීකරණයකොට; සත්වග, (සමස්ත) සත්ත්වසමූහයා; රක්නුව. රක්ෂාකරණුපිණිස; පෙරැදුරු ඉසිවරන්, පූර්වාචාර්යඍෂිවරයන් විසින්; නොයෙකලෙස, නානාප්‍රකාරයෙන්; පැවසූ, ප්‍රකාශකළාවූ; වෙදසතර, වෛද්‍යශාස්ත්‍රය; එකි, ඒ විහාරයෙහි; වෙදවරු, වෛද්‍යයෝ; සතොස, සන්තෝෂයෙන්; පිරුවති, හදාරත්.

212 මනහර පොත් රැගෙණ පරසිදු පෙරපව න
එ හි පද රු ත් කියනලෙස නොහැර දැනගෙ ණ
සූ ර හුරු වත් උතුරු දෙම්හසි වනපොති න
සම හ රු ම ත් සතර පිරුවති නොයෙකතු න

212 පෙරපවන, පූර්වශෙෂිපවන්; පරසිදු, ප්‍රසිද්ධවූ;

විහාර, මනොඥවූ; පොත්, පුස්තකයන්; රැගෙණ, ඇරගෙණ; එහි, ඒ පුස්තකයන්හි; පදරුප්, පදවි සන්; කියනලෙස, කියනපරිද්දෙන්; නොහැර, ඉතා නොහැරම; දනගෙණ, ජානනයකොට ගෙණ; සුර ගුරුවන්, බෘහස්පතිසාවූයෙහිද; වනපොතින, (ඒ) හඳු රණලද පොතින්; උතුරුදෙම්හසී, උත්තරදෙම්හසී; සමහරු, ඇතම්කෙනෙක්, නොයෙකතැන, නොයෙ ක්තන්හි (ඉඳ); වත්සතර, වෘත්තශාස්ත්‍රය ශංගාතොත් ඡන්දස්ශාස්ත්‍රය; පිරුවති, හදුරත්.

213 සිරි මත් සොඳුරු විමෙර තැන තැන ලකු ළු
ඉඳ සිත් ලෙසට පෙරකිවියර සිරිරුකු ළු
දනගත් සඳලකර වියරණ වියත් මු ළු
පව සත් සකු මගද එළු දෙමළ කිව් න ළු

213 සිරිමත්, ශ්‍රීමත්වූ; සොඳුරු, මනොඥවූ; ලකුළු වි මෙහෙර, අලඞ්කෘතවූ විහාරයෙහි; තැනතැන, තන් තන්හි; සිත්ලෙසට, සිත්වූපරිද්දෙන්; ඉඳ, හිඳගෙණ; පෙරකිවියර, පූර්‍වකවීශ්වරයන්ගේ; සිරිරුකුළු, ස්වභාව (ප්‍රත්‍යක්ෂ) කොට; සඳලකර, ඡන්දස්අලංකාරහා, වියර ණ, ව්‍යාකරණද; දනගත්, අවබොධකලාවූ; වියත්මුළු, විද්වත් සමූහයා; සකු, සංස්කෘතද; මගද, මාගධද; එළු, ශෛංහලිද; දෙමළ, ද්‍රවිඩද (යනමෙතෙක්ශාස්ත්‍රයන් ස ම්බන්ධවූ); කිව්නළු, කාව්‍යනාට්‍ය (රස) යන්; පවසත්, කියත්.

214 පෙර නොප නුදුටු නොඇසූ මෙබඳු සිරි ස ර
නෙත සිත සතුටුකර දක පවර විවෙහෙ ර
පුදයට පිවිටු දන කොළුගල නැවතිම ර
වැඳ ඉවු මිතුරනොද වැද මුනි මැඳුරු තු ර

214 නොප, යුෂ්මත්නුවිසින්; පෙර, (මින්) පූර්‍වයෙහි; නුදුටු, දර්‍ශනයනොකළාවූද; නොඇසූ, ශ්‍රවණයනොකළාවූද; මෙබඳුසිරිසර, උක්තප්‍රකාරශ්‍රීසාරයන්; පවරවි වෙහෙර, ප්‍රවරවූ විහාරයෙහි; දක, දර්‍ශනයකොට; නෙත, නෙත්‍රද; සිත, චිත්තයද; සතුටුකර, සන්තුෂ්ට

කොට; පුදයටපිවිටූ, පූජාපිණිස පැමිනියාවූ; දන, ජනයන්ගේ; කොළහළ, (බුඩපූජා) කොලාහලයන්; නැවතිවර, නැවතිකල්හි; ඉවුම්තුර, ඉසවම්ත්‍රය; නොද, නෝද; මුනිමැදුරැතුර, සර්වඥමන්දිරාභ්‍යන්තරයට; වැද, පැමිණ; වැඳ, වැඳලා.

215 ලක රදඉසුරු ලද-දදි කැලණිතිස් මහරද
සව රද වරද තනුලෙස නොදැන පිරිසි දේ
නිවරද වරද හිමිඳුට වරද කළ ස දේ
කිරියෙන් සුරන් සිත්-සිඳුඑතවෙරළ මැඩගෙණ
නිසා මෙලකාසෙත ඊමමුහුදු පැහැ මැ වූ
ඊසාපිළිමරුව දැක සක්දෙවිඳු මැ වූ
රුඳුව සෙනගගෙණ ආ වසවතු යුද ට
මු ඳුව බිණූ තෙපලින් ජයගෙණ ලොව ට
බු දුව නොයෙක් සෙත්කළ අපමුනිසඳු ට
ව ඳුව අදර බැතිපෙම් සිත් දියුණු කො ට

215 ලකරදඉසුරුලද, ලඞ්කාරාජ්‍යශ්‍රීලාභීවූ; දද, භූශබවූ; කැලණිතිස්මහරද, කැලණිතිස්සමහාරාජයාවිසින්; වරද, ප්‍රභූරාජයා සම්බන්ධවූ; සවරද, සාවද්‍යත්වය; තනුලෙසේ, තන්වූපරිද්දෙන්; පිරිසිදේනොදැන, පරිච්ඡේදනොකොටනොදැන; නිවරදව, නිරවද්‍යවූ; රදහිමිඳුට, රජස්වාමීන්ද්‍රයන්ට; වරදකළසදේ, වධකළකල්හි; සුරන්, දෙවතාවන්ගේ; සිත්, චිත්තයය; කිරියෙන්, කලකිරුනෙන්; වෙරළමැඩගෙණ, වේලාන්තයමඩිමින්; සිඳු, සාගරය; එත, ගලන්ම-මෙලකාසෙතනිසා, මේලඞ්කාශාන්තියපිණිස; සක්දෙවිඳු, ශක්‍රදෙවෙන්ද්‍රයාවිසින්; මැවූ, මාපනංකරණලද; ඊමමුහුදුපැහැමැවූ, ඊසාගරප්‍රභාමයවූ; ඊසාපිළිමරුව, එනම් ප්‍රතිමාරූපය; දැක, දැකලා-රුඳුව, රෞද්‍රවූ; සෙනගගෙණ, (මාර) සෙනාකැටිව; සුදට, යුඬපිණිස; ආ, ආවාවූ; වසවතු, වසවර්තියා; මුඳුවබිණූ, මාඳුකොටදෙසූ; තෙපලින්, වාක්‍යයෙන්ම; ජයගෙණ, ජයග්‍රහණයකොට; බුදුව, බුඞ්ඞත්වයටපැමින; ලොවට, ලොකයට; නොයෙක්සෙත්කළ, නානාශාන්ති

කළාවූ; අපමුනිසඳුව, අපගේ මුනිශ්‍රෙෂ්ඨයාව නොහොත් සර්‍වඥපිළිරුවට; අදරබැතිපෙම්සිත්, ආදරභක්තිප්‍රේමචිත්තය, පියුණුකොට, පිගුණකොට; වඳුව, නමස්කාරයකර.

216 ම හ ත සසරසයුරෙනි කුමුවුව සර ණ
ඇ න ත සත නිවන්පුර ගෙණයනසිති නා
ස ත ත සොඳුරු බුදුකුරුගුණදම් පුර ණ
දි ය ත පසිඳු නතිඳුන් දැක හොස් සොබ නා

216 මහත, විශාලවූ; සසරසයුරෙහි, සංසාරසාගරයෙහි; කුමුවුව, නිමගනව: සරණ, හැසිරෙනනාවූ; අනත සත, අප්‍රමාණසත්වයන්; නිවන්පුර, නිර්‍වාණපුරයට; ගෙණයනසිතින, රැගෙණයනවෙනනාවෙත්යුක්තව; සොඳුරු, මනොඥවූ; බුදුකුරුගුණදම්, බුඩාඞ්කුරගුණධර්‍මයන්; සතත, නිරන්තරයෙන්; පුරණ, පූරණයකරන්නාවූ; දියතපසිඳු, ජගත්හි ප්‍රසිඩවූ; සොබන, සොභනවූ; නතිඳුන්, නාථදෙවියන්; හොස්දැක, හොසින් දැකලා.

217 ප ව ර රුසිරු මහසැසිසමග බෝතු රු
නො හැර නැමද බැතිපෙම්සිතිනි පිවිතු රු
වෙ හෙ ර පුද පසහතුරුරැව් නොදෙනතු රු
මි තු ර හොාසින් වැද සැදි පහතුර සොඳු රු

217 පවර, ප්‍රවරවූ; රුසිරුමහසැසියමග, රුචිරවූමහාචෛත්‍යයත්හා; බෝතුරු, බොධිද්‍රුමද; නොහැර, අත්නොහැරම; පිවිතුරු, පවිත්‍රවූ; බැතිපෙම්සිතිනි, භක්තිප්‍රෙමචිත්තයෙන්යුක්තව; නැමද, වැඳ; වෙහෙර, විහාරයෙහි; පුද, පූජාපිණිස; පසහතුරුරැව්, පඤ්චාංගිකතූර්‍ය්‍යනාදය; නොදෙනතුරු, නොපවත්වනඅතර; මිතුර, මිත්‍රය; සොඳුරු, සුන්දරව; සැදි, හෙබියාවූ; පහතුර, (විජයබාහු) ප්‍රාසාදාභ්‍යන්තරයට; වැද, පැමින.

218 ක ද මු රු පහන් කුල-දලනිඳු ලකළ මුදලිඳු
පි වි තු රු උතුරුමුලමහතෙරිඳුව සොඳු රු
මු නු බු රු මහරුගුණසරු පිළිවෙත් ගැඹු රු
කිව් කැ ල මුදුන්මල්-කළ තම්තෙපුල් හැමකල

ම න ර ම් මුනිසඳුන් වැඩපිණිස නිකාස ලු
පැර කු ම් රජු විසින් සුතපෙමිනි ඇතිසා ළු
සි රි බ ර මෙසිරිලකහන පැලඳි පිරිසි ඳු
පු ව ත ර මහවෙහෙර වැසි තෙරගන සිනි ඳු
ම න හ ර රුවන්වැලමැද බඳ මිණක්බ ඳු
න ම ක ර පවර විජයබපිරිවන්තෙරි ඳු

218 පහන්, ප්‍රසන්නවූ; කඳුවුරුකුල, සකන්ධාවාරකුලනැමති; දලනිඳු, සාගරයෙහි; ලකළ, අලඞ්කෘතවූ; මුදලිඳු, මෙරගිරබඳුවූ; පිවිතුරු, (සීලාදිගුණයෙන්)පවිත්‍රවූ; සොඳුරු, සෞන්‍දර්‍ය්‍යවූ; උතුරුමුලමහතෙරිඳුට, උත්තරමූලමහාස්ථවිරයානන්ට; මුනුබුරු, මුනුපුරුවූ; මහරුගුණසරු, මහාහිගුණයෙන්සාරවූ; ගැඹුරු, ගම්භීරවූ; පිළිවෙත්, ප්‍රතිපත්තිඇති—තමතෙපුල්, ස්වකීය වාක්‍යයන්; හැමකල, සියලුදවස්හි; කිවිකැල, ව්‍යක්තයන්ගේ; මුදුන්මල්කල, මකුටමාලාකළාවූ-මනරම්, මනොඥවූ; මුනිසඳුන්වැඩපිණිස, බුද්ධශාසනාභිවෘද්ධියසඳහා; නිකාසල, නිශ්චලවූ; පැරකුම්රජුවිසින්, පරාක්‍රමබාහුනරෙන්ද්‍රයා විසින්; සුතපෙමිනි, පුත්‍රප්‍රෙමයෙන්; ඇතිසල, වැඩූ-සිරිබර, ශ්‍රීභාරවූ; මෙසිරිලකහන, මේ ශ්‍රීලඞ්කාභනාවිසින්; පැලඳි, පළඳනාලද; පිරිසිඳු, පවිත්‍රවූ; පුවතර, විශාලවූ; මහවෙහෙර වැසි, මහාවිහාරවාසිවූ; තෙරගන, ස්ථවිරසමූහනැමති; සිනිඳු, සනිග්ධවූ; මනහර, මනොඥවූ; රුවන්වැලමැද, රත්නමාලාමධ්‍යයෙහි; බඳ, බඳනාලද; මිණක්බඳු, මාණික්‍යයක්බඳුවූ; පවර, ප්‍රවරවූ; විජයබපිරිවන්තෙරිඳු, විජයබාහු (පරිවෙණාධිපති) ස්ථවිරෙන්ද්‍රයා; නමකර, නමස්කාරකර.

තවද දශවිධ ප්‍රඥාපාරමිත ප්‍රසන්නතර ත්‍රිපිටකවාගීශ්වර ශ්‍රීසඞ්ඝබොධි විජයබාහු පරිවෙණාධිපති ස්ථවිරෙන්ද්‍රයාගේ ඉම්ද ඒක්වණ්ණ නානාෂණ්ණයෙක–එද තාකාණ්ණර ඝායණකර.

යළිත් දස වැදෑරුම්වූ ප්‍රඥාපාරමිත ප්‍රසන්නතර ත්‍රිපිටකවාගීශ්වරවූ විජයබාහු පරිවෙණාධිපති ස්ථවිරයානන්වහන්සේගේ මෙත් එක්වණ්ණ නානාපයෙක්වේ—ඒදනාකණ්ණ රසායණකරව.

219 ගැ ඹු ර කිදම්පෙළ කිරිසයුර ඇම්වි ව
සොඳුරැ නුවන මෙරපහරින් සකොබ කො ට
මි යු රු පද අරුත් අම ගෙණ දෙන ලොව ට
කා වු රු සදිසිවෙද මෙකලට එයතිඳු ව

219 ගැඹුරු, ගම්භීරවූ; අබ්දම්පෙළ, අබ්ධිපාලිනැමති; කිරිසයුර, ක්ෂීරාර්ණවය; ඇම්විට, කිරනතරයෙන්; සොඳුර, සුන්දරවූ; නුවනමෙරපහරින්, ඤාණ නැමති මෙරැප්‍රහාරයෙන්; සකොබකොට, සංක්ෂොභකොට; මියුරු, මධුරවූ; පදඅරුත්අම, පදාර්ථ නැමති අමෘතය; ගෙණ, රැගෙණ; ලොවට, ලෝකයාට; දෙන, ප්‍රදානංකරන්නාවූ; එයතිඳුට, ඒයතීන්ද්‍රයාට; මෙකලට, මෙකල්හි; කවුරු, කිනම්කෙනෙක්; සදිසිවෙද, සදෘශවේද.

220 වි හි ගුම් නොයෙක්දිමු සකිලිවුනිම් පිනි ට
දෙනතුම් සගපවග පලසිරි මුළුලොව ට
න ර ද ම් සැරි සුතුරුදම් තුඟු සුරතුර ට
ම න ර ම් ඔහු නුවන දෙරණම විසපිළි ට

220 සකිලිවු, මළවත්වූ; නොයෙක්දිමු, ඥානාදීන්නැමති; ගිම්, ග්‍රීෂ්මයට නොහොත් ග්‍රීෂ්මයෙන්පීඩිතවූ; පිනිට, ප්‍රතිභාවූ; විහිගුම්, විසතිශාඛාඇති; උතුම්, උත්තමවූ; සගපවග පලසිරි, ස්වර්ගාපවර්ගඵලශ්‍රීය; මුළුලොවට, සමස්තලෝකයට; දෙන, ප්‍රදානංකරන්නාවූ; නරදම්සැරි, නරධම්මසාරථීනුගේ; සුතුරුදම්, සූත්‍රධර්ම නොහොත් සූත්‍රපිටකනැමති; තුඟු, උස්වූ; සුරතුරට, කල්පවෘක්ෂයට; ඔහු, ඒ යතීන්ද්‍රයාගේ; මනරම්, මනොඥවූ; නුවනාදරණම, ඥාණනැමති ධරණීයම; පිළිවිස, ප්‍රතිබිම්බවී.

221 මු නි ර දසසුන් මිහිමඬලෙහි කළ නද නා
ම න හ ර විනය පදරුත් මහ මිණි නද නා
පෙරළුරු උවදෙසින් ලැබ නැණ පතළව නා
ගෙණහැර දෙමින් යතිගන කරවයි නද නා

221 මුනිරද, සර්වඥරාජයාගේ; සසුන්මිහිමඩලෙසි, ශාසනනැමතිමහීමණ්ඩලයෙහි; නදනකළ, නිධාන්කළාවූ; මනහර, මනොහරවූ; විනසපදරුත්, විනයපදරත්නැමති; නදන, නන්දනීයවූ; මහමිණි, මහාමාණික්‍යයන්; පෙරඳුරුළුවදෙසින්, පූර්වාචාර්‍ය්‍යොපදෙශයෙන්; පතළනැණ, මහත්වූඥානය; ලැබ, ලබාව; ගෙණහැරදෙමින්, (ඒ මහා මාණික්‍යයන්) හැරගෙණදෙමින්; සතිගන, ශිෂ්‍යසමූහයා; නදනකරවයි, සතුටුකරවයි.

222 ස ත ර පහළකළ ඇඳුරන්සෙපො ර ණ ය
නොහැර සිතසෙ දැනගෙණ සසවිය ර ණ ය
ප ව ර පබඳ බැඳ සඳ සතොසක ර ණ ය
නි ත ර පසිඳුකරවිය සියලුදෙ ර ණ ය

222 සතරපහළකළ, ශාස්ත්‍රප්‍රකාශකළාවූ; පොරණය ඇඳුරන්සෙ, පූරාණාචාරීන්සෙයින්; නොහැර, අත්නොහැර; සිතසෙ, සිත්වූපරිද්දෙන්; සසවියරණය, ශබ්දව්‍යාකරණයන්; දැනගෙණ, පරිඥානයකොටගෙණ; සඳසතොසකරණය, මනස්සන්තුෂ්ටකරණාවූ; පවර, ප්‍රවරවූ; පබද, ප්‍රබන්ධයන්; බැඳ, බන්ධනයකොට; නිතර, නිරන්තරයෙන්; සියලුදෙරණය, සකලධරණියෙහි; පසිඳුකරවිය, ප්‍රසිද්ධකරවිය.

223 ස ස ම ය සතරසිඳු අගතිසි කරත ල ය
අ ස ම ය සපිරි පිරිසුදු ගුණ ඇමක ල ය
මෙසමය පසිඳු දියතෙහි එනිමි තෙප ල ය
ස ස ම ය ඇඳුරු තුරු උදුරණ සැඩ න ල ය

223 සසමය, ෂඩ්විධසමයනැමති; සතරසිඳු, චතුස්සාගරයාව; අගතිසි, වාල්මීකයාගේ; කරතලය, හස්තතලසබඳුවූ; ඇමකලය, සැමකල්හි; අසමය, අසමානවූ; සපිරි, සම්පූර්ණවූ; පිරිසුදුගුණ, පරිශුද්ධගුණාඪ්‍යයෙන්යුක්තාවූ; මෙසමය, මෙකල්හි; දියතෙහි, ජගත්හි; පසිඳු, ප්‍රසිද්ධවූ; එනිමි, ඒස්වාමීනුයේ; තෙපලය, වාක්‍යයනමේ; සසමයඇඳුරු, ස්වසමයාචාර්‍ය්‍යනැමති; තුරු, වෘක්ෂයන්;

උද්ධරණ, උත්පාටනය කරන්නාවූ; සැඩනලය, චණ්ඩානිලයෙකි.

224 සේ පිරි යස් මහකවි දැනගෙණ පෙහෙ නා
සේ සිරි පත් කොඳසඳ යස රැසසොබ නා
පැදිසකොත් බඳවා දියතෙනි නිති නා
ඒ සිරිමත් නිමිසඳු වැජඹෙයි නඳ නා

224 සේ, ජේකායන්ගේ; මහකව්, මහාකාව්‍යයන්; පෙහෙන, මනාව; දැනගෙණ, පරිඥානයකොටගෙණ; පිරියත්, පසිඹපතාව; සේ, ශුභ්‍රවූ; සොබන, සොභනවූ; යස රැස, කීර්ති රාශීන්; කොඳ, කුන්දද; සඳ, චන්ද්‍රද (යනමොවුන්ගේ); සිරිපත්, ශ්‍රීයටපැමිනා; දියතෙනි, ජගත්හි; නිතින, නිරන්තරයෙන්; දියකොත්, ජයකෙතුන්; බඳවා, බන්ධනයකරවා; පැ, දක්වා; නඳන, නන්දනීයවූ; ඒසිරිමත්නිමිසඳු, ඒශ්‍රීමත්වූස්වාමිචන්ද්‍රයා; වැජඹෙයි, විජෘම්භමානවේ.

225 පසිඳු රුසිරු සරසවිළිය රැඳිනිත ර
කිවිඳු සවන් බිඟුවැල තුටුකළ නොහැ ර
පුබුදු සොඳුරු ඔහු මුවනඹරට පව ර
සිනිඳු සුවඳ මුවරඳ විය සඳලක ර

225 පසිඳු, ප්‍රසිද්ධවූ; රුසිරු, රුචිරවූ; සරසවිළිය, සරස්වතී කාන්තාතොමෝ; නිතර, නිරන්තරයෙන්, රැඳි; රඳනාලද; කිවිඳු, කවීන්ද්‍රයන්සම්බන්ධිවූ; සවන්බිඟුවැල, කර්ණනැමති භෘඞ්ගශ්‍රේණීන්; නොහැර, අත්නොහැරම; තුටුකළ, සතුටුකළාවූ; සොඳුරු, සුන්දරවූ; ඔහු, ඒස්වාමිහුගේ; පුබුදු, ප්‍රබුද්ධවූ; පවර, ප්‍රවරවූ; මුවනඹරට, මුඛතාමරසයට; සඳලකර, ඡන්දස්හා අලඞ්කාරයනමෙතොක්දෑ; සිනිඳු, ස්නිග්ධවූ; සුවඳමුවරඳවිය, සුගන්ධමකරන්දවී.

226 නිවට කුසුම්ඉසි සුරගුරුවන් සුබ ද
ලොවට කළණ ඒයතිසඳුගේ නොමි ද
සුමට වදන් දුල විසිතුරු මිහමුනු ද
දසට පොරණ රළුපතරින් පිරි නිබ ද

226 තිවරි, මහාබ්‍රහ්මයාද; කසුඹුරුසි, කාශ්‍යපර්ෂියාද; සුරගුරුවන, බෘහස්පති (ද යන මොවුන්) සේ; සුබද, ඉන්ද්‍රවබන්ධනයෙන් යුක්තවූ; ලොවට, ලොකයට; කළණ, යහපත්වූ; ඒ යතිසඳුගේ, ඒ යතිශ්‍රේෂ්ඨයාගේ; නොමඳ, අමන්දවූ; සුමට, ඉතා මටාමිවූ; වදන්, වචනනැමැති; දිදු, ජ්වලිතවූ; විසිතුරුමහමුනුද, විචිත්‍රමහාසාගරය; දසටපොරණ, අෂ්ටාදශ පොරාණනැමැති; රළපතරින්, ඌර්මිසමූහයෙන්; නිබද, නිතොරද; පිරි, පූර්ණවී.

227 නොසි කරණ මිසදිටුවන් බස් අබ ද
නි සි නැනැති සිරිපැරකුම්රජුට සො ද
ර සි ගැඹුරුතෙපලෙන් සැකහැර පසි ද
දෙ සි සුවාසූදහසක්දහම්කඳ ද

227 මිසදිටුවන්, මිථ්‍යාදෘෂ්ටිකයන්ගේ; අබඳ, අබද්ධවූ හෙවත් පරස්පරවිරුද්ධවූ; බස්, වචනයන්; නොසිකරණ, අසිද්ධකරනාවූ; නිසිනැනැති, මනාවූ ඥානයෙන්යුක්තවූ; සොඳ, සුන්දරවූ; සිරිපැරකුම්රජුට, ශ්‍රීපරාක්‍රම (බාහු) රජහට; (එනිම්ඃනුවාකාරශෙෂයි) සැකහැර, සන්දෙහකොට; රසි, රසවත්වූ; ගැඹුරුතෙපලෙන්, ගම්භීරවචනයෙන්; පසිද, ප්‍රචඡනාකොට හෝ පරිචෙඡදකොට; සුවාසූදහසක් දහම්කඳ, සුවාසූදහසක් ධර්මස්කන්ධය; දෙසි, දෙශනාකෙළේය.

228 ඒ හි මි කෙලෙස්තිරිමුදුනෙන් වැහෙන සො ද
ද හ මි අහස්ගන දිලි දියදහර වැ ද
නොමඳ සතොස්අඹිදසින් පිරි නිබ ද
බැ බ ලී වෙසෙස් නරනිඳුසඳු කිරිඹුනු ද

228 එහිමි, ඒ ස්වාමීනැමැති; කෙලෙස්තිරිමුදුනෙන්, කෛලාසපර්වතමස්තකයෙන්; වැහෙන, වහනයවන්නාවූ; සොඳ, සුන්දරවූ; දහම්, ධර්මනැමැති; අහස්ගඟ, ආකාශගඞ්ගාවෙනි; දිලි, දීප්තවූ; දියදහර, ජලධාරාව; වැටී, පතිතව; නොමඳ, අමන්දවූ; සතොස්අඹදසින්, සන්තො

ෂනැමති ශුම්භනාභියෙන්; නිබඳ, නිතොර; පිරි, පූර්ණවූ; නරනිඳුසඳ, නරෙන්ද්‍රචන්ද්‍ර නැමති; කිරිමුහුද, ක්ෂීරාර්ණවය; වෙසෙස්, විශේෂයෙන්; බැබලි, භ්‍රාජනවී.

229 දෙ ස න දහම් දනමන සරව්සා ස ය
සො බ න එ තිසඳුගේ ගු ණ නිවා ස ය
න ද න වදන් නළඟන පැවිසේ ස ය
ර ඟ න පවර රඟබිම්විය සබා ස ය

229 සබාසය, (ඔහුවිසින් අධිපතිවූ) සබ්භාෂාව (හෙ සේද); දනමන, ජනයාගේසිත්; විකාසයකර, සතුටු කොට; දහම්දෙසන, ධර්මදේශනාකරනනාවූ; සොබන, සොභනවූ; ගුණනිවාසය, ගුණයට නිවාසස්ථානවූ; එය තිසඳුගේ, ඒ යතිළනුමාගේ; පැවිසේසය, වෙසෙසින් පැහැපත්වූ; නදන, නන්දනයවූ; වදන්නළඟන, වචන නැමති නාටිකාංගනාමෝ; රඟන, නෘත්‍යකරනනාවූ; රඟබිම්විය, නෘත්‍යභූමිවිය.

230 ප සැ ස් පසැස්කර වදහළලෙසම සො ඳ
නි දෙ ස් වෙසෙස් පිළිවෙත්සිරිත නොවිනි ඳ
ස දෙ ස් කෙලෙස් සතුරන් ඔද මැඩ පසි ඳ
වෙසෙ ස් සතොස් ගුණයෙන් වැජඹෙයි නිබ ඳ

230 සොඳ, සුන්දරවූ; පසැස්, පඤ්චවර්ගයා; පසැස්කර, ප්‍රත්‍යක්ෂකොට; වදහළලෙසම, වදාළපරිද්දෙන්ම; වෙසෙස්, විශේෂයෙන්; නිදෙස්, නිර්දෝෂවූ; පිළිවෙත්සිරිත, ප්‍රතිපත්තිචරිතය; නොවිනිඳ, නොහැර; (එනම්යනු වාක්‍යශේෂයි) සදෙස්, දෝෂසහිතවූ; කෙලෙස්සතුරන්, ක්ලේශනැමති සතුරන්ගේ; ඔද, ඕජසහෝ තේජස; මැඩ, මර්දනයකොට; පසිඳ, ප්‍රසිද්ධයකොට; වෙසෙස්, විශිෂ්ඨවූ; සතොස්ගුණයෙන්, සන්තෝෂගුණයෙන්; නිබඳ, නිතොර; වැජඹෙයි, විජෘම්භමානවේ.

231 සි ල් සෙ න ග හු යසසෙමෙරගු මෙත්සන හු
ගු ණ බර ණ හු දම්කිරැළහු නැත සග හු
බු ත් අ ර ග හු නදතෙද ණහු සිරිපුර හු
සූ ර ඇ දු ර හු හැරකවරු වණනිඹ හු

231 සිල්සෙනගනු, ශීලනැමතිසේනාවඇත්තාවූ; යසසෙමෙරනු, කීර්තිනැමති චාමරඇත්තාවූ; මෙත්සතනු, මෛත්‍රීනැමති ඡත්‍රඇත්තාවූ; ගුණබරණනු, ගුණනාමති ආභරණඇත්තාවූ; දම්කිරුළනු, ධර්මනැමති ඔටුනුඇත්තාවූ; නැණකගනු, ඥානනැමති ඛඩ්ගවත්වූ; මුන්අරගනු, හගනකාරණලද පාපනැමති සතුරන්ඇත්තාවූ; තදතෙදඅණනු, සනබබතෙජෝගුණනැමති ආඥාඇත්තාවූ; සිරිපුරනු, සොභා හෝ ඓශ්වර්‍ය්‍යනැමති නගරවත්වූ; ඔනු, ඒ උත්තමයා; (මෙයින්රාජවිලාසයදක්වති) සුරඇදුරනුහැර, දෙවමන්ත්‍රීයාහැර; කවරනු, කිනම්කෙනෙක්; වණනී, වර්ණනාකෙරෙද්ද? නොකෙරෙත් මැයිසේසි.

232 සහ සැස්හුරු සොඳුරු පැරකුම්නිරිඳුගෙ න
මහ වෙල් ගොඩපිටියඇතුළුව නොයෙකතැ න
මහ ගම්බිම් පටුනුකොට අමුතුලැබගෙ ණ
බහ දුරුසිරින් ඒහිමි වැජඹෙයිනිති න

232 සහසැස්හුරු, සහශ්‍රාක්ෂිනුබඳුවූ; සොඳුරු, සුන්දරවූ; පැරකුම්නිරිඳුගෙන, පරාක්‍රම (බාහු) නරේන්ද්‍රයාගෙන්; මහවෙල්, එනම්කෙතනා; ගොඩපිටියඇතුළුව, ගොඩපිටියනම්ගමඇතුළුවූ; නොයෙකතැන, අනේක ස්ථානයන්හි; මහගම්බිම්, මහාග්‍රාමභූමීන්; අමුතුපටුනු කොට, අමුතුපටුනුවශයෙන්; ලැබගෙණ, ලබාගෙණ; බහදුරුසිරින්, භද්‍රශ්‍රීයෙන්; ඒහිමි, ඒස්වාමිතෙමේ; නිතින, නිරන්තරයෙන්, වැජඹෙයි, විජෘම්භමානවේ.

මිතුර ඒයතින්ද්‍රයාහට විඥාපනයකරණු සඳහා ප්‍රථමෝද්දිෂ්ටසන්දේශයද ප්‍රකාශාවසර කල්ඇත්තේය-ඊද තාකාණ්ඩාවතංශකර.

යහළුව ඒ යතිතුමාට දන්වනපිණිස පළමුකී සන්දේශයද කියයුතු කල්ඇත්තේය-එයද තොප කාණ කුණ්ඩලාහරණකර.

233 මුළුලොවට වැඩවන—නෙපලෙකමෙමාපවසන
සහග පවග සැප සැබවින් සිදුකර ණ
සමග මහඟු මහසනගන මෙහෙවරි ග
පවර මුනි වදහළ—පිළිවෙත් නොහැර දැනගෙ ණ
නිතර සතන් වෙත සලසා මෙත් කුළු ණු
පතර මෙසිරිලක්දිව රකුමේ දපු ණු
පැලදි මුනිඳු සිරිපදකමල උතුම ග
වැලදි සපිරි සරු මනුනීති කොමල ග
පැහැදි ගැමුනු නරනිඳුසේ දහම් ම ග
සුසැදි මෙසිරි පැරකුම් නරනිඳු සම ග

233 මෙමා, මේ මාවිසින්; පවසන, ප්‍රකාශකරණලදද්; මුළුලොවට, සකලලොකයට; වැඩවන, අභිවෘඩිවනානාවූ; නෙපලෙක, වචනයෙක්වේ-සහග, අගසසනිතවූ; අපවගසැප, නිර්‍වාණ සම්පත්තිය; සැබවින්, ස්වභාවයෙන්ම; සිදුකරණ, සිඩකරනානාවූ; මහඟු, මහාර්ඝවූ; මහසනගන, මහාසඞ්ඝසමූහයාට; මෙහෙවරින, උපස්ථානකිරීමෙන්-පවර, ප්‍රවරවූ; මුනි, මුනීන්‍ද්‍රයා විසින්; වදහළ, වදාළාවූ; පිළිවෙත්, ප්‍රතිපත්තීන්; නොහැර, අත්නොහැරම; දැනගෙණ, විජානනයකොට-සතන්වෙත, සත්ත්‍වයන්වෙත; නිතර, අනවරතයෙන්; මෙත්කුළුණු, මෛත්‍රීකරුණාව; සලසා; යොදා; පතර, මහත්වූ; මෙසිරිලක්දිව, මේශ්‍රීලඞ්කාවීපය; රකුමේ, රක්ෂාකිරීමෙහි; දපුණු, දීප්තවූ-උතුමන, උත්තමාභයෙහි; පැලදි, පලඳනාලද; මුනිඳු, මුනීන්‍ද්‍රයාගේ; සිරිපදකමල, ශ්‍රීපාද පද්මඇති; සපිරි, සම්පූර්ණවූ; සරු, සාරවූ; මනුනීතිකොමලග, මනුනීතිනැමති කොමලාඞ්ගනාවිසින්; වැලඳි, වැලඳීයාවූ; දහම්මග, ධර්ම්මාර්ගයෙහි; ගැමුනු නරනිඳුසේ, (අභය) ගාමිණී නරෙන්ද්‍රයාසෙයින්; පැහැදි, ප්‍රසන්නවූ; සුසැදි, සුසජ්ජිතවූ; මෙසිරිපැරකුම් නරනිඳු සමග, මේශ්‍රීපරාක්‍රම (බාහු) නරෙන්ද්‍රයානන් ඇතුළුව. (මත්තසමකබන්ධ)

234 සමුදුරනිම් අවට-සව් සිරි සපිරි සිරිලක
අමාකර කිරණසේ පිළිසඳු දිවැ ස
සොමි කුළුණු ගුණයෙන් දැක ඇම දව ස
අමිතුරු මිස අසත්-වෙසෙසින් අතුරුදන් කර
පත්වා රෝගබිය බිඳ උවදුරු දුර ට
පෙන්වා තමා බෝසත්බව මුළුලොව ට
නොහැර විජයසුබ සිරිසැප දියුණු කො ට
නි ත ර රකින ලෙස සහපිරිවරින් සි ට
අ ද ර සිතින් අයදින ලෙස නතිඳුහ ට
මි තු ර තොසින් සැලකර ඒසඟිසඳු ට

234 අවට, හාත්පසින්; සමුදුරනිම්, සාගරය සීමාකොට ඇති; සව්සිරිසපිරි, සකලශ්‍රීන්සම්පූර්ණවූ; සිරිලක, ශ්‍රීලංකාව-අමාකරකිරණසේ, චන්ද්‍රමරීචිබඳවූ; දිවැස, දිව්‍යචක්ෂුසය; සොමි, සෞම්‍යකොට; කුළුණුගුණයෙන්, කාරුණ්‍යගුණාධිකයෙන්; ඇමදවස, සියලුදවස්හි; දැක, දර්ශනයකොට-අසත්, අයහපත්වූ; අමිතුරු, සතුරන්ගේ; මිස, මිථ්‍යාදෘෂ්ටීන්ද; වෙසෙසින්, විශේෂයෙන්; අතුරුදන්කර, අන්තර්ධානකොට-බිය, භයානකවූ; රෝග, රෝගයන්; බිඳ, භග්නකොට; පත්වා, බැහැරලා; තමා, තමන්; බෝසත්බව, බොධිසත්වබැව්; මුළුලොවට, සමස්තලෝකයට; පෙන්වා, ප්‍රත්‍යක්ෂකොට-විජයසුබසිරිසැප, ජයශුභඓශ්වර්‍ය්‍යසම්පත්ති; දියුණුකොට, විවර්ධනකොට; නොහැර, තොරනොවී: සිට, ස්ථිතව; නිතර, නිරන්තරයෙන්; සහපිරිවරින්, පරිවාර (ජනයා) සමග; රකිනලෙස, රක්ෂාකරණමෙන්; අදරසිතින්, ආදරචිත්තයෙන්; නතිඳුහට, නාථදෙවේන්ද්‍රයාට; අයදිනලෙස, යාචනාකරණු පිණිස; මිතුර, මිත්‍රය; තොසින්, සන්තොෂයෙන්; ඒසඟිළඳුට, ඒයගිඋතුමාට; සැලකර, දන්වව.

235 පමණින් දසදහස්-යොදුනැති දඹදිව් තලෙ
මුනිඳුන් නරගමනක් වැඩ ලක්දිව ට
මතු අන් නරහැර යක්සෙනග දුරුකො ට
පිහිටන ලෙස සසුන්-සැලසූ බලා දිවැසින

නොස්වා සුර අසුරලොව එක ලෙස දිස් — නා
පස් වා දහස් පවතින ලෙස බුදුසස් — නා
සිනසනොසේ රකිනුව ඇමවර නොහැ — ර
හිම කරයේ ලොවදක්වා යසවිසි — ර
දිලිවෙසෙසේ එමනනිඳුව යහිමිතු — ර
යදින ලෙයේ සැලකර එනිමිට පව — ර

235 යොදුන්පමණින්, යොජනසඛ්‍යාතවන්; දසදහස්දැති, ශතසහස්‍රවත්වූ; දඹදිව්තලෙ, ජම්බුද්වීපතලයෙහි වූ; ලක්දිවට, ලඞ්කාද්වීපයට; මුනි, සර්වඥයා; තුන්තරු ගමනක්වැඩ, තුන්තරාගමනක්වැඩලා; යක්සෙනන යක්ෂසෙනාව; දුරුකොට, බැහැරකොට; මතු, මත්තෙහි; අන්තරාහැර, අනතුරුහැරලා; දිවැසින්බලා දිව්‍යචක්ෂුවෙන්බලා; සසුන්පිහිටනලෙස, ශාසනප්‍රතිෂ්ඨානමෙන්; සැලසූ, යෙදූ—සුරඅසුරලොව, දිව්‍යඅසුරලොකයා; තොස්වා, සතුටුකොට; එකලෙස, එකාකාරයෙන්; දිස්න, හොබනා; බුදුසස්න, සර්වඥශාසනය; පස්වාදහස්, පංචසහස්‍රවර්ෂයක්; පවතිනලෙස, පවත්නාමෙන්—හිමකරයේ, නිශාකරයාසෙයින්; විසිර, විහිදීගියාවූ; යස, කීර්තිය; ලොව, ලොකයෙහි; දක්වා පෙන්වා; සිනසනොසේ, විනාශනොවනාක්‍රමයෙන්; නොහැර, අත්නොහැරම; ඇමවර, සෑමකල්හි; රකිනුව, රක්ෂාකරණුපිණිස; වෙසෙසේදිලි, විශෙෂයෙන්ජ්වලිතවූ; එමනනිඳුව, එම්නාථදෙවියාට; යදිනලෙසේ, යාච්ඤාකරණපරිද්දෙන්; මිතුර, මිත්‍රය; යළි, ඉක්බිත්තෙන්; පවර, ප්‍රවරවූ, එනිමිට, ඒ ස්වාමිහට; සැලකර, මතක්කර.

236 නතු මෙමදන් දන්වා අප කී ලෙස — ට
කිතු ලියමල් ගන්වා දිගු බිත අව — ට
සිතු සතොසින් සකි වැඩ සිදුකළ ලොව — ට
මතු දෙලොවින් සුබසිරි සිදුවෙයි තොප — ට

236 අප, අස්මත්හුව්සින්; කිලෙසට, කඨිනශකළප රිදෙන්; මෙවදන්, මේවචනයන්සම්බන්ධවූ; තතු, තත්ත්වය; දන්වා, මතක්කොට; දිගුබිතඅවට, දිගාකිනිය සිසාරා; කිතුලිය, කීර්ත්තිලතාව; මල්ගන්වා, පුෂ්පයෙන් ගවසා; ලොවට, ලොකයට; සිතුසතොසින්, චිත්ත සන්තොෂයෙන්; වැඩසිදුකළ, අභිවෘද්ධිසිද්ධියකළාවූ; යහ, යහලුව; මතු, අනාගතයෙහි; තොපට, නුඹවත්හට; දෙලොවින්, උභයලොකයෙන්; සුබසිරිසිදුවෙයි, යහපත හා ඓශ්වය්‍ය්‍යසිද්ධිය වේ.

237 පිය වී පිය ගමන් නොහැරම ගොස් මය ග
ගිය කාරිය සැළකර සිදුකළ සිත හ
කිය වා දිය සියල් තොපයස රැස සහ ග
සිය නෑ සියව පවතුව සුමිතුරු සම ග

237 පියනමන්, ප්‍රියවූනමිනා; නොහැරම, අත්නොහැරම; ගොස්, ගමනයකොට; පියවී, ප්‍රියව; ගියකාරිය, ගතකාය්‍යය; සැලකර, මතක්කොට; සිතහ, සිත්වූපරිදෙන්; සිදුකළ, සිද්ධකළාවූ; මයග, මාගේ මිත්‍රය; තොප, නුඹවත්හුගේ; සහග, අගනසනිතවූ; යසරැස, කීර්ත්තිරශිය; සියල්දිය, සකලලොකයෙහි; කියවා, කථනයකරවා; සියනෑසියව, ස්වකීයබන්ධූන්කැටිව; සුමිතුරුසමග, ඉෂ්ටමිත්‍රයන්හා ඒක්ව; පවතුව, ජීවත්වෙව.

ගිරාසන්දෙශය නිමි.